# 5

# විදේශීය අංශයේ ප්‍රවණතා සහ ප්‍රතිපත්ති

## 5.1 සමස්ත නිරීක්ෂණ

දේශීය සහ විදේශීය සාධකවල බලපෑම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය, විශේෂයෙන්ම 2018 වසරේ දෙවන භාගය තුළදී දැඩි පීඩනයකට ලක් වුවද, ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් වසර අවසානය වන විට එහි කම්පනයන්ට මුහුණ දීමේ හැකියාව වර්ධනය විය. විදේශීය සාධක සැලකීමේදී, ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමත් සමග සමස්තයක් වශයෙන් එ.ජ. ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් ශ්‍රී ලංකාව ඇතුළු නැගී එන වෙළඳපොළ ආර්ථිකයන් වෙතින් සැලකිය යුතු ලෙස විදේශීය ආයෝජන ගෙවීම් වාර්තා විය. දේශීය සාධක සැලකීමේ දී, අපනයන ආදායම වැඩිවීමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් වසරේ පළමු කාර්තු තුන තුළදී වෙළඳ හිඟය අපේක්ෂිත මට්ටමට වඩා පුළුල් විය. පුළුල් වූ වෙළඳ හිඟය සහ දැඩි ගෝලීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් යටතේ ඉහළ ගිය ප්‍රාග්ධන ගෙවීම්වල බලපෑම පිළිබිඹු කරමින්, 2018 වසරේ දෙවන භාගයේදී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් දැඩිව පැවතුණි. ඒ අනුව, වසරේ මුල් කාලපරිච්ඡේදය තුළදී නිල සංචිතවල කැපී පෙනෙන වර්ධනයක් සිදු වුවද, ශ්‍රී ලංකා රුපියල වසර අවසානය වනවිට සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. මේ අතර, විදේශීය අංශය වෙත වූ පීඩනය තවදුරටත් වැඩි කරමින්, වසර අවසානය වන විට දේශපාලනික පරිසරය තුළ ඇති වූ අහිතකර ප්‍රවණතා ආයෝජකයන්ගේ විශ්වාසය අඩාල කිරීමට හේතු විය. මෙම ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුව හා රජය විසින් තීරු බදු ඉහළ දැමීම සහ ආන්තික තැන්පතු අවශ්‍යතා පැනවීම, වාහන ආනයනය සඳහා ණය පහසුකම් ලබාගැනීමේදී වටිනාකම මත ණය (LTV) අනුපාතික අඩු කිරීම සහ ආනයන බලපත්‍ර භාවිතයෙන් වාහන ආනයනය කිරීම අත්හිටුවීම යනාදිය තුළින් අත්‍යාවශ්‍ය නොවන ආනයන සීමා කිරීමට ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. කෙසේ නමුත්, ආනයන සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින් වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීම, 2018 වසර අවසානය වන විට ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීම, ඉන්ධන මිල පහළ යෑම සහ ගෝලීය වෙළඳ අර්බුදය යම් දුරකට සමනය වීම හමුවේ විදේශීය පරිසරයේ ඇති වූ වර්ධනයන් හේතුවෙන් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ යම් ලැබීම් සහ විදේශීය ආයෝජන ගෙවීම් මන්දගාමී වීම හේතුවෙන් මූල්‍ය ගිණුම ශක්තිමත්වීමත් සමග වසරේ අවසාන කාලය වන විට, විදේශීය අංශයේ අවදානම්වලට මුහුණ දීමට ඇති හැකියාවෙහි වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2018 වසරේදී ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය. සේවා වෙළඳාම් ගිණුමේ ශේෂයෙහි හිතකර වර්ධනය හමුවේ වුවද, වෙළඳ ගිණුමේ හිඟය පුළුල්වීම සහ ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂයෙහි මධ්‍යස්ථ වීම හේතුවෙන්, 2017 වසරේදී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 2.6 ක් ව පැවති ජංගම ගිණුමේ හිඟය 2018 වසරේදී සියයට 3.2 ක් දක්වා ඉහළ ගියේය. වෙළඳ ගිණුම සැලකීමේ දී, විශේෂයෙන්ම වාහන, ඉන්ධන සහ රත්‍රන් යනාදී කාණ්ඩ කිහිපයක ආනයන වියදම අපේක්ෂිත මට්ටමට වඩා වර්ධනය වෙමින් අපනයන ආදායමෙහි වර්ධනය අභිබවා යාමෙහි ප්‍රතිඵලයක් ලෙස 2018 වසරේ වෙළඳ හිඟය සැලකිය

යුතු ලෙස පුළුල් විය. යෝග්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම පිළිබිඹු කරමින්, 2018 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී වෙළඳ හිඟය සැලකිය යුතු ලෙස අඩු වීම හමුවේ විනිමය අනුපාතිකය මත සහ ගෙවුම් තුලනය මත වූ පීඩනය ලිහිල් විය. මේ අතර, රජය විසින් විදේශ ණය මත සිදුකළ පොලී ගෙවීම් සහ ඍජු ආයෝජන ව්‍යාපාරයන්හි ලාභාංශ ගෙවීම් ඉහළ ගියද, ඍජු ආයෝජන ව්‍යාපාරවල ප්‍රතිආයෝජිත ඉපැයීම් සැලකිය යුතු ලෙස අඩුවීම සමග ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් ඉහළ ගියේය. කෙසේ වුවත්, ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම් සහ ප්‍රවාහන හා පරිගණක සේවා උප අංශ වෙත වූ හිතකර මට්ටමේ ලැබීම් හේතුවෙන් වසර තුළදී සේවා ගිණුමේ අතිරික්තය වර්ධනය විය. මේ අතර, වසරේ පළමු මාස නවය පුරා වර්ධනයක් වාර්තා කළ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2018 වසරේ අවසන් කාර්තුව තුළදී අඩුවීම සමග ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය 2017 වසර හා සැසඳීමේදී සුළු වශයෙන් අඩු විය.

2018 වසරේදී ඉහළ මූල්‍ය ලැබීම් සමගින් මූල්‍ය ගිණුම ශක්තිමත් විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීම තුළින් වූ ලැබීම්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙහි ලැබීම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකමෙහි පස්වන වාරිකය ලැබීම සහ විදේශීය ඍජු ආයෝජන ලැබීම් වසර තුළදී මූල්‍ය ගිණුමට දායක විය. කෙසේ වුවද, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් වූ විදේශ ආයෝජන ගෙවීම් මූල්‍ය ගිණුම වෙත පීඩනයක් ඇති කළේය. මූල්‍ය ගිණුම වෙතින් වූ අනෙකුත් ප්‍රධාන ගෙවීම් වූයේ, බැංකු අංශය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කර කල් පිරීම් සඳහා වූ ගෙවීම්ය. මෙම ප්‍රවණතා හමුවේ, 2018 වසරේ අප්‍රේල් මාසය අවසානය වන විට දළ නිල සංචිත, එ.ජ. ඩොලර් බිලියන 9.9 ක් දක්වා මෙතෙක් වාර්තා වූ ඉහළම අගය වාර්තා කිරීමෙන් පසු ප්‍රධාන වශයෙන් ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මැදිහත් වීම පිළිබිඹු කරමින්, 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.9 ක් දක්වා පහළ ගියේය. මේ අනුව, 2018 වසරේදී සමස්ත ශේෂය එ.ජ. ඩොලර් මිලියන 1,103 ක හිඟයක් වාර්තා කළේය.

ශ්‍රී ලංකා මහ බැංකුව 2018 වසරේදී ද වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පවත්වා ගනිමින් රුපියලේ අනිසි විචලනයන් අවම කිරීම සඳහා පමණක් වෙළඳපොළ වෙත මැදිහත් වීම සිදු කරනු ලැබීය. විශේෂයෙන්ම, වසරේ දෙවන භාගය තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි

**5.1 සංඛ්‍යා සටහන**

**ගෙවුම් තුලනයෙහි විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | රුපියල් මිලියන | |
|---|---|---|---|---|
| | 2017 (අ) | 2018 (ආ) | 2017 (අ) | 2018 (ආ) |
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **-2,309** | **-2,814** | **-351,341** | **-454,308** |
| **වෙළඳ ගිණුම** | **-9,619** | **-10,343** | **-1,466,133** | **-1,673,111** |
| අපනයන | 11,360 | 11,890 | 1,732,440 | 1,933,533 |
| ආනයන | 20,980 | 22,233 | 3,198,572 | 3,606,644 |
| **සේවා (ශුද්ධ)** | **3,302** | **3,766** | **503,332** | **611,233** |
| ලැබීම් | 7,724 | 8,374 | 1,177,281 | 1,358,881 |
| ගෙවීම් | 4,421 | 4,608 | 673,949 | 747,648 |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,319** | **-2,399** | **-352,856** | **-391,934** |
| ලැබීම් | 173 | 262 | 26,394 | 42,620 |
| ගෙවීම් | 2,492 | 2,661 | 379,250 | 434,554 |
| **ද්විතීයික ආදායම් (ශුද්ධ)** | **6,327** | **6,163** | **964,316** | **999,504** |
| ද්විතීයික ආදායම් : ලැබීම් | 7,175 | 7,023 | 1,093,607 | 1,139,324 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,164 | 7,015 | 1,091,972 | 1,138,124 |
| රජයේ සංක්‍රාම | 11 | 8 | 1,634 | 1,201 |
| ද්විතීයික ආදායම් : ගෙවීම් | 848 | 860 | 129,291 | 139,821 |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **11** | **14** | **1,667** | **2,265** |
| ප්‍රාග්ධන ගිණුම : ලැබීම් | 40 | 42 | 6,125 | 6,702 |
| ප්‍රාග්ධන ගිණුම : ගෙවීම් | 29 | 27 | 4,458 | 4,437 |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **-2,298** | **-2,799** | **-349,674** | **-452,043** |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,123** | **-3,328** | **-329,233** | **-536,943** |
| **ඍජු ආයෝජන : වත්කම්** | **72** | **68** | **10,946** | **11,021** |
| **ඍජු ආයෝජන : වගකීම්** | **1,373** | **1,611** | **210,027** | **260,215** |
| **විවිධ ආයෝජන : වත්කම්** | **…** | **…** | **-12** | **6** |
| ණය සුරැකුම්පත් | … | … | -12 | 6 |
| **විවිධ ආයෝජන : වගකීම්** | **1,771** | **129** | **271,165** | **-2,281** |
| හිමිකම් | 359 | -4 | 54,606 | -3,728 |
| ණය සුරැකුම්පත් | 1,413 | 134 | 216,559 | 1,446 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන : වත්කම්** | **82** | **343** | **13,268** | **59,977** |
| මුදල් සහ තැන්පතු | 78 | 80 | 12,094 | 14,605 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 35 | 148 | 5,293 | 23,941 |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | -31 | 116 | -4,119 | 21,430 |
| **අනෙකුත් ආයෝජන : වගකීම්** | **1,916** | **997** | **298,832** | **170,968** |
| මුදල් සහ තැන්පතු | -228 | -632 | -33,698 | -107,187 |
| ණය | 1,889 | 1,568 | 293,279 | 268,661 |
| මහ බැංකුව | 184 | 252 | 28,630 | 39,999 |
| තැන්පතු භාරගන්නා ආයතන | 271 | 697 | 40,156 | 120,016 |
| රජය | 1,223 | 558 | 192,174 | 96,909 |
| අනෙකුත් අංශ | 211 | 61 | 32,319 | 11,737 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 195 | 224 | 29,436 | 32,629 |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 61 | -162 | 9,815 | -23,135 |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **2,784** | **-1,002** | **426,590** | **-179,045** |
| මූල්‍ය රත්‍රන් | - | -103 | - | -16,244 |
| විශේෂ ගැනුම් හිමිකම් | 2 | -3 | 354 | -519 |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | - | - | - | - |
| අනෙකුත් සංචිත වත්කම් | 2,782 | -896 | 426,236 | -162,282 |
| මුදල් සහ තැන්පතු | 393 | -1,012 | 60,087 | -169,138 |
| සුරැකුම්පත් | 2,389 | 122 | 366,135 | 6,732 |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **175** | **-529** | **20,441** | **-84,899** |
| **සමස්ත ශේෂය (ඇ)** | **2,068** | **-1,103** | **-330,004** | **-4,354** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් ලෙස** | | | | |
| වෙළඳ ගිණුම | -10.9 | -11.6 | | |
| භාණ්ඩ හා සේවා | -7.2 | -7.4 | | |
| ජංගම ගිණුම | -2.6 | -3.2 | | |
| ජංගම හා ප්‍රාග්ධන ගිණුම | -2.6 | -3.1 | | |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික


(ඇ) සමස්ත ශේෂය ගණනය කිරීම සඳහා 5.13 සංඛ්‍යා සටහන පරිශීලනය කරන්න.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.1 රූප සටහන** **2018 වසරේ විදේශීය අංශය සංක්ෂිප්තයක් ලෙස**

# දේශීය සහ විදේශීය සාධක හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශීය අංශය 2018 වසරේදී දැඩි පීඩනයකට ලක්විය...

## 2018 වසරේදී වෙළඳ හිගය පුළුල් විය.








**අපනයන** 4.7 % ▲ **ආනයන** 6.0 % ▲

අපනයනවල ධනාත්මක වර්ධනයක් පැවතිය ද වාහන, ඉන්ධන සහ රත්‍රන් ආනයන වියදම හේතුවෙන් වෙළඳ ගිණුමේ හිගය 2018 වසරේ පළමු කාර්තු තුන තුළදී පුළුල් විය...

## එහි ප්‍රතිඵලයක් ලෙස, ජංගම ගිණුමේ හිගය පුළුල් විය.




සංචාරක ඉපැයීම් වලින් වූ ඉහළම ලැබීම් ද තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ ප්‍රවාහන යන අංශවල ස්ථාවර වර්ධනය ද, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිගය ස්ථාවරව පැවතීම හමුවේ වුවද 2018 වසරේදී ජංගම ගිණුමේ හිගය පුළුල් විය.

## මේ අතර, මූල්‍ය ගිණුම වෙත සැලකිය යුතු ඉහළ ලැබීම් වාර්තා විය.

| හිමිකම් කොටස් වෙත ලැබීම් | හිමිකම් කොටස් වෙතින් වූ ගෙවීම් | ණය ලැබීම් | ණය ගෙවීම් |
|---|---|---|---|
| විදේශ සෘජු ආයෝජන එ.ජ.ඩො. බිලියන 2.1 | විවිධ ආයෝජන එ.ජ.ඩො. මිලියන 4 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර එ.ජ.ඩො. බිලියන 2.5 | රාජ්‍ය ණය එ.ජ.ඩො. බිලියන 1.8 |
| | | රාජ්‍ය ණය එ.ජ.ඩො. බිලියන 2.3 | බැංකු අංශයේ බැඳුම්කර එ.ජ.ඩො. බිලියන 1.35 |
| | | ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම එ.ජ.ඩො. මිලියන 252 | රාජ්‍ය සුරැකුම්පත් එ.ජ.ඩො. බිලියන 1.0 |

ඉහළ ණය ආපසු ගෙවීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ගෙවීම් හමුවේ වුවද, හිමිකම් කොටස් සහ ණය වශයෙන් වූ සැලකිය යුතු ලැබීම් හේතුවෙන් මූල්‍ය ගිණුම ශක්තිමත් විය.

## මෙම ප්‍රවණතා හමුවේ, ආනයන සීමා කිරීමට ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගැනීම හේතුවෙන් 2019 වසර ආරම්භයේදී විදේශීය අංශය ශක්තිමත් විය.

ආනයන ස්ථාවරව පවත්වා ගැනීමට සහ විනිමය අනුපාතිකය මත ඇතිවන පීඩනය වැළැක්වීමට ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කිහිපයක්ම ගන්නා ලදී...



**වාහන**

| | |
|---|---|
| 2018 සැප්. | : එ.ජ.ඩො. මිලියන 138 |
| 2018 ඔක්. | : එ.ජ.ඩො. මිලියන 161 |
| 2018 නොවැ. | : එ.ජ.ඩො. මිලියන 105 |
| 2018 දෙසැ. | : එ.ජ.ඩො. මිලියන 77 |
| 2019 ජන. | : එ.ජ.ඩො. මිලියන 50 |




**රත්‍රන්**

| | |
|---|---|
| 2018 ජන. - අප්‍රේල් | එ.ජ.ඩො. මිලියන 437 |
| 2018 මැයි - දෙසැ. | එ.ජ.ඩො. මිලියන 1 |
| 2019 ජන. | එ.ජ.ඩො. මිලියන 0.1 |

එහි ප්‍රතිඵලයක් ලෙස, වාහන සහ රත්‍රන් ආනයන සැලකිය යුතු ලෙස අඩුවීම හේතුවෙන් 2018 වසර අවසානයේදී සහ 2019 වසර මුල් කාලයේදී වෙළඳ හිගය අඩු විය.


මෙම ප්‍රවණතා හමුවේ විදේශීය අංශය මත ඇති වූ පීඩනය අඩු වූ අතර, 2019 මාර්තු අග වන විට ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අතිප්‍රමාණය විය.




5

**5.2 රූප සටහන**

**ගෙවුම් තුලනය**




මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

පැවති දැඩි ද්‍රවශීලතා තත්ත්වයන් හමුවේ, වසර තුළදී විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීව තීරණය වීමට ශ්‍රී ලංකා මහ බැංකුව ඉඩ සලසන ලදී. සමස්තයක් ලෙස ගෝලීය වෙළඳපොළ තුළ එ.ජ. ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් ජංගම ගිණුමේ හිඟයන් පවතින අනෙකුත් සමහර නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්ගේ මෙන්ම, ශ්‍රී ලංකාවේ ද සැලකිය යුතු විදේශ ආයෝජන ගෙවීම් වාර්තා විය. මේ සමග, ආනයන ඉහළ යාම හමුවේ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වය පහළ යෑම හේතුවෙන් ශ්‍රී ලංකා රුපියල වෙත සැලකිය යුතු පීඩනයක් එල්ල විය. විනිමය අනුපාතිකය දිනයක් තුළදී සැලකිය යුතු ලෙස උච්චාවචනය වීම 2018 වසරේ අවසාන කාර්තුවේදී අධික වීම හමුවේ, ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත්වීම පරික්ෂාකාරී මුහුණුවරකින් සිදුකළ අතර, දළ නිල සංචිත ද විචක්ෂණශීලී මට්ටමක පවත්වා ගන්නා ලදී. මේ අනුව, 2018 වසරේදී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 16.4 කින් අවප්‍රමාණය වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත එ.ජ. ඩොලර් මිලියන 1,120 ක් ශුද්ධ පදනම මත සපයන ලදී. තවද, ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරිත්වය පිළිබිඹු කරන මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකය, ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ අඛණ්ඩ තරගකාරිත්වය පිළිබිඹු කරමින් 2018 වසරේදී බොහෝ විට පදනම් වර්ෂයේ පැවති මට්ටමට වඩා පහළින් පැවතුණි.

2018 වසර අවසානයේ සිට 2019 වසරේ පළමු කාර්තුව තුළදී විදේශීය අංශය අවදානම්වලට මුහුණදීමට ඇති හැකියාවෙහි වර්ධනයක් පිළිබිඹු කළේය. සමහර අත්‍යාවශ්‍ය නොවන ආනයන සීමාකිරීම සඳහා හඳුන්වාදුන් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ගෙවීම් මන්දගාමී වීම සහ දේශපාලනික තත්ත්වය වඩා හිතකරවීම 2018 වසර අවසන් වන විට විදේශීය අංශය ස්ථාවර කිරීමට හේතු විය. එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් ඉදිරියේදී පොලී අනුපාතික ඉහළ නැංවීම ප්‍රමාද කිරීම පිළිබඳ අපේක්ෂාවන්, 2019 වසරේ ජනවාරි මාසයේදී රජය විසින් එ.ජ. ඩොලර් බිලියනයක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයක් ආපසු ගෙවීම හේතුවෙන් ඇති වූ ධනාත්මක ආයෝජක අපේක්ෂාවන්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම දීර්ඝ කිරීම සහ 2019 වසරේ මාර්තු මාසයේදී එ.ජ. ඩොලර් බිලියන 2.4 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සාර්ථක ලෙස නිකුත් කිරීම යනාදී සැලකිය යුතු වර්ධනයන්, 2019 වසරේ පළමු කාර්තුව තුළ විදේශීය අංශයේ අවදානම්වලට මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීමට දායක විය. ඒ අනුව, 2018 වසරේ සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වූ ශ්‍රී ලංකා රුපියල, 2019 වසරේ පළමු කාර්තුව තුළදී සියයට 3 කට වඩා වැඩි ප්‍රමාණයකින් අතිප්‍රමාණය විය. කෙසේ වුවද, සාපේක්ෂ වශයෙන් ඉහළ මට්ටමක පවතින ණය සේවාකරණ වගකීම් සහ නිල සංචිත ඉහළ නංවා ගනිමින් විදේශීය අංශයේ ආරක්ෂණ තත්ත්වය තවදුරටත් ගොඩනගා ගැනීමේ ඇති අවශ්‍යතාව මැදිකාලීන අභියෝගයන්ව පවතියි. මේ අනුව, ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීමට විදේශ ණය වෙත වැඩි වශයෙන් යොමු නොවීම, ජංගම ගිණුමේ හිඟය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සහ දිගුකාලීන ණය නොවන ප්‍රාග්ධන ප්‍රවාහ තුළින් ජාත්‍යන්තර සංචිත ඉහළ නංවා ගැනීම මූලික ප්‍රමුඛතා ලෙස පවතියි. ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සඳහා අවශ්‍ය විදේශ ණය අවම මට්ටමක පවත්වා ගැනීම සඳහා අපනයනාභිමුඛ නිෂ්පාදන සහ සේවා අංශ වෙත වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියන 3 කට වඩා වැඩි ඉලක්කගත විදේශීය සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීම අත්‍යාවශ්‍ය වේ. තවද, සේවා අපනයනවල විභවතාව ළඟා කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කිරීම තුළින්, මැදි කාලීනව රට තුළට බෙහෙවින් අවශ්‍ය ඉහළ විදේශ විනිමය ප්‍රවාහ ලබා ගැනීමට හැකි වනු ඇත.

2019 වසරේදී, විදේශීය අංශය යම් අවදානම් සහගත තත්ත්වයන් හමුවේ වුවද ධනාත්මක ඉදිරි දැක්මක් පිළිබිඹු කරයි. 2019 වසරේදී, ආනයන වර්ධනය පහළ යනු ඇතැයි ද, අපනයන වර්ධනය අඛණ්ඩව ඉහළ මට්ටමක පවතිනු ඇතැයි ද යන අපේක්ෂාවන්

5

*හමුවේ වෙළඳ ගිණුමේ සහ ජංගම ගිණුමේ පවතින හිඟයන් 2019 වසර තුළදී පහළ යනු ඇතැයි පුරෝකථනය කෙරේ. 2019 වසරේදී, ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම්වල දායකත්වය සමග සේවා ගිණුමේ අතිරික්තය වර්ධනය වනු ඇතැයි ද ගෝලීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් දැඩිවීම හමුවේ ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් වනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ තුළින් ලැබෙන විදේශ විනිමය මෑතකාලීන දක්නට ලද ප්‍රවණතාව පවත්වා ගනිමින් 2018 වසරේ පැවති මට්ටමේම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, විදේශීය සෘජු ආයෝජන ඉහළ යෑම සහ කොළඹ කොටස් වෙළඳපොළෙහි සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙහි විදේශීය ආයෝජන ස්ථාවර වීම හමුවේ, ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම නැවත ආරම්භ කිරීම සමග ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය වීම හමුවේ විදේශීය අංශය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසර තුළදී විදේශීය අංශයේ ආරක්ෂණ තත්ත්වයන් තවදුරටත් ගොඩනංවා ගැනීමේ ක්‍රියාමාර්ගයන්ට අනුව, නිල සංචිත ප්‍රමාණය ප්‍රමාණවත් මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ නමුත්, 2019 වසරේ විදේශීය අංශයේ ඉදිරි දැක්ම අවදානම්වලට ලක්වීමේ හැකියාවක් පවතී. විශේෂයෙන්ම, බලපත්‍ර භාවිතයෙන් වාහන ආනයනය කිරීම අත්හිටුවීම ඉවත් කළහොත් වෙළඳ ගිණුමේ ඇති වූ හිතකර ප්‍රවණතාව, නැවත අඩාල වීමට ඉඩ ඇත. මීට අමතරව, ගෝලීය ඉන්ධන මිල ඉහළ යෑම සහ රටෙහි අහිතකර කාලගුණ තත්ත්වය හමුවේ ඉන්ධන ආනයන වියදම ඉහළ යා හැක. තවද, දියුණු ආර්ථිකයන්ගේ පොලී අනුපාත යථා තත්ත්වයට පත්වීමේ වේගය සහ ප්‍රමාණය අනපේක්ෂිත ලෙස වෙනස්වීම හේතුවෙන් ජාත්‍යන්තර ප්‍රාග්ධන ප්‍රවාහ අස්ථාවර වීමෙන් ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුමට බලපෑම් ඇති කළ හැක.*

## 5.2 විදේශ වෙළඳ ප්‍රතිපත්ති, වර්ධනයන් සහ ආයතනික සහාය

**2018 වසරේදී විදේශ වෙළඳ ප්‍රතිපත්ති පරිසරය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා විදේශ වෙළඳාම ක්‍රමවත් කිරීම සහ ආයතනික සහාය වැඩි දියුණු කිරීම තුළින් විදේශ වෙළඳාම ප්‍රවර්ධනය කිරීම හා පහසුකම් සැලසීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග උපකාරී විය.** ශ්‍රී ලංකාව සහ සිංගප්පූරුව අතර 2018 ජනවාරි මස අත්සන් තැබූ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම 2018 මැයි මාසයේදී බලාත්මක වූ අතර එය ශ්‍රී ලංකාවේ ප්‍රථම විස්තීරණ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම වේ. මේ අතර, 2018 වසර තුළදී තායිලන්තය, චීනය සහ ඉන්දියාව සමඟ විස්තීරණ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සඳහා අඛණ්ඩව සාකච්ඡා පැවැත්විණි. ඇමෙරිකා එක්සත් ජනපදය විසින් පහළ සහ මැදි ආදායම් ලබන රටවල් සඳහා ලබාදෙන වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) 2020 වසර අවසානය තෙක් දීර්ඝ කරන ලදී. ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමයේ ජී.එස්.පී. පහසුකම භාවිතය තවදුරටත් ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකාව විසින් ක්‍රියාමාර්ග කිහිපයක් ගන්නා ලදී. වෙළඳ ලිහිල්කරණය හරහා තරගකාරිත්වය

**5.2 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකාව වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන**

| වරණීය වෙළඳ ගිවිසුම | 2017 | 2018 (අ) | | |
|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | වර්ධනය % | දායකත්වය % |
| වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී.) | 3,851.2 | 3,927.7 | 2.0 | 82.7 |
| එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) (ආ) | 2,473.9 | 2,665.3 | 7.7 | 56.1 |
| ඇමෙරිකා එක්සත් ජනපදය | 782.1 | 708.0 | -9.5 | 14.9 |
| රුසියානු සමූහාණ්ඩුව (ඇ) | 188.3 | 166.6 | -11.5 | 3.5 |
| ජපානය | 96.4 | 92.7 | -3.8 | 2.0 |
| කැනඩාව | 90.5 | 71.6 | -20.9 | 1.5 |
| ඕස්ට්‍රේලියාව | 81.4 | 79.5 | -2.4 | 1.7 |
| තුර්කිය | 79.8 | 79.5 | -0.4 | 1.7 |
| ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISLFTA) 2000 වසරේ සිට ක්‍රියාත්මකයි | 442.3 | 483.5 | 9.3 | 10.2 |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඈ) 1975 වසරේ සිට ක්‍රියාත්මකයි | 151.1 | 157.0 | 3.9 | 3.3 |
| ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) 1989 වසරේ සිට ක්‍රියාත්මකයි | 81.2 | 92.6 | 14.0 | 1.9 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) 2005 වසරේ සිට ක්‍රියාත්මකයි | 60.3 | 51.0 | -15.5 | 1.1 |
| දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) 2006 වසරේ සිට ක්‍රියාත්මකයි | 41.1 | 35.4 | -13.8 | 0.7 |
| දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) 1995 වසරේ සිට ක්‍රියාත්මකයි | 4.5 | 3.5 | -21.2 | 0.1 |
| **වරණීය වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන** | **4,631.7** | **4,750.7** | **2.6** | **100.0** |
| **මුළු අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස** | **40.8** | **40.0** | | |

මූලය: වාණිජ දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික
(ආ) යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන භාණ්ඩවලින් තීරු බදු අයිතම සියයට 66 කට වරණීය ප්‍රවේශය ලබා දෙන අතර යුරෝපා සංගමය මගින් ලබා දෙන ජී.එස්.පී. ප්ලස් සහනය මගින් යුරෝපා සංගමයේ රටවල් වෙත ආනයනය කරන එම තීරු බදු අයිතම සඳහාම තීරු බදු රහිත ප්‍රවේශයක් ලබා දේ.
(ඇ) රුසියාව, බෙලාරුස් හා කසකස්ථානය ඇතුළත් වේ.
(ඈ) පෙරදී මෙය බැංකොක් ගිවිසුම ලෙස හඳුන්වන ලදි.

වැඩිදියුණු කරමින් ආයෝජන ආකර්ෂණය තුළින් ශ්‍රී ලංකාව ගෝලීය අගය දාමයන් (Global Value Chains) තුළට යොමු කිරීම අරමුණු කොටගෙන 2017 වසරේදී හඳුන්වා දුන් නව වෙළඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ලැබීය. මෙම ක්‍රියාවලියට සහාය පිණිස ආයතන සහ පුද්ගලයන් හට තරඟකාරිත්වයට මුහුණ දීමට උපකාරි වීම සඳහා වෙළඳ ගැළපුම් වැඩසටහනක් (Trade Adjustment Programme) සකස් කරමින් පැවතුණි. උසස් වෙළඳ භාවිතයන් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රධාන අණ පනත් වන ප්‍රපාතන විරෝධී හා ප්‍රතිතෝලන බදු පනත සහ ආරක්ෂණ පියවර පනත පාර්ලිමේන්තුවේදී සම්මත කරන ලද අතර එමගින් දේශීය කර්මාන්ත අසාධාරණ වෙළඳ භාවිතයන්ගෙන් ආරක්ෂා කෙරෙයි. මේ අතර, අපනයන ප්‍රවර්ධනය වේගවත් කිරීම සඳහා 2018-2022 කාලපරිච්ඡේදයට අදාළ වන ජාතික අපනයන ක්‍රමෝපාය 2018 ජූලි මාසයේදී දියත් කරන ලදී. මේ අනුව, පුළුල් ක්‍රියාකාරකම් සැලැස්මක් සහිතව වෙළඳ සහයෝගිතා කාර්යයන් හතරක් සහ ඉලක්කගත අංශ හයක් හඳුනාගෙන ඇත. තවද, ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැපයීමේ ගිවිසුමට අනුව 2018 ජූලි මාසයේදී වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal) දියත් කළ අතර, ජාතික තනි කවුළු පද්ධතියක් (National Single Window) ස්ථාපනය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. මේ අතර, ආයෝජන අනුමත කිරීමේ කටයුතු වේගවත් කිරීම සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මගින් අන්තර්ජාලය පදනම් කරගත් තනි කවුළුවක් ආරම්භ කරන ලදී. මෙවැනි ක්‍රියාමාර්ගවල ප්‍රතිඵල පිළිබිඹු කරමින්, ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන දර්ශකයේ (Ease of Doing Business Index) ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම 2018 වසරේදී පැවති 111 ස්ථානයේ සිට 2019 වසරේදී 100 වන ස්ථානය දක්වා වැඩි දියුණු වී ඇති අතර 2019 වසරේදී යෝජිත ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමත් සමඟ මෙම දර්ශකය තවත් වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වරණීය ගිවිසුම් යටතේ සිදු කළ අපනයන සඳහා යුරෝපා සංගමයේ සහ ඇමෙරිකා එක්සත් ජනපදයේ ජී.එස්.පී. යෝජනා ක්‍රම සහ ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ අපනයන ප්‍රධාන වශයෙන් දායක විය.** 2017 මැයි මාසයේදී යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යෝජනා ක්‍රමය ප්‍රතිස්ථාපනය කිරීමෙන් පසුව අපනයනය සඳහා මුළු තීරු බදු අයිතමවලින් සියයට 66 ක් සඳහා බදු ඉවත් කිරීමේ ප්‍රතිලාභ ලබාගනිමින් එම ක්‍රමය යටතේ යුරෝපා සංගමය වෙත සිදු කළ අපනයන කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ඇඟලුම්, රබර් නිෂ්පාදිත, තේ, ආහාර පාන වර්ග හා දුම්කොළ සහ මුහුදු ආහාර යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් යටතේ සිදු කළ ප්‍රධාන අපනයන කාණ්ඩ වේ. තෝරාගත් කලාපීය රටවලින් අමු ද්‍රව්‍ය අවශ්‍යතා සපුරාගැනීම සඳහා අවසරය පතා කලාපීය සමුච්චිතකරණය (Regional Cumulation) හරහා යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් ක්‍රමයේ භාවිතය වැඩි දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ප්‍රයත්නයක් දරා ඇත. උදාහරණයක් ලෙස, ශ්‍රී ලංකාවේ ඇඟලුම් ක්ෂේත්‍රය සඳහා ඉන්දුනීසියාවෙන් ආනයනය කරන අමු ද්‍රව්‍ය යොදා ගැනීමට අවසර පතමින් 2018 වසරේදී ශ්‍රී ලංකා සහ ඉන්දුනීසියානු රජයන් එක්ව යුරෝපා සංගමය වෙත ඒකාබද්ධ ඉල්ලීමක් කළ අතර දකුණු කොරියාවෙන් ගෙන්වනු ලබන ඇඟලුම් අමුද්‍රව්‍ය වෙනුවෙන් යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් ක්‍රමයේ දීර්ඝ කළ සමුච්චිතකරණ (Extended Cumulation) රීතිය යටතේ තවත් යෝජනාවක් ශ්‍රී ලංකාව විසින් ඉදිරිපත් කර ඇත. වරණීය ගිවිසුම් යටතේ සිදු කළ මුළු අපනයනවලින් සියයට 15 ක් පමණ වන ඇමෙරිකා එක්සත් ජනපදයේ ජී.එස්.පී. යටතේ සිදු කළ අපනයන 2018 වසරේදී පහත වැටුණි. මේ අතර, සංචාරක භාණ්ඩ ජී.එස්.පී. පහසුකම යටතට ඇතුළත් කිරීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය තීරණය කිරීමෙන් පසුව ශ්‍රී ලංකාව ඇතුළුව සියලුම ප්‍රතිලාභී රටවල් 2018 ජූලි 01 දින සිට ඇමෙරිකා එක්සත් ජනපදයට සංචාරක භාණ්ඩ අපනයනයේදී බදු නිදහස් ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබීය. රුසියානු සමූහාණ්ඩුව, ජපානය, ඕස්ට්‍රේලියාව, තුර්කිය, කැනඩාව සහ ස්විට්සර්ලන්තය වැනි වෙනත් දියුණු රටවල් කිහිපයකම ජී.එස්.පී. ක්‍රම මගින් ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබුව ද එමගින් අපනයන සඳහා ඇති දායකත්වය සාපේක්ෂව පහළ අගයක පැවතුණි. මේ අතර, ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව සිදු කළ අපනයන 2018 වසරේදී ඉහළ ගිය අතර මෙක්සිකෝව, පේරු සහ ඉක්වදෝරය වෙත කළ කුරුඳු අපනයන මීට ප්‍රධාන වශයෙන් දායක විය. පටු අපනයන පදනම සහ අඩු නිෂ්පාදන ආවරණය ශ්‍රී ලංකාවට මෙවැනි ජී.එස්.පී. ක්‍රම මගින් සම්පූර්ණ ප්‍රතිලාභ අත්පත් කර ගැනීමට ඇති අවස්ථාව වළක්වා ඇත.

**ගෝලීය අගය දාමයන් තුළ වඩාත් යහපත් ලෙස ස්ථානගත වෙමින් නව ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම් හරහා විභවතාවයෙන් යුතු වෙළඳපොළ වෙත ළඟාවීම අරමුණු කරගත් ප්‍රයත්න තවදුරටත් ගනු ලැබීය.** සාකච්ඡා වට අටකින් පසුව 2018 ජනවාරි මාසයේදී ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම අත්සන් කරන ලද අතර එය 2018 මැයි මාසයේදී බලාත්මක විය.

5

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවේ ප්‍රථම විස්තීරණ නිදහස් වෙළඳ ගිවිසුම වන අතර එමගින් භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධනය, වෙළඳ ප්‍රතිකර්ම, විදුලි සංදේශ, විද්‍යුත් වාණිජ්‍යය, රාජ්‍ය ප්‍රසම්පාදනය, තරඟකාරිත්වය, බුද්ධිමය දේපොළ අයිතිය සහ විනිවිදභාවය වැනි ක්ෂේත්‍ර ආවරණය වේ. ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ පුළුල් ආවරණයක් පැවතිය ද සිංගප්පූරුව සාමාන්‍යයෙන් ඔවුන්ගේ වෙළඳ භාණ්ඩ තීරු බදු අයිතම සියයට 99 කටත් වඩා බදු නිදහස් වෙළඳ පිවිසුමක් ලබා දෙන බැවින් ශ්‍රී ලංකාව මෙම ගිවිසුම හරහා සේවා වෙළඳාමෙහි ව්‍යාපාරික අවස්ථා ඇති කර ගැනීමෙන් සහ සිංගප්පූරුවෙන් ආයෝජන ලබා ගැනීම තුළින් ප්‍රධාන වශයෙන්ම ප්‍රතිලාභ ලබා ගැනීමට අපේක්ෂා කරනු ලබයි. ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමෙහි තීරු බදු නිදහස් කිරීමේ වැඩසටහනෙහි පළමු අදියර යටතේ ශ්‍රී ලංකාව විසින් තීරු බදු අයිතම සියයට 50 ක් (3,719 ක්) ලිහිල් කරන ලදී. කෙසේ වුවද, ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳව විවිධ පාර්ශ්වකරුවන් මතු කළ ගැටලු හේතුවෙන් එම ගිවිසුම තවදුරටත් සමාලෝචනය කර වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා විශේෂඥ කමිටුවක් පත් කරන ලදී. එබැවින්, එවැනි ගැටලු පිළිබඳ තවදුරටත් සාකච්ඡා කිරීමට සහ ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම හා සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ඉදිරියේදී පැවැත්වීමට අපේක්ෂිත ඒකාබද්ධ කමිටු රැස්වීම්වලදී තීරණය කරනු ඇත. ශ්‍රී ලංකාව චීනය සමඟ ද විස්තීරණ නිදහස් වෙළඳ ගිවිසුමක් ඇති කර ගැනීමට අපේක්ෂා කරයි. ඒ සඳහා සාකච්ඡා වට හයක් දැනටමත් අවසන් කර ඇති අතර 2019 වසරේදී තවදුරටත් සාකච්ඡා සිදු කිරීමට අපේක්ෂිතය. යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධනය, වෙළඳාමට ඇති තාක්ෂණික බාධා, වෙළඳාමට පහසුකම් සැලසීම සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව වැනි ක්ෂේත්‍ර ආවරණය කිරීමට අපේක්ෂිතය. මේ අතර, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර විස්තීරණ නිදහස් වෙළඳ ගිවිසුමක් සඳහා විෂය පථය නිර්ණය කිරීමේ හමුවක් 2018 මැයි මාසයේ දී පැවති අතර 2018 ජූලි සහ සැප්තැම්බර් මාසවලදී සාකච්ඡා වට දෙකක් පැවැත්විණි. මෙම සාකච්ඡා වටවලදී ක්‍රියාකාරී කණ්ඩායම් නවයක් ස්ථාපිත කරන ලද අතර එම කණ්ඩායම්වල විෂය පථය හා වැඩ සැලැස්ම පිළිබඳව සාකච්ඡා කර ඇත. මේ අතර, වසර තුළදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර යෝජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුමේ (එට්කා) සාකච්ඡා අඛණ්ඩව පැවැති අතර 2018 සැප්තැම්බර් මස වන විට සාකච්ඡා වට 11 ක් පවත්වා අවසන් කර ඇත. දැනට පවතින ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි දිගුවක් වන ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම විස්තීරණ ගිවිසුමක් වන අතර එමගින් භාණ්ඩ හා සේවා වෙළඳාම, ආයෝජන ප්‍රවර්ධනය සහ ආර්ථික හා තාක්ෂණික සහයෝගිතාව වැනි ක්ෂේත්‍ර ආවරණය කරනු ලබයි. ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමෙහි ප්‍රධාන අරමුණක් වනුයේ දැනට පවතින ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ගැටලු නිරාකරණය කිරීමයි. එපමණක් නොව, වර්තමාන ද්විපාර්ශ්වික වෙළඳාම සඳහා පවතින ප්‍රධාන බාධා ලෙස හඳුනාගෙන ඇති ගුණාත්මක ප්‍රමිතීන් සහ භාණ්ඩ වෙළඳාමට අදාළ සෞඛ්‍ය ආරක්ෂාව සහ ශාක සෞඛ්‍ය ආරක්ෂාව (Sanitary and Phyto-sanitary) වැනි බදු නොවන බාධා කෙරෙහි ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම මගින් විශේෂ අවධානය යොමු කර ඇත. තවද, ඉන්දියාව ඔවුන්ගේ සියලුම ද්විපාර්ශ්වික ආයෝජන ගිවිසුම්වලින් 2017 වසරේ මාර්තු මසදී ඉවත් වූ බැවින් ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමෙහි ආයෝජන පරිච්ඡේදය දෙරට අතර ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගැනීමට අපේක්ෂිතය. එසේම ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා පරිච්ඡේදය යටතේ කෘෂිකර්මය, අධ්‍යාපනය, සංචාරක ව්‍යාපාරය, ප්‍රවාහන, ගුවන් සේවා හා වරාය, බලශක්තිය, විද්‍යාව, තාක්ෂණය සහ පර්යේෂණ වැනි ආර්ථිකයේ විවිධ ක්ෂේත්‍ර සඳහා වන සහයෝගිතාව වර්ධනය කිරීමට අපේක්ෂා කරයි. තවද, 2018 වසරේදී නිදහස් වෙළඳ ගිවිසුම් සඳහා විභවතා පවතින මාර්ග සොයා බැලීම සඳහා මැලේසියාව, ඉන්දුනීසියාව සහ බංග්ලාදේශය සමග මූලික අධ්‍යයන සහ සාකච්ඡා සිදු කරන ලදී.

**පවතින නිදහස් වෙළඳ ගිවිසුම්වල ඉහළ උපයෝගිතා අනුපාතිකයක් පැවතිය ද එම ගිවිසුම් යටතේ වන අඩු වෙළඳ පරිමා සැලකිල්ලට ගනිමින් මෙවැනි ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම්වල භාවිතය තවදුරටත් ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබීය.** 2000 වසරේ සිට බලපැවැත්වෙන ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම, ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය සඳහා දායකත්වය සපයන ප්‍රධානම ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම වේ. ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි භාවිතය ශ්‍රී ලංකාවට වාසිදායක වන අතර එම ගිවිසුම යටතේ සිදු කළ අපනයන 2018 වසරේදී ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් සත්ත්ව ආහාර, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ඇඟලුම්වලින් සමන්විත වූ ශ්‍රී ලංකාව ඉන්දියාව වෙත නිදහස් වෙළඳ

5

ගිවිසුම හරහා සිදු කළ අපනයන, ඉන්දියාව වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 62 ක් පමණ වූ අතර ඊට සාපේක්ෂව එම ගිවිසුම යටතේ ඉන්දියාවෙන් සිදු කළ ආනයන ඉන්දියාවෙන් කළ මුළු ආනයනවලින් සියයට 6 ක් පමණ විය. ඇඟලුම් හා කළු ගම්මිරිස් මත වන ප්‍රමාණාත්මක සීමා කිරීම්, විශේෂයෙන්ම තේ සඳහා වන රේගු නිෂ්කාශන ක්‍රියාවලිය සහ නියැදි පරීක්ෂා කිරීම්, ඉහළ ලේබන ගාස්තු සහ ප්‍රමාදයන් වැනි ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීමේදී ඇති ගැටලු නිරාකරණය කිරීම සඳහා රජය තවදුරටත් සම්බන්ධ විය. මේ අතර, පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සිදු කළ අපනයන 2018 වසර තුළදී පහත වැටිණි. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් අපනයනය කළ ප්‍රධාන නිෂ්පාදිත වූයේ බුලත් කොළ සහ ෆයිබර් ලැලි ආදියයි. පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ අඩු වෙළඳ පරිමා වාර්තා කළද උපයෝජනය ගැන සැලකීමේදී 2018 වසරේදී එම ගිවිසුම යටතේ සිදු කළ අපනයන සියයට 67 ක පමණ ඉහළ අගයක් ද ආනයන සියයට 10 ක පමණ පහළ අගයක් ද ගැනීමෙන් පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම උපයෝජනය කිරීම ශ්‍රී ලංකාවට වාසිදායක බව පෙන්නුම් කරයි. මේ අනුව, ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම හා පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් සැලකීමේදී ශ්‍රී ලංකාව ගිවිසුම් දෙක තුළින්ම වාසිදායක වෙළඳ ශේෂයක් පවත්වා ගෙන ඇති බව පැහැදිලි වේ.

**බහු පාර්ශ්වික වෙළඳ සාකච්ඡා සැලකීමේදී දෝහා වටයේ ගැටලු පවතින කාලවකවානුවක කලාපීය වෙළඳාම සහ සේවා ජාල අතර සහයෝගීතාව වර්ධනය කිරීමේ වැදගත්කම සලකා බලා කලාපීය වරණීය වෙළඳ ගිවිසුම් සමග කටයුතු කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.** 2006 වසරේදී ක්‍රියාත්මක වූ දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණය (SAFTA), දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) ප්‍රතිස්ථාපනය කරමින් වරණීය වෙළඳාම ප්‍රවර්ධනය හරහා දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (සාර්ක්) ආර්ථික ඒකාබද්ධතාව තවදුරටත් වර්ධනය කිරීම අරමුණු කර ගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස දකුණු ආසියානු වරණීය වෙළඳ ගිවිසුමෙහි භාවිතය ක්‍රමයෙන් අඩු වූ අතර 2018 වසරේදී දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණයෙහි භාවිතය ද පහළ අගයක පැවතුණි. දකුණු ආසියානු නිදහස් වෙළඳ වරණයේ වෙළඳ ලිහිල්කරණ වැඩසටහනෙහි පළමු සහ දෙවන අදියරයන් ශ්‍රී ලංකාව විසින් පිළිවෙළින් 2015 සහ 2018 වසර වලදී සම්පූර්ණ කර ඇත. ප්‍රධාන වශයෙන් චීනය වෙත සිදු කළ කළු තේ, සක්‍රීය කාබන්, ඇඟලුම් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදිත හේතුවෙන් 2018 වසරේදී ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) යටතේ සිදුකළ අපනයන ඉහළ ගොස් ඇත. 2017 සැප්තැම්බර් මාසයේ දී පැවැත්වූ 51 වන ස්ථාවර කමිටුවේදී ගත් තීරණයට අනුව, 2018 ජනවාරි 01 වන දින සිට හතරවන වටයේ සහන ක්‍රියාත්මක කිරීම සඳහා ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමේ හවුල්කාර රටවල් එකග වූ අතර ඒ අනුව, 2018 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාව විසින් මෙම සහන ක්‍රියාත්මක කර ඇත. මේ අතර, 2018 නොවැම්බර් මස පැවති බහු ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගිතාව උදෙසා වන බෙංගාල බොක්කේ රටවල මූලිකත්වය (BIMSTEC) හි වෙළඳ සාකච්ඡා කමිටුවේ 21 වැනි හමුවේදී වෙළඳ භාණ්ඩ සඳහා එම සංවිධානයෙහි නිදහස් වෙළඳ ගිවිසුම ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට එකඟතාවකට පැමිණ ඇත.

**ලෝක වෙළඳ සංවිධානයේ වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමට අදාළ කටයුතු ක්‍රියාත්මක කරන අතරතුර 2018 වසරේදී ශ්‍රී ලංකාව සහ ලෝක වෙළඳ සංවිධානය අතර කටයුතු අඛණ්ඩව සිදු විය.** ශ්‍රී ලංකාව විසින් වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම 2016 මැයි මස ස්ථිර කළ අතර එය 2017 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක විය. එතැන් සිට ශ්‍රී ලංකාව විසින් "ඒ", "බී" සහ "සී" යන කාණ්ඩ යටතේ දක්වා ඇති සිය බැඳීම් ලෝක වෙළඳ සංවිධානය වෙත දන්වා ඇත. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාවේ බැඳීම් ඉටු කරමින් 2018 ජූලි මාසයේදී වෙළඳ තොරතුරු ද්වාරය දියත් කළ අතර එමගින් වෙළඳාම සම්බන්ධ නියාමන තොරතුරු තනි වෙබ් අඩවියක් තුළ අන්තර්ගත කර ඇත. වෙළඳ තොරතුරු ද්වාරය පාර්ශ්වකරුවන් 43 දෙනෙකුගේ සහාය ඇතිව වාණිජ දෙපාර්තමේන්තුව මගින් කළමනාකරණය වන අතර එය වෙළඳ ප්‍රවාහ සුමටව සිදුවීම තහවුරු කරමින් දේශ සීමා අතර වෙළඳාමට පහසුකම් සැලසීමේ ප්‍රධාන පියවරක් ලෙස ක්‍රියා කරයි. වෙළඳාම සඳහා පහසුකම් සැලසීමේ ගිවිසුමේ අනෙක් ප්‍රධාන මූලාරම්භය වන ජාතික තනි කවුළු පද්ධතිය ලෝක බැංකුවේ සහාය ඇතිව ස්ථාපනය කරමින් පවතින අතර එහි මූලික සැලැස්ම සැකසීම අවසන් අදියරේ පවතී. 2017 දෙසැම්බර් මස ලෝක වෙළඳ සංවිධානයේ 11 වන අමාත්‍ය මණ්ඩල මට්ටමේ සමුළුවෙන් අනතුරුව වත්මන් ගෝලීය වාතාවරණය තුළ වෙළඳ න්‍යාය පත්‍ර සඳහා වැඩි වශයෙන් අවධානයක් යොමු කරන නව විෂය ගැටලු පැන නැගුණ නමුත් මෙම විෂය ගැටලු සඳහා ගත යුතු

ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳව පොදු එකඟතාවයකට තවමත් පැමිණ නොමැත. මෙම නව විෂය ගැටලු යටතට විද්‍යුත් වාණිජ්‍යය, ආයෝජන සඳහා පහසුකම් සැලසීම, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ සේවාවන් පිළිබඳ දේශීය නියාමන ඇතුළත් වේ.

**2018 වසරේදී අපනයන ප්‍රවර්ධනය සඳහා ප්‍රතිපත්ති සහ ආයතනික සහාය ශක්තිමත් කිරීම ඉලක්ක කරගත් ප්‍රධාන මූලාරම්භයන් කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී.** නව වෙළඳ ප්‍රතිපත්තිය යටතේ වෙළඳාම ලිහිල්කරණය, ආයෝජන ප්‍රවර්ධනය සහ භාණ්ඩ කොටස් වශයෙන් බෙදා නිෂ්පාදනය කෙරෙන ජාල හා සම්බන්ධ වීම වැනි ක්ෂේත්‍ර කිහිපයක් සඳහා ක්‍රියාමාර්ග ගැනීම අරඹන ලදී. නව වෙළඳ ප්‍රතිපත්තිය මගින් යෝජිත ප්‍රතිසංස්කරණය හරහා දේශීය කර්මාන්තවලට වක්‍රාකාරයෙන් බලපෑම් ඇති විය හැකි බැවින් නව වෙළඳපොළ තත්ත්වයන් සඳහා ආයතන සහ සේවකයන් සුමට ලෙස යොමු කිරීමට සහාය දැක්වීම සඳහා වෙළඳ ගැළපුම් වැඩසටහනක් හඳුන්වා දී ඇත. ඵලදායී අයුරින් නව වෙළඳ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් 2019 මාර්තු මාසයේ දී වෙළඳ හා ඵලදායිතා කොමිසමක් සහ ඒකාබද්ධ නියාමන කමිටුවක් පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිවිය. මේ අතර, සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය විසින් අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව 2018 ජූලි මාසයේදී 2018-2022 සඳහා වන ජාතික අපනයන ක්‍රමෝපාය ක්‍රියාත්මක කළ අතර ජාතික අපනයන ක්‍රමෝපාය යටතේ වන ක්‍රියාකාරී සැලසුම් දැනටමත් ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත (2018-2022 සඳහා වන ජාතික අපනයන ක්‍රමෝපාය පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා විශේෂ සටහන 2 බලන්න). අපනයන නිෂ්පාදිත සහ වෙළඳපොළ විවිධාංගීකරණය පහළ මට්ටමක පැවතීම වැනි ගැටලු නිරාකරණය කිරීම සඳහා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳාම පිළිබඳ අමාත්‍යාංශය මගින් "ජාතික ගුණාත්මක යටිතල පහසුකම්" සහ "2018-2022 සඳහා නවෝත්පාදන හා ව්‍යවසායකත්ව ක්‍රමෝපාය" වැනි උපායමාර්ග කිහිපයක් සකස් කර ඇත. තවද, 2020 වන විට ශ්‍රී ලංකාව ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන ශ්‍රේණිගත කිරීමේ 70 වන ස්ථානය දක්වා ඉහළ නැංවීමේ අරමුණින් සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර කටයුතු අමාත්‍යාංශය විසින් 2017 වසරේදී හඳුන්වා දුන් ආයෝජන වාතාවරණය ප්‍රතිසංස්කරණය සඳහා වූ පෙර දැක්ම යටතේ කාර්ය සාධක බලකා අටක කටයුතු සම්බන්ධීකරණය කරනු ලැබීය. 2018 වසරේදී මෙම කාර්ය සාධක බලකා විසින් විවිධ කාර්යයන් ක්‍රමවත් කිරීම සහ කඩිනම් කිරීම සිදු කළ අතර එය ශ්‍රී ලංකාවට 2019 වසර සඳහා ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන ශ්‍රේණිගත කිරීමෙහි 100 වන ස්ථානය දක්වා ස්ථාන 11 කින් ඉදිරියට ඒමට උපකාර විය. 2018-2022 සඳහා ජාතික අපනයන ක්‍රමෝපාය සහ ඊට සම්බන්ධ ක්‍රියාකාරී සැලැස්මේ කටයුතු ක්‍රියාවට නැංවීමට අමතරව අපනයන සංවර්ධන මණ්ඩලය මගින් අපනයන ප්‍රවර්ධනය සඳහා දැනටමත් ආරම්භ කර ඇති කටයුතු ඉදිරියට පවත්වාගෙන යන අතරතුර නව ක්‍රියාමාර්ග කිහිපයක් සඳහා මුල පුරන ලදී. 2018 අයවැය මගින් හඳුන්වා දුන් පරිදි අපනයන සංවර්ධන මණ්ඩලය විසින් වෙළඳ ප්‍රවේශ උපකාරක වැඩසටහන, තොරතුරු තාක්ෂණ වැඩසටහන, ඉලෙක්ට්‍රොනික සහ විදුලි සංරචක ක්ෂේත්‍රය සඳහා බහු ජාතික සමාගම්හි සහාය ගැනීමේ වැඩසටහන, බෝට්ටු නිෂ්පාදන අංශය සඳහා යටිතල පහසුකම් සැපයීම සහ නියාමන රාමුවක් සකස් කිරීම, අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ ප්‍රවර්ධන වෙබ් අඩවිය (e-MARKETPLACE) ස්ථාපිත කිරීම සහ "ඇරඹුම" ණය යෝජනා ක්‍රමය වැනි නව වැඩසටහන් කිහිපයක් ආරම්භ කරන ලදී. මීට අමතරව, ප්‍රාදේශීය වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් 2,000 ක් නව අපනයන ශූරයින් බවට පත් කිරීම, කාන්තා ව්‍යවසායකයින් ප්‍රවර්ධනය කිරීම සහ "එක ගමක් එක නිෂ්පාදනයක්" වැඩසටහන යටතේ එකතු කළ අගයක් සහිත තෝරාගත් නිෂ්පාදන සඳහා ගොවි සංගම් පිහිටුවීම වැනි ජාතික වැඩසටහන් තවදුරටත් පුළුල් කළ අතර එමගින් හඳුනාගත් ප්‍රදේශවල සෘජුව හා වක්‍රව නව අපනයනකරුවන් හඳුන්වා දී ඇත. තෝරාගත් නව අපනයනකරුවන් දැනුම්වත් කිරීමේ වැඩසටහන්, දේශීය හා විදේශීය වෙළඳ සල්පිල් සඳහා වූ සංචාර සහ තාක්ෂණික සහාය ආදිය මගින් ප්‍රතිලාභ ලබා ගෙන ඇත. තවද, 2018 වසරේදී පිළිගත් විදේශ වෙළඳ ප්‍රදර්ශන සඳහා සහභාගි වීම, දේශීය හා විදේශීය වෙළඳ නියෝජිතයන් සඳහා පහසුකම් සැපයීම, වෙළඳාම සම්බන්ධ ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා අපනයනකරුවන්ගේ සමුළු පැවැත්වීම සහ අපනයනකරුවන් සඳහා සම්මාන ප්‍රධානෝත්සව පැවැත්වීම මගින් ඔවුන්ව ඇගයීම වැනි වෙළඳපොළ ප්‍රවේශය, වෙළඳ ප්‍රවර්ධනය සහ පහසුකම් සැලසීම හා සම්බන්ධ නිත්‍ය කටයුතු අඛණ්ඩව සිදු කෙරිණි. වාණිජ මණ්ඩල මගින් ද වසර පුරාම අපනයන ප්‍රවර්ධන කටයුතු කෙරෙහි දායකත්වය ලැබුණ අතර එය ප්‍රතිපත්ති සැකසීම, ගැටලු නිරාකරණය සහ වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා පැවැත්වීම වැනි කටයුතුවලදී රජය සහ පෞද්ගලික අංශයේ පාර්ශ්වකරුවන් අතර සම්බන්ධතාවය වර්ධනය කිරීම පිණිස උපකාරී විය. මෙම වාණිජ මණ්ඩල විසින් අපනයනකරුවන් සඳහා

5

පාර්ශ්වකරුවන්ගේ උපදේශන ලබාදීමේ, දැනුම්වත් කිරීමේ සමුළු සහ හැකියාවන් ගොඩ නැංවීමේ වැඩසටහන් සඳහා කටයුතු කර ඇත. මේ අතර, ශ්‍රී ලංකා රේගුව විසින් බහාලුම් හැසිරවීම, ස්වයංක්‍රීයකරණය සහ නිෂ්කාශනය, පරීක්ෂා කිරීම සහ අධීක්ෂණය කිරීම හා සම්බන්ධ කටයුතු තවදුරටත් විධිමත් කර ඇත.

**2018 වසරේදී වෙළඳාම සඳහා සහාය වන නීති බලාත්මක කළ අතර 2019 අයවැය මගින් අපනයන ප්‍රවර්ධනය සඳහා නව යෝජනා කිහිපයක් නිවේදනය කරන ලදී.** 2019 අයවැය මගින් තෝරාගත් භාණ්ඩ සඳහා වසර 5 ක කාලසීමාවක් තුළ තීරු බදුවලට අමතරව අය කරන අනෙකුත් බදු වර්ග තවදුරටත් ක්‍රමයෙන් අඩු කිරීමට යෝජනා කර ඇත. තවද, අපනයන වෙළඳපොළ ප්‍රවේශ වැඩසටහන සහ වෙළඳ ගැළපුම් වැඩසටහන තුළින් වෙළඳාම සඳහා පහසුකම් සැපයීමට ක්‍රියාමාර්ග හඳුන්වාදී ඇත. ජාතික අපනයන ක්‍රමෝපායට සහ නව වෙළඳ ප්‍රතිපත්තියට සමගාමීව නව පර්යේෂණ පහසුකම් ස්ථාපිත කිරීම සහ ප්‍රමුඛතා අංශ සඳහා ව්‍යාපාර කිරීමේ මධ්‍යස්ථාන (Trading Houses) ඇති කිරීම මෙන්ම වරාය පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු සඳහා පෞද්ගලික අංශය දිරිමත් කිරීම ද කරනු ඇත. මේ අතර, නව්‍යකරණයෙන් යුතු නිෂ්පාදන සංවර්ධනයට සහාය වීම සඳහා ව්‍යවසාය නවෝත්පාදන වැඩසටහනක් ආරම්භ කිරීමට යෝජනා කර ඇත. තවද, නව කර්මාන්ත කලාප දෙකක් බිංගිරිය සහ වගවත්ත ප්‍රදේශවල ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අතර උතුරු සහ නැගෙනහිර පළාත් සඳහා කර්මාන්තපුර කිහිපයක් යෝජනා කර ඇත. මේ අතර, නිෂ්පාදන පිරිවැය අඩු කිරීමේ අරමුණින් ඉදිකිරීම් ද්‍රව්‍ය සහ හෝටල් නවීකරණය කිරීම සඳහා යොදාගන්නා ද්‍රව්‍ය වැනි තෝරාගත් භාණ්ඩ සඳහා අදාළ වන තීරු බදු මෙන්ම තීරු බදුවලට අමතරව අය කරන වෙනත් බදු වර්ග ද අඩු කර ඇත. මෝටර් රථ ආනයනය සීමා කිරීම සඳහා තෝරාගත් මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු ඉහළ දැමූ අතර ණයවර ලිපි සඳහා පනවා තිබූ ආන්තික තැන්පතු අවශ්‍යතාවය ඉවත් කරන ලදී.

**ආරම්භ කරන ලද නව උපායමාර්ග, ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ, ආයතනික සහාය සහ තරඟකාරී විනිමය අනුපාතික තුළින් ඉදිරි කාලයේදී වෙළඳ කාර්යසාධනය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර ගෝලීය වර්ධනයන් සහ නොවිසඳුණු දේශීය ගැටලු තිරසාර වෙළඳ කටයුතු සඳහා තවදුරටත් අභියෝග ඇති කරනු ඇත.** වාර්තාගත ඉහළ අපනයන ආදායම සහ සෘජු විදේශීය ආයෝජන ලැබීම්, ව්‍යාපාර කිරීමේ පහසුව දක්වන දර්ශකයේ වැඩිදියුණු වීම, නව ද්වීපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම, 2018-2022 සඳහා ජාතික අපනයන ක්‍රමෝපාය සහ වෙළඳ තොරතුරු ද්වාරය දියත් කිරීම, වෙළඳ ප්‍රතිකර්ම ක්‍රියාත්මක කිරීම සහ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වාගෙන යෑම 2018 වසරේදී විදේශ වෙළඳාමේ ක්‍රියාකාරීත්වය සඳහා උපකාරී වූ ප්‍රධාන ජයග්‍රහණ වේ. 2017 වසරේදී යුරෝපා සංගමයේ ජී.එස්.පී. ප්ලස් පහසුකම ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ යුරෝපා සංගමයේ වෙළඳපොළ වෙත මුහුදු ආහාර අපනයනය සඳහා වූ තහනම 2016 වසරේදී ඉවත් කර ගැනීම තුළින් අපනයන සඳහා ධනාත්මක ප්‍රතිඵල ලබා දී ඇත. කෙසේ වුවද, ආනයන වාර්තාගත ඉහළ මට්ටමක පැවතීම, අඩු නිෂ්පාදන ඵලදායිතාව හා ඉහළ නිෂ්පාදන පිරිවැය තුළින් තරඟකාරීත්වය අඩුවීම සහ දේශගුණික විපර්යාසවල බලපෑම් යනාදිය තිරසාර වෙළඳ කාර්යසාධනය සඳහා වන ප්‍රධාන දේශීය අභියෝග ලෙස පවතී. මීට අමතරව, වෙළඳ ගැටුම්වලට තුඩු දෙන සංවර්ධිත රටවල පවතින ආරක්ෂණවාදී වෙළඳ ප්‍රතිපත්ති, විශේෂයෙන්ම ඇමෙරිකා එක්සත් ජනපදය සහ චීනය අතර පවතින වෙළඳාම හා සම්බන්ධ නොවිසඳුණු ගැටලුකාරී තත්ත්වයන් සහ එමගින් ගෝලීය වෙළඳාම සහ වර්ධනය සඳහා ඇතිවිය හැකි අහිතකර බලපෑම්, යුරෝපා සංගමයෙන් බ්‍රිතාන්‍යය ඉවත්වීමේ ක්‍රියාවලිය, ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ භූ-දේශපාලනික අවිනිශ්චිතතා, ගෝලීය අගය දාමයන් සඳහා පවතින අඩු සහභාගිත්වය, ඉහළ මට්ටමක පවතින සහ විචලනය වන බොරතෙල් මිල ගණන් සහ ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් තත්ත්වයට පත්වීම තුළින් වරණීය වෙළඳ ප්‍රවේශයන් අහිමි වීමේ අවදානම ප්‍රධාන ගෝලීය අභියෝග ලෙස පවතී. කෙසේ වුවද, වෙළඳ ලිහිල්කරණය සඳහා පහසුකම් සැලසීමට හඳුන්වා දුන් නව උපායමාර්ග සහ නව වෙළඳ ප්‍රතිපත්තිය, 2018-2022 සඳහා වන ජාතික අපනයන ක්‍රමෝපාය, ආයෝජන දිරිගැන්වීම සඳහා වන පෙර දැක්ම වැනි ප්‍රතිසංස්කරණ මගින් විදේශ වෙළඳාම සඳහා පවතින ප්‍රධාන ගැටලු සහ අභියෝග හඳුනාගෙන ඇති අතර මේ සඳහා පිළියම් යෙදීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී. හඳුනාගත් උපායමාර්ග නිසිකලට ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වේ. කෙසේ වුවද, පවතින ගැටලුවල ව්‍යුහාත්මක ස්වරූපය සැලකීමේදී ඊට අදාළ පිළියම් යෙදීමේ කටයුතු සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සඳහා සැලකිය යුතු කාලයක් ගත වනු ඇත. වෙළඳාමට සහ ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ඉහළ නිෂ්පාදන පිරිවැය, අවශ්‍ය ශ්‍රමය හිඟවීම වැනි සැපයුම හා සම්බන්ධ සීමා ඉවත් කිරීම, පර්යේෂණ හා සංවර්ධනය මත පදනම් වූ නවෝත්පාදනයෙන් සහය ලබන්නා වූ අපනයන සංස්කෘතියක් නිර්මාණය

කිරීම සහ ආයතනික රාමුව ක්‍රමවත් කිරීම සඳහා ප්‍රමුඛතාව ලබා දිය යුතුව ඇත. නව නිදහස් වෙළඳ ගිවිසුම් හා ආර්ථික සහයෝගීතාව වැඩිදියුණු කිරීම තුළින් ඉහළ වෙළඳපොළ ප්‍රවේශයක් සඳහා තවදුරටත් ප්‍රයත්න දැරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක තත්ත්වයට උසස් වීම වාසිදායක වන නමුත් එසේ උසස් වීම හා බැඳී පවතින වරණීය වෙළඳ ප්‍රවේශය අහිමි වීම වැනි අවදානම් සඳහා මුහුණ දීමට සූදානම් විය යුතු අතර එම වෙනස්වීම සුමටව සිදු වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග කල්තියා සැලසුම් කළ යුතුව ඇත.

## 5.3 භාණ්ඩ වෙළඳාම, වෙළඳ ශේෂය, වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දිශාව

### 5.3.1 අපනයන ක්‍රියාකාරිත්වය


**2017 වසරේදී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වූ වෙළඳ භාණ්ඩ අපනයන ආදායම 2018 වසර තුළදී ද සිය වර්ධන මාවත අඛණ්ඩව පවත්වා ගැනුණි.** යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී.ප්ලස් පහසුකම නැවත ලබාගැනීම, හිතකර විදේශීය වෙළඳ ප්‍රතිපත්ති සමගින් ශක්තිමත් ආයතනික සහාය ලැබීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම අපනයන ආදායමේ වර්ධනය සඳහා හේතු විය. මේ අනුව, 2018 වසර තුළදී අපනයන ආදායම 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 11,360 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 11,890 ක් දක්වා සියයට 4.7 කින් වර්ධනය විය. 2018 වසර තුළදී අපනයන වර්ධනය වීම සඳහා කාර්මික අපනයන දායක වූ අතර, කෘෂිකාර්මික හා ඛනිජ අපනයන ආදායම පහත වැටුණි.

**2018 වසරේදී කාර්මික අපනයන ආදායම ඉහළ යෑම සඳහා යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. ප්ලස් පහසුකම නැවත ලැබීම විශාල වශයෙන් දායක විය.** සමස්ත අපනයනවලින් සියයට 78 ක් පමණ වූ කාර්මික අපනයන 2018 වසර තුළදී පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 9,258 ක් දක්වා සියයට 8.4 කින් වර්ධනය විය. රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත, ආහාර පාන වර්ග හා දුම්කොළ සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම්වල ඉහළ ක්‍රියාකාරිත්වය මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2017 වසරේ මැයි මාසයේ සිට ප්‍රතිස්ථාපනය කරන ලද යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී. ප්ලස් පහසුකමෙහි යහපත් බලපෑම පිළිබිඹු කරමින් 2018 වසර තුළදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 5,318 ක් දක්වා සියයට 5.7 කින් වර්ධනය විය. යුරෝපා කලාපයේ විශාලතම වෙළඳපොළ වන එක්සත් රාජධානිය වෙතින් වූ ඉල්ලුම පහත වැටුණ ද, ජර්මනිය, ඉතාලිය, නෙදර්ලන්තය සහ ස්වීඩනය වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයනවලින් ලද ආදායම එ.ජ. ඩොලර් මිලියන 2,053 ක් දක්වා සියයට 3.6 කින් වර්ධනය විය. තවද, 2018 වසරේදී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ

5

**5.3 රූප සටහන**


**අපනයන සංයුතිය - 2018**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**5.4 රූප සටහන**

**ජී.එස්.පී./ජී.එස්.පී.ප්ලස් පහසුකම යටතේ යුරෝපා සංගමය වෙත සිදු කළ අපනයන**




මූලය: වාණිජ දෙපාර්තමේන්තුව

ඇඟලුම් අපනයනවලින් ලද ආදායම සියයට 6.0 කින් ද ඉන්දියාව, ජපානය, ඕස්ට්‍රේලියාව සහ මෙක්සිකෝව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙත සිදු කළ ඇඟලුම් අපනයනවලින් ලද ආදායම සියයට 3.5 කින් ද වර්ධනය විය. යුරෝපා වෙළඳපොළ, ඇමෙරිකා එක්සත් ජනපදය, ඉන්දියාව, වියට්නාමය සහ තුර්කිය වෙතින් රෙදිපිළි සහ අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය සඳහා වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේදී මෙම කාණ්ඩවලින් ලද අපනයන ආදායම් පිළිවෙළින් සියයට 26.6 කින් සහ සියයට 10.9 කින් ඉහළ ගියේය. 2018 වසරේදී ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම සියයට 43.2 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය වූ අතර, නැව් සහ ගුවන්යානා සඳහා භාවිතා කරන ඉන්ධන අපනයන පරිමා සහ මිල ගණන් යන දෙකම ඉහළ යෑමෙහි බලපෑම මේ සඳහා හේතු විය. මෙම වසරේ ජාත්‍යන්තර වෙළඳපොළෙහි පැවැති ඉහළ තෙල් මිල ගණන්වලට සමගාමීව නැව් සහ ගුවන්යානා සඳහා භාවිතා කරන ඉන්ධනවල අපනයන මිල ගණන් සියයට 29.4 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රධාන වශයෙන් රබර් ටයර් අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් පෙර වසරට සාපේක්ෂව මෙම වසරේදී රබර් නිෂ්පාදිත අපනයනයෙන් ලද ආදායම එ.ජ.ඩොලර් මිලියන 875 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය විය. තවද, ධාන්‍ය සැකසුම් හැර අනෙකුත් සියලුම උප කාණ්ඩවල පැවති ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2018 වසරේදී ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 462 ක් දක්වා සියයට 17.7 කින් ඉහළ ගියේය. එලෙසම, 2018 වසරේදී යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 17.3 කින් ඉහළ ගිය අතර ඒ සඳහා උප කාණ්ඩ සියල්ලෙහිම පාහේ, විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික උපකරණ සහ පරිවරණීය රැහැන්, විදුලි රැහැන් හා සන්නායක අපනයනවල ඉහළ ක්‍රියාකාරිත්වය හේතු විය. මීට අමතරව, මෙම වසර තුළ කාර්මික අපනයන ඉහළ යෑමට මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ,

**5.3 සංඛ්‍යා සටහන**

**අපනයන සංයුතිය**

| කාණ්ඩය | 2017 | | 2018 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස් වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **2,767.2** | **24.4** | **2,579.3** | **21.7** | **-187.9** | **-6.8** | **-35.5** |
| තේ | 1,529.8 | 13.5 | 1,428.5 | 12.0 | -101.3 | -6.6 | -19.1 |
| රබර් | 38.9 | 0.3 | 31.6 | 0.3 | -7.3 | -18.8 | -1.4 |
| පොල් | 347.9 | 3.1 | 311.0 | 2.6 | -36.9 | -10.6 | -7.0 |
| කුළුබඩු | 406.2 | 3.6 | 360.2 | 3.0 | -46.0 | -11.3 | -8.7 |
| එළවළු | 28.5 | 0.3 | 28.2 | 0.2 | -0.2 | -0.8 | ... |
| සකස් නොකළ දුම්කොළ | 36.5 | 0.3 | 35.6 | 0.3 | -0.9 | -2.5 | -0.2 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 138.7 | 1.2 | 118.4 | 1.0 | -20.3 | -14.7 | -3.8 |
| මුහුදු ආහාර | 240.6 | 2.1 | 265.8 | 2.2 | 25.2 | 10.5 | 4.8 |
| **කාර්මික අපනයන** | **8,541.9** | **75.2** | **9,258.2** | **77.9** | **716.2** | **8.4** | **135.3** |
| රෙදිපිළි හා ඇඟලුම් | 5,031.9 | 44.3 | 5,317.7 | 44.7 | 285.7 | 5.7 | 54.0 |
| රබර් නිෂ්පාදිත | 835.4 | 7.4 | 875.3 | 7.4 | 39.9 | 4.8 | 7.5 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 434.3 | 3.8 | 622.1 | 5.2 | 187.8 | 43.2 | 35.5 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 257.5 | 2.3 | 278.0 | 2.3 | 20.5 | 8.0 | 3.9 |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 392.7 | 3.5 | 462.3 | 3.9 | 69.6 | 17.7 | 13.2 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 370.8 | 3.3 | 434.8 | 3.7 | 64.0 | 17.3 | 12.1 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 48.8 | 0.4 | 31.7 | 0.3 | -17.2 | -35.2 | -3.2 |
| ප්‍රවාහන උපකරණ | 162.3 | 1.4 | 120.3 | 1.0 | -42.0 | -25.9 | -7.9 |
| සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 158.4 | 1.4 | 147.7 | 1.2 | -10.7 | -6.8 | -2.0 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 33.7 | 0.3 | 31.3 | 0.3 | -2.5 | -7.3 | -0.5 |
| අනෙකුත් කාර්මික අපනයන | 816.1 | 7.2 | 937.1 | 7.9 | 121.1 | 14.8 | 22.9 |
| **ඛනිජමය අපනයන** | **34.5** | **0.3** | **34.4** | **0.3** | **-0.1** | **-0.4** | **...** |
| **වර්ග නොකළ අපනයන** | **16.9** | **0.1** | **17.8** | **0.1** | **1.0** | **5.8** | **0.2** |
| **මුළු අපනයන (ආ) (ඇ)** | **11,360.4** | **100.0** | **11,889.6** | **100.0** | **529.2** | **4.7** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **152.46** | | **162.54** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති අපනයන ඇතුළත් නොවේ.
(ඇ) ගළපන ලද
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා වෙනත් ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

මූලලෝහ හා මූලලෝහ නිෂ්පාදිත, රසායනික නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර අපනයනවලින් ලද ආදායම් දායක විය. කෙසේ වුවද, ප්‍රධාන වශයෙන් 2017 වසරේදී සිංගප්පූරුව වෙත නැව් තුනක් අපනයනය කිරීමෙන් වූ පදනම් බලපෑම හේතුවෙන් 2018 වසරේදී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 120 ක් දක්වා සියයට 25.9 කින් පහත වැටුණි. තවද, මෙම වසරේදී සම් භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව සියයට 6.8 කින් පහළ ගිය අතර මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ පිඟන් මැටි නිෂ්පාදිත අපනයන ආදායම පිළිවෙළින් සියයට 35.2 කින් සහ සියයට 7.3 කින් පහත වැටුණි.

**2018 වසරේදී කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය අඩාල විය.** සමස්ත අපනයනවලින් සියයට 22 ක් පමණ වූ කෘෂිකාර්මික අපනයන 2018 වසරේදී පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,579 ක් දක්වා සියයට 6.8 කින් පහත වැටුණු අතර, මුහුදු ආහාර හැර අනෙකුත් උපකාණ්ඩ සියල්ලකම පාහේ වාර්තා වූ දුර්වල ක්‍රියාකාරිත්වය මේ සඳහා හේතු විය. පෙර වසරේදී ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි තේ සඳහා වූ හිතකර මිල ගණන් හේතුවෙන් කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කළ තේ අපනයන ආදායම, 2018 වසරේදී සාමාන්‍ය අපනයන මිල ගණන් සහ තේ අපනයන පරිමා යන දෙකෙහිම පහත වැටීම හේතුවෙන් එ.ජ. ඩොලර් මිලියන 1,428 ක් දක්වා සියයට 6.6 කින් පහත වැටුණි. විශේෂයෙන්ම, අප්‍රිකාව වෙතින් වූ කළු තේ නිෂ්පාදන සහ අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් මුම්බාසා සහ කල්කටා තේ වෙන්දේසිවල ජාත්‍යන්තර තේ මිල ගණන් පහත වැටුණ ද, සීමිත සැපයුම හේතුවෙන් ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික කළු තේ සඳහා වූ මිල ගණන් සාපේක්ෂව ශක්තිමත්ව පැවතුණි. කෙසේ වුවද, 2018 වසරේ පළමු කාර්තුවේදී තේ මිල ගණන්හි ඉහළ යෑමක් දක්නට ලැබුණ ද ඉරානය සහ රුසියාව වෙත වෙළඳ සම්බාධක පැනවීමෙන් පසුව එම රටවල වෙළඳාම සීමාවීම නිසා 2018 වසරේදී තේ කිලෝග්‍රෑමයක් සඳහා වූ සාමාන්‍ය අපනයන මිල 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් 5.29 සිට එ.ජ. ඩොලර් 5.06 ක් දක්වා පහත වැටුණි. වේතන පිළිබඳ සාකච්ඡා හේතුවෙන් වූ වැඩවැරීම් මෙන්ම ඇතැම් මාසවල පැවති අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් තේ නිෂ්පාදනය පහත වැටීම සමග 2018 වසරේදී තේ අපනයන පරිමාව පෙර වසරට සාපේක්ෂව සියයට 2.3 කින් පහළ ගියේය. 2018 වසරේදී වටිනාකම අනුව තුර්කිය ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන ආනයනකරුවා ලෙස අඛණ්ඩව පැවති අතර, රුසියාව, ඉරාකය සහ ඉරානය පිළිවෙළින් ඊළඟ ප්‍රධාන ආනයනකරුවන් වෙමින් එම රටවල් සමස්ත තේ අපනයන ආදායමෙන් සියයට 41 කට පමණ දායක විය. පොල්මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ආදායම වර්ධනය වුවද, පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස පහත වැටීම හේතුවෙන් 2018 වසරේදී පොල් අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 311 ක් දක්වා සියයට 10.6 කින් පහත වැටුණි. අයහපත් කාලගුණික තත්ත්වයේ පසු බලපෑම හේතුවෙන් 2018 වසරේ පළමු භාගයේ දී පොල් නිෂ්පාදනය අඩුවීමත් සමග ප්‍රධාන වශයෙන් දිසිඳි පොල් සහ පොල් තෙල් අපනයන පරිමාව පහත වැටීම හේතුවෙන් 2018 වසරේදී පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම සියයට 21.3 කින් පහත වැටුණි. කෙඳි වර්ග අපනයන ඉහළ යෑම හේතුවෙන් පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන ආදායම සියයට 2.3 කින් ඉහළ ගියේය. තවද, කුරුඳු හැර අනෙකුත් කුළුබඩු වර්ග සියල්ලකම පාහේ වාර්තා වූ දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් 2018 වසරේදී කුළුබඩු අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 360 ක් දක්වා සියයට 11.3 කින් පහත වැටුණි. කරාබුනැටි, ගම්මිරිස් සහ සාදික්කා හා වසාවාසි වැනි බොහෝ කුළුබඩුවල අස්වැන්න අඩුවීමත් සමග අපනයන පරිමාව පහත වැටුණු අතර, ඉහළ අපනයන පරිමාව හේතුවෙන් කුරුඳු අපනයනයෙන් ලද ආදායම ඉහළ ගියේය. තවද, විශේෂයෙන්ම පුවක්, බුලත් සහ පලතුරු ඇතුළුව බොහෝ කාණ්ඩවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 118 ක් දක්වා සියයට 14.7 කින් පහත වැටුණි. මීට අමතරව, 2018 වසරේදී රබර්, එළවළු සහ සකස් නොකළ දුම්කොළ අපනයන ආදායම් ද පහත වැටුණි. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදිත යුරෝපා වෙළඳපොළ වෙත අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීම සහ ජී.එස්.පී. ප්ලස් පහසුකම ප්‍රතිස්ථාපනය කිරීමේ ප්‍රතිලාභ ලබමින් 2018 වසරේදී මුහුදු ආහාර අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 266 ක් දක්වා සියයට 10.5 කින් අඛණ්ඩව ඉහළ ගියේය. මේ අනුව, ප්‍රංශය, ඉතාලිය, ජර්මනිය, ස්පාඤ්ඤය සහ නෙදර්ලන්තය වෙතින් වූ ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේදී යුරෝපා වෙළඳපොළ වෙත සිදු කළ මුහුදු ආහාර අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 92 ක් දක්වා සියයට 37.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

5


**2018 වසරේදී ඛනිජ අපනයන ආදායම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 34 ක් දක්වා සියයට 0.4 කින් සුළු වශයෙන් පහත වැටුණි.** ලෝපස්, ලෝබොර හා අළු අපනයන ආදායමෙහි ඉහළ යෑමක් වාර්තා වුවද, පාෂාණ, ගල් වර්ග හා අගනා ලෝහ වර්ග අපනයන ආදායම පහත වැටීම හේතුවෙන් මෙම වසරේදී ඛනිජ අපනයන ආදායම පහත වැටුණි.

### 5.3.2 ආනයන ක්‍රියාකාරිත්වය

**2018 වසරේ පළමු භාගයේදී සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ වෙළඳ භාණ්ඩ ආනයන වියදම, ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය මගින් ක්‍රියාත්මක කළ සාර්ව විචක්ෂණශීලී ප්‍රතිපත්ති මෙන්ම ශ්‍රී ලංකා රුපියල සාපේක්ෂව තියුණු ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් වසරේ දෙවන භාගයේ දී ක්‍රමයෙන් පහත වැටුණි.** මේ අනුව, 2017 වසරේදී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 20,980 ට සාපේක්ෂව 2018 වසරේදී ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 22,233 ක් දක්වා සියයට 6.0 කින් ඉහළ ගියේය. 2018 වසරේදී ආනයන වර්ධනය සඳහා ඉන්ධන, පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන මෝටර් රථ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ පොහොර ආනයනය සඳහා වූ වියදම් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, ඉන්ධන නොවන ආනයන වියදම ද පෙර වසර හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 18,081 ක් දක්වා සියයට 3.0 කින් ඉහළ ගියේය.

5

**5.5 රූප සටහන**
**ආනයන සංයුතිය - 2018**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2018 වසරේදී ආනයන වියදම ඉහළ යෑම සඳහා සමස්ත ආනයන වියදමෙන් සියයට 56 ක් පමණ වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම, විශාල වශයෙන් දායක විය.** ඒ අනුව, 2018 වසරේදී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 12,488 ක් දක්වා සියයට 9.2 කින් ඉහළ ගියේය. 2018 වසරේදී ඉන්ධන ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,152 ක් දක්වා සියයට 21.1 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදිත සහ බොරතෙල්වල සාමාන්‍ය ආනයන මිල ගණන් කැපී පෙනෙන ලෙස ඉහළ යෑම මෙන්ම එම අයිතමවල ආනයන පරිමා මධ්‍යස්ථ ලෙස ඉහළ යෑම හේතුවිය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ තෙල් මිල ගණන් ඉහළ මට්ටමක පැවතීම පිළිබිඹු කරමින් බොරතෙල් බැරලයක සාමාන්‍ය ආනයන මිල 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් 57.79 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් 76.25 ක් දක්වා සියයට 31.9 කින් ඉහළ ගියේය. මේ අතර, ගල් අඟුරු මගින් බලශක්ති උත්පාදනය කිරීම අඩුවීමත් සමග ගල් අඟුරු ආනයන පරිමාව අඩු වීම හේතුවෙන් 2018 වසරේදී ගල් අඟුරු ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 237 ක් දක්වා සියයට 9.5 කින් පහත වැටුණි. තවද, රෙදිපිළි හා ඇඟලුම් අපනයන සඳහා පවතින ඉහළ ඉල්ලුමට සමගාමීව 2018 වසරේදී රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම සියයට 4.9 කින් ඉහළ ගිය අතර, විශේෂයෙන්ම රෙදි සහ නූල් ඇතුළු උපකාණ්ඩ සියල්ලකම පාහේ ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය. පොහොර සඳහා වූ ආනයන පරිමාව හා සාමාන්‍ය ආනයන මිල ගණන් ඉහළ යෑමේ ඒකාබද්ධ බලපෑම හේතුවෙන් 2018 වසරේදී පොහොර ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2018 වසරේදී පොහොර ආනයන පරිමාව සියයට 116.2 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, ඒ සඳහා 2017 වසරේදී පැවැති අයහපත් කාලගුණික තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික කටයුතු අඩාල වීම තුළින් පොහොර සඳහා වූ ඉල්ලුම අඩු වීමේ පදනම් බලපෑම යම්තාක් දුරකට හේතු වූ අතර 2018 වසරේදී යහපත් කාලගුණික තත්ත්වය සමඟ වී වගා බිම් ප්‍රමාණය ඉහළ යෑම සහ මුදල් ප්‍රදානය කිරීම වෙනුවට පොහොර සහනාධාරය නැවත හඳුන්වාදීම ද හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ පොහොර මිල ගණන් ඉහළ මට්ටමක පැවතීමට සමගාමීව පොහොර සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්ද ඉහළ ගියේය. මීට අමතරව, අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑමට දායක වෙමින් රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික්

**5.4 සංඛ්‍යා සටහන**

**ආනයන සංයුතිය**

| කාණ්ඩය | 2017 | | 2018 (අ) | | වටිනාකමේ වෙනස එ.ජ. ඩොලර් මිලියන | වාර්ෂික වෙනස්වීම % | වෙනස්වීමට වූ දායකත්වය % |
|---|---|---|---|---|---|---|---|
| | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | වටිනාකම එ.ජ. ඩොලර් මිලියන | දායකත්වය % | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **4,502.5** | **21.5** | **4,979.7** | **22.4** | **477.1** | **10.6** | **38.1** |
| ආහාර හා පාන වර්ග | 1,841.1 | 8.8 | 1,606.1 | 7.2 | -235.0 | -12.8 | -18.8 |
| සහල් | 300.9 | 1.4 | 106.8 | 0.5 | -194.1 | -64.5 | -15.5 |
| සීනි හා රසකැවිලි | 258.0 | 1.2 | 249.7 | 1.1 | -8.3 | -3.2 | -0.7 |
| කිරි නිෂ්පාදිත | 315.8 | 1.5 | 332.3 | 1.5 | 16.5 | 5.2 | 1.3 |
| පරිප්පු | 114.4 | 0.5 | 78.6 | 0.4 | -35.8 | -31.3 | -2.9 |
| වෙනත් | 851.9 | 4.1 | 838.7 | 3.8 | -13.2 | -1.5 | -1.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 2,661.5 | 12.7 | 3,373.6 | 15.2 | 712.1 | 26.8 | 56.8 |
| රථවාහන | 772.7 | 3.7 | 1,573.5 | 7.1 | 800.8 | 103.6 | 63.9 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 520.0 | 2.5 | 532.0 | 2.4 | 12.0 | 2.3 | 1.0 |
| ගෘහ උපකරණ | 258.2 | 1.2 | 232.2 | 1.0 | -25.9 | -10.1 | -2.1 |
| රෙදිපිළි හා උපාංග | 369.0 | 1.8 | 310.3 | 1.4 | -58.8 | -15.9 | -4.7 |
| වෙනත් | 741.6 | 3.5 | 725.6 | 3.3 | -16.0 | -2.2 | -1.3 |
| **අන්තර් භාණ්ඩ** | **11,435.8** | **54.5** | **12,488.0** | **56.2** | **1,052.3** | **9.2** | **84.0** |
| ඉන්ධන | 3,427.9 | 16.3 | 4,151.9 | 18.7 | 724.0 | 21.1 | 57.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 2,724.2 | 13.0 | 2,858.5 | 12.9 | 134.3 | 4.9 | 10.7 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 772.4 | 3.7 | 572.7 | 2.6 | -199.7 | -25.9 | -15.9 |
| රසායනික නිෂ්පාදිත | 834.5 | 4.0 | 904.2 | 4.1 | 69.7 | 8.4 | 5.6 |
| තිරිඟු හා ඉරිඟු | 356.6 | 1.7 | 373.5 | 1.7 | 16.9 | 4.7 | 1.3 |
| පොහොර | 102.8 | 0.5 | 261.6 | 1.2 | 158.8 | 154.4 | 12.7 |
| අනෙකුත් අන්තර් භාණ්ඩ | 3,217.3 | 15.3 | 3,365.6 | 15.1 | 148.3 | 4.6 | 11.8 |
| **ආයෝජන භාණ්ඩ** | **4,894.7** | **23.3** | **4,690.4** | **21.1** | **-204.3** | **- 4.2** | **-16.3** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,591.4 | 7.6 | 1,524.5 | 6.9 | - 66.8 | - 4.2 | - 5.3 |
| ප්‍රවාහන උපකරණ | 674.9 | 3.2 | 668.1 | 3.0 | - 6.8 | -1.0 | -0.5 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 2,620.6 | 12.5 | 2,491.6 | 11.2 | -129.0 | - 4.9 | -10.3 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 7.8 | … | 6.1 | … | -1.7 | -22.4 | -0.1 |
| **වර්ග නොකළ ආනයන** | **146.8** | **0.7** | **74.6** | **0.3** | **-72.1** | **- 49.1** | **-5.8** |
| **මුළු ආනයන (ආ) (ඇ)** | **20,979.8** | **100.0** | **22,232.7** | **100.0** | **1,252.9** | **6.0** | **100.0** |
| **වාර්ෂික සාමාන්‍ය විනිමය අනුපාතිකය (ඈ)** | **152.46** | | **162.54** | | | | |

(අ) තාවකාලික
(ආ) ප්‍රති ආනයන ඇතුළත් නොවේ.
(ඇ) ගළපන ලද
(ඈ) විනිමය අනුපාතිකය: එ.ජ. ඩොලරයට රුපියල්

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

5

හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, මූල ලෝහ සහ කඩදාසි, සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.

**ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග වලින් පසුව රත්‍රන් ආනයනය තියුණු ලෙස පහත වැටීම මෙන්ම රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම අඩු වීම 2018 වසරේදී අන්තර් භාණ්ඩ ආනයන වියදම අඩු වීමට දායක විය.** රජය මඟින් රත්‍රන් ආනයනය මත තීරු බද්දක් පැනවීමේ බලපෑම පිළිබිඹු කරමින් රත්‍රන් ආනයනය සියයට 32.5 කින් පහත වැටීම හේතුවෙන් 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග ආනයන වියදම සියයට 25.9 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. 2018 වසරේ පළමු මාස හතර තුළ රත්‍රන් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 437 ක් දක්වා සියයට 126.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඉන්දියාව රත්‍රන් ආනයනය සඳහා සියයට 10 ක තීරු බද්දක් පවත්වාගෙන යෑමත් ශ්‍රී ලංකාව රත්‍රන් ආනයන සඳහා තීරු බදු පනවා නොතිබීමත් හේතුවෙන් ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර රත්‍රන් ආනයනය මත වන තීරු බදු වෙනස්කම් තුළින් අනිසි ලෙස ලාභ ඉපැයීමට තිබූ හැකියාව සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා රජය විසින් 2018 අප්‍රේල් මාසයේදී රත්‍රන් ආනයනය මත සියයට 15 ක තීරු බද්දක් නැවත පනවන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2018 වසරේ මැයි මාසයේ සිට වසරේ ඉතිරි මාස අට තුළදී රත්‍රන් ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1 ක පමණ සුළු අගයක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටුණි. මේ අතර, ප්‍රාථමික ස්වරූපයේ රබර් ආනයනය පහත වැටීම හේතුවෙන් රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම සියයට 6.6 කින් පහත වැටුණු අතර සිමෙන්ති ක්ලින්කර ආනයන වියදම අඩු වීම හේතුවෙන් ඛනිජ නිෂ්පාදිත

ආනයන වියදම සියයට 14.0 කින් පහත වැටුණි. 2018 වසරේදී ආහාර සැකසුම් ආනයන වියදම ද පහත වැටුණි.

**ආහාර හා පාන වර්ග ආනයන වියදම පහත වැටුණද, ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ සඳහා ඉහළ වියදමක් දැරීමට සිදුවීම හේතුවෙන් 2018 වසරේදී සමස්ත ආනයනවලින් සියයට 22 ක් පමණ වූ පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.** මේ අනුව, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 4,503 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 4,980 ක් දක්වා සියයට 10.6 කින් ඉහළ ගියේය. 2018 වසරේදී ආහාර හා පාන වර්ග ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,606 ක් දක්වා සියයට 12.8 කින් පහත වැටුණ අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් සහල් ආනයන වියදම පහත වැටීම හේතු විය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ මිල ගණන්වලට සමගාමීව සහල් සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන් ඉහළ ගියද, වී අස්වැන්න යථා තත්ත්වයට පත්වීමත් සමඟ දේශීය සහල් සැපයුම ඉහළ යෑමෙන් සහල් ආනයන පරිමාව අඩුවීම නිසා සහල් ආනයන වියදම 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 301 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 107 ක් දක්වා සියයට 64.5 කින් කැපී පෙනෙන ලෙස පහත වැටුණි. මේ අනුව, සහල් ආනයන පරිමාව 2017 වසරේදී වාර්තා කළ කිලෝග්‍රෑම් මිලියන 748 සිට 2018 වසරේදී කිලෝග්‍රෑම් මිලියන 249 ක් දක්වා පහත වැටුණි. තවද, පරිප්පු, ළූණු, රනිල කුලයේ එළවළු වර්ග සහ අර්තාපල් වැනි බොහෝ එළවළු වර්ග ආනයනය අඩුවීම හේතුවෙන් 2018 වසරේදී එළවළු ආනයන වියදම සියයට 17.4 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි. එසේම, මුහුදු ආහාර සහ සීනි හා රසකැවිලි ආනයන වියදම ද පිළිවෙළින් සියයට 9.3 කින් සහ සියයට 3.2 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2018 වසරේදී කුළු බඩු, කිරි නිෂ්පාදිත, පාන වර්ග සහ පලතුරු ආනයන වියදම ඉහළ ගියේය.

**5.5 සංඛ්‍යා සටහන**
**ප්‍රධාන ආනයනවල පරිමාවන්**

මෙට්‍රික් ටොන් දහස්

| ශීර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 (අ) |
|---|---|---|---|---|---|
| **සහල්** | **600** | **286** | **30** | **748** | **249** |
| පළමු කාර්තුව | 6 | 176 | 6 | 259 | 203 |
| දෙවන කාර්තුව | 102 | 91 | 9 | 79 | 37 |
| තෙවන කාර්තුව | 145 | 9 | 6 | 160 | 2 |
| සිව්වන කාර්තුව | 348 | 9 | 8 | 250 | 7 |
| **තිරිඟු** | **1,179** | **1,208** | **948** | **1,250** | **1,297** |
| පළමු කාර්තුව | 271 | 242 | 171 | 291 | 412 |
| දෙවන කාර්තුව | 324 | 342 | 326 | 334 | 329 |
| තෙවන කාර්තුව | 291 | 373 | 271 | 359 | 285 |
| සිව්වන කාර්තුව | 292 | 251 | 179 | 265 | 271 |
| **සීනි** | **520** | **624** | **651** | **498** | **645** |
| පළමු කාර්තුව | 131 | 169 | 147 | 108 | 205 |
| දෙවන කාර්තුව | 162 | 161 | 144 | 158 | 166 |
| තෙවන කාර්තුව | 152 | 156 | 179 | 101 | 119 |
| සිව්වන කාර්තුව | 75 | 137 | 181 | 132 | 154 |
| **බොරතෙල් (ආ)** | **1,824** | **1,763** | **1,685** | **1,591** | **1,674** |
| පළමු කාර්තුව | 548 | 369 | 372 | 282 | 283 |
| දෙවන කාර්තුව | 365 | 355 | 456 | 376 | 459 |
| තෙවන කාර්තුව | 462 | 472 | 384 | 464 | 461 |
| සිව්වන කාර්තුව | 449 | 567 | 473 | 469 | 471 |
| **පිරිපහදු කළ ඛනිජ තෙල් (ආ)** | **3,385** | **3,321** | **3,885** | **4,895** | **4,959** |
| පළමු කාර්තුව | 970 | 799 | 830 | 1,275 | 1,382 |
| දෙවන කාර්තුව | 762 | 952 | 1,163 | 1,123 | 1,207 |
| තෙවන කාර්තුව | 1,006 | 744 | 749 | 1,336 | 1,317 |
| සිව්වන කාර්තුව | 647 | 826 | 1,142 | 1,161 | 1,054 |
| **පොහොර** | **765** | **873** | **527** | **399** | **861** |
| පළමු කාර්තුව | 202 | 163 | 139 | 78 | 256 |
| දෙවන කාර්තුව | 190 | 244 | 135 | 73 | 154 |
| තෙවන කාර්තුව | 95 | 189 | 126 | 129 | 225 |
| සිව්වන කාර්තුව | 277 | 277 | 127 | 119 | 226 |

(අ) තාවකාලික
(ආ) ගළපන ලද

මූලයන්: ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**2018 වසරේදී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සඳහා පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයන වියදම ඉහළ යෑම සැලකිය යුතු ලෙස දායක විය.** මේ අනුව, 2018 වසරේදී ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,374 ක් දක්වා සියයට 26.8 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2018 අයවැය මගින් රථවාහන ආනයනය සඳහා වූ බදු ව්‍යුහය සංශෝධනය කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් ප්‍රධාන වශයෙන් සිලින්ඩර ධාරිතාව අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් වාහන ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේ පළමු මාස අට තුළදී පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන ආනයන වියදම සියයට 116.3 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. එමනිසා, රථවාහන ආනයනය ඉහළ යෑම හේතුවෙන් විදේශීය අංශය සහ ප්‍රධාන වශයෙන් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය සැලකිල්ලට ගනිමින් 2018 වසරේ අගෝස්තු මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදය තුළ රථවාහන ආනයනය ඉහළ යෑම සීමා කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග කිහිපයක් හඳුන්වාදෙන ලදී (5.6 සංඛ්‍යා සටහන බලන්න). කෙසේ වුවද, රජයේ සේවකයන්ට සහනදායී පදනම මත රථවාහන ආනයනය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය වෙනස් කිරීම සහ 2018 නොවැම්බර් මාසයේදී 2019 වසර සඳහා වන

**5.6 සංඛ්‍යා සටහන**

**රථ වාහන ආනයනය සීමා කිරීම සඳහා ගනු ලැබූ ප්‍රධාන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග**

| දිනය | | ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගය |
|---|---|---|
| 01.08.2018 | - | සිලින්ඩර ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විදුලි මෝටර් රථ ආනයන මත පනවා තිබූ නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී. |
| 19.09.2018 | - | වාණිජ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථවාහන හැර අනෙකුත් රථවාහන ආනයන සඳහා වාණිජ බැංකුවල ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට 100 ක ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පනවන ලදී. |
| 29.09.2018 | - | සහනදායී පදනම මත නිකුත් කළ බලපත්‍ර මඟින් රථවාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීම තාවකාලිකව අත්හිටුවන ලදී. |
| | | රාජ්‍ය ආයතන සඳහා රථවාහන මිලදී ගැනීම තාවකාලිකව අත්හිටුවන ලදී. |
| 01.10.2018 | - | වාණිජ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථවාහන හැර අනෙකුත් රථවාහන ආනයන සඳහා වාණිජ බැංකුවල ණයවර ලිපි විවෘත කිරීමේ දී පනවා තිබූ ආන්තික තැන්පතු අවශ්‍යතාව සියයට 200 දක්වා ඉහළ දමන ලදී. |
| | | දෙමුහුන් රථවාහනවලට ණය පහසුකම් ලබා දීමේදී වටිනාකම මත අනුපාතය සියයට 70 සිට සියයට 50 දක්වා අඩු කරන ලදී. |
| 26.11.2018 | - | රථවාහන ආනයනය කිරීමේදී විදේශ මුදල් මඟින් ණයවර ලිපි විවෘත කිරීම සඳහා සියයට 100 ක අවම මුදල් ආන්තිකයක් පනවන ලදී. |

සටහන : රථවාහන ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී පනවා තිබූ ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාව 2019 මාර්තු 07 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී.

අයවැයෙන් සිදුවේයැයි අපේක්ෂිත බදු ඉහළ දැමීම හේතුවෙන් මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල ඉක්මන් බලපෑමක් 2018 වසරේ සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාසවල දක්නට නොලැබිණි. එසේ වුවද, මෙම ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල පසු බලපෑම පිළිබිඹු කරමින් 2018 නොවැම්බර් මසදී රථවාහන ආනයන වියදම පහත වැටීම ආරම්භ වූ අතර එය දෙසැම්බර් මාසයේදී ද අඛණ්ඩව පහළ යමින් වසරේ පළමු මාස දහය තුළදී මාසයක් සඳහා වූ සාමාන්‍ය රථවාහන ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 139 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 91 ක් දක්වා පහත වැටුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයන වියදම 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 773 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,574 ක් දක්වා සියයට 103.6 කින් ඉහළ ගියේය. මේ අතර, ආනයන මත වූ පීඩනය තවදුරටත් අඩු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශීතකරණ, රෙදි සෝදන යන්ත්‍ර, ජංගම දුරකතන, රබර් ටයර් සහ සුවඳ විලවුන් වැනි අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය අධෛර්යයවත් කිරීමට ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගන්නා ලදී. මේ අනුව, 2018 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි තෝරාගත් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට 100 ක ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පැනවූ අතර, 2018 ඔක්තෝබර් 11 දින සිට බලපැවැත්වෙන පරිදි එම අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබාදීමේ කොන්දේසි මත ආනයනය කිරීමේදී ද ඉන්වොයිසියේ වටිනාකමින් සියයට 100 ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පනවන ලදී. එසේම 2018 ඔක්තෝබර් මස 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි එම තෝරාගත් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ පෙර ගෙවීම් (මුදල් අත්තිකාරම්) ක්‍රමය යටතේ ආනයනය කිරීම සඳහා විදේශ විනිමය නිකුත් කිරීම තහනම් කරමින් බලයලත් අලෙවි නියෝජිතයින්ට නියෝග පැනවූ අතර 2018 නොවැම්බර් 26 දින සිට බලපැවැත්වෙන පරිදි විදේශ විනිමය යොදා ගනිමින් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීම සඳහා ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට 100 ක අවම තැන්පතු අවශ්‍යතාවයක් පනවන ලදී. ඉන්පසුව 2019 මාර්තු 07 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීමට ණයවර ලිපි විවෘත කිරීමේදී පනවා තිබූ ආන්තික තැන්පතු අවශ්‍යතාව ඉවත් කරන ලද අතර ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබාදීමේ කොන්දේසි මත ආනයනය කිරීමේදී පනවා තිබූ ආන්තික තැන්පතු අවශ්‍යතාව 2019 මාර්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි ඉවත් කරන ලදී. 2018 වසරේදී රෙදිපිළි හා උපාංග සහ ගෘහ හා දැව භාණ්ඩ ආනයන වියදම පිළිවෙළින් සියයට 15.9 කින් සහ සියයට 9.0 කින් පහත වැටුණි. කෙසේ වුවද, 2018 වසරේදී බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම ඉහළ ගියේය.

**සියලුම උප කාණ්ඩවල ආනයන අඩුවීම පිළිබිඹු කරමින් 2018 වසරේදී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහත වැටුණි.** සමස්ත ආනයනවලින් සියයට 21 ක් පමණ වූ ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 4,895 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර්

මිලියන 4,690 ක් දක්වා සියයට 4.2 කින් පහත වැටුණි. ඉංජිනේරු උපකරණ, විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ, මුද්‍රණ යන්ත්‍ර, වෛද්‍ය හා රසායනාගාර උපකරණ සහ ඉලෙක්ට්‍රොනික උපකරණ ආනයන අඩුවීම හේතුවෙන් 2018 වසරේදී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම පෙර වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 2,492 ක් දක්වා සියයට 4.9 කින් පහත වැටුණි. තවද, සිමෙන්ති, යකඩ, වානේ හා ඒ ආශ්‍රිත උපාංග සහ ඛනිජ නිෂ්පාදිත ආනයන අඩු වීම හේතුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,525 ක් දක්වා සියයට 4.2 කින් පහත වැටුණි. ප්‍රවාහන උපකරණ ආනයන වියදම ද සියයට 1.0 කින් පහත වැටුණු අතර ලොරි, බස් රථ, වැන්රථ, කෘෂිකාර්මික කටයුතු සඳහා භාවිතා කරන ට්‍රැක්ටර්, ටැංකි සහ බවුසර වැනි වාණිජමය කටයුතු සඳහා භාවිතා කරන වාහන ආනයනය පහළ යෑම මේ සඳහා හේතු විය.

### 5.3.3 වෙළඳ ශේෂය


**ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය විසින් හඳුන්වා දුන් විචක්ෂණශීලී ප්‍රතිපත්තිවල බලපෑම පිළිබිඹු කරමින් වසර අවසානය වන විට වර්ධන වේගය අඩු වුවද සමස්ථයක් ලෙස 2018 වසරේදී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය.** රත්‍රන්, ඉන්ධන සහ පෞද්ගලික භාවිතය සඳහා ගනු ලබන රථවාහන ආනයන වියදම ඉහළ යෑමත් අපනයන ක්‍රියාකාරිත්වය මධ්‍යස්ථ මට්ටමක පැවතීමත් හේතුවෙන් වසරේ පළමු භාගයේදී වෙළඳ හිඟය කැපී පෙනෙන ලෙස පුළුල් විය. කෙසේ වුවද, ශ්‍රී ලංකා රුපියල සැලකිය යුතු ලෙස අවප්‍රමාණය වීමත් 2018 වසරේ අප්‍රේල් මාසයේ සිට නොවැම්බර් මාසය දක්වා කාලපරිච්ඡේදයේදී ආනයන වියදම අඩු කිරීම සඳහා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගත් හේතුවෙන් වසරේ දෙවැනි භාගයේදී වෙළඳ හිඟය පුළුල් වීම මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වෙළඳ හිඟය 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 9,619 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 10,343 ක් දක්වා පුළුල් විය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වෙළඳ හිඟය 2017 වසරේදී වාර්තා කළ සියයට 10.9 සිට 2018 වසරේදී සියයට 11.6 දක්වා ඉහළ ගියේය.

### 5.3.4 වෙළඳ මිල අනුපාතය

**ශ්‍රී ලංකාවේ අපනයන මිල ගණන් සහ ආනයන මිල ගණන් අතර අනුපාතය පිළිබිඹු කරන වෙළඳ මිල අනුපාතය, 2018 වසරේදී බොහෝදුරට නොවෙනස්ව පැවතුණි.** මෙම වසර තුළදී අපනයන මිල දර්ශකය දර්ශකාංක 100.4 ක් දක්වා සියයට 4.2 කින් ඉහළ ගිය අතර, ආනයන මිල දර්ශකය දර්ශකාංක 95.1 ක් දක්වා සියයට 4.1 කින් ඉහළ ගියේය. මෙම ප්‍රවණතා සමඟ 2018 වසරේදී වෙළඳ මිල අනුපාතය 2017 වසරේදී පැවති දර්ශකාංක 105.5 ක සිට දර්ශකාංක 105.6 ක් දක්වා සුළු වශයෙන් වර්ධනය විය.


**කාර්මික අපනයනවල මිල ගණන් ඉහළ යෑම පිළිබිඹු කරමින් සමස්ත අපනයන මිල දර්ශකය ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර වෙළඳපොළෙහි ඉහළ තෙල් මිල ගණන් සමඟ ඛනිජ තෙල් නිෂ්පාදිත සඳහා වූ අපනයන මිල දර්ශකය සියයට 30.4 කින් ඉහළ යෑම හේතුවෙන් මෙම වසරේදී කාර්මික අපනයන සඳහා වූ මිල දර්ශකය සියයට 6.7 කින් ඉහළ ගියේය. තවද, 2018 වසරේදී රෙදිපිළි හා ඇඟලුම් සහ මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ සඳහා වූ අපනයන මිල දර්ශක පිළිවෙළින් සියයට 3.6 කින් සහ සියයට 25.2 කින් ඉහළ ගියේය. මීට අමතරව, මෙම

**5.6 රූප සටහන**
**අපනයන, ආනයන සහ වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් බිලියන)**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**5.7 රූප සටහන**
**වෙළඳ මිල අනුපාතය සහ වෙළඳ දර්ශක**




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**5.7 සංඛ්‍යා සටහන**

**වෙළඳ දර්ශක (අ)**

2010 = 100

| කාණ්ඩය | වටිනාකම් දර්ශකය | | | පරිමා දර්ශකය | | | ඒකක වටිනාකම් දර්ශකය | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2017 | 2018 (ආ) | වාර්ෂික වෙනස්වීම% | 2017 | 2018 (ආ) | වාර්ෂික වෙනස්වීම% | 2017 | 2018 (ආ) | වාර්ෂික වෙනස්වීම% |
| අපනයන | | | | | | | | | |
| **කෘෂිකාර්මික අපනයන** | **120.0** | **111.9** | **-6.8** | **96.5** | **92.6** | **- 4.0** | **124.3** | **120.8** | **-2.9** |
| තේ | 106.2 | 99.2 | -6.6 | 87.4 | 85.5 | -2.2 | 121.6 | 116.0 | -4.6 |
| රබර් | 22.5 | 18.2 | -18.8 | 31.4 | 26.7 | -15.1 | 71.6 | 68.4 | -4.4 |
| පොල් | 210.0 | 187.8 | -10.6 | 154.5 | 132.8 | -14.0 | 136.0 | 141.4 | 4.0 |
| කුළුබඩු | 196.1 | 173.9 | -11.3 | 132.2 | 120.5 | - 8.9 | 148.3 | 144.3 | -2.7 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 194.2 | 165.7 | -14.7 | 169.8 | 162.0 | - 4.6 | 114.4 | 102.3 | -10.6 |
| **කාර්මික අපනයන** | **140.2** | **152.0** | **8.4** | **156.3** | **158.7** | **1.5** | **89.7** | **95.7** | **6.7** |
| රෙදිපිළි හා ඇඟලුම් | 150.0 | 158.6 | 5.7 | 129.8 | 132.4 | 2.0 | 115.6 | 119.8 | 3.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 165.0 | 236.3 | 43.2 | 228.5 | 251.1 | 9.9 | 72.2 | 94.1 | 30.4 |
| රබර් නිෂ්පාදිත | 150.1 | 157.2 | 4.8 | 109.4 | 111.4 | 1.8 | 137.2 | 141.1 | 2.9 |
| **ඛනිජමය අපනයන** | **142.4** | **141.8** | **-0.4** | **105.6** | **99.3** | **- 5.9** | **134.8** | **142.8** | **5.9** |
| **මුළු අපනයන** | **131.8** | **137.9** | **4.7** | **136.7** | **137.3** | **0.5** | **96.4** | **100.4** | **4.2** |
| ආනයන | | | | | | | | | |
| **පාරිභෝගික භාණ්ඩ** | **182.0** | **201.3** | **10.6** | **167.4** | **183.4** | **9.6** | **108.7** | **109.7** | **0.9** |
| ආහාර හා පාන වර්ග | 139.2 | 121.4 | -12.8 | 146.7 | 129.5 | -11.8 | 94.8 | 93.8 | -1.1 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 231.1 | 293.0 | 26.8 | 191.0 | 245.3 | 28.4 | 121.0 | 119.4 | -1.3 |
| **අන්තර් භාණ්ඩ** | **142.1** | **155.2** | **9.2** | **158.6** | **162.2** | **2.3** | **89.6** | **95.6** | **6.8** |
| ඉන්ධන | 112.7 | 136.5 | 21.1 | 150.7 | 152.5 | 1.2 | 74.8 | 89.5 | 19.7 |
| පොහොර | 42.8 | 108.9 | 154.4 | 53.7 | 136.0 | 153.3 | 79.7 | 80.1 | 0.4 |
| රසායනික නිෂ්පාදිත | 160.5 | 173.9 | 8.4 | 161.6 | 165.2 | 2.2 | 99.3 | 105.3 | 6.0 |
| තිරිඟු සහ ඉරිඟු | 134.4 | 140.7 | 4.7 | 134.0 | 134.2 | 0.2 | 100.3 | 104.8 | 4.5 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 150.6 | 158.0 | 4.9 | 137.6 | 144.3 | 4.9 | 109.4 | 109.5 | 0.1 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 149.6 | 164.9 | 10.2 | 160.5 | 166.9 | 4.0 | 93.2 | 98.8 | 6.0 |
| දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ | 204.6 | 151.7 | -25.9 | 232.2 | 169.1 | -27.2 | 88.1 | 89.7 | 1.8 |
| **ආයෝජන භාණ්ඩ** | **177.7** | **170.2** | **-4.2** | **208.7** | **208.2** | **-0.3** | **85.1** | **81.8** | **-3.9** |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 193.7 | 185.5 | -4.2 | 220.1 | 212.1 | -3.7 | 88.0 | 87.5 | -0.6 |
| ප්‍රවාහන උපකරණ | 113.9 | 112.8 | -1.0 | 112.8 | 109.3 | -3.1 | 101.0 | 103.1 | 2.2 |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 195.9 | 186.3 | -4.9 | 244.2 | 249.6 | 2.2 | 80.2 | 74.6 | -7.0 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 234.1 | 181.7 | -22.4 | 224.6 | 181.9 | -19.0 | 104.2 | 99.9 | - 4.2 |
| **මුළු ආනයන** | **156.5** | **165.8** | **6.0** | **171.3** | **174.3** | **1.8** | **91.3** | **95.1** | **4.1** |
| **වෙළඳ මිල අනුපාතය** | | | | | | | **105.5** | **105.6** | **0.02** |

(අ) එ.ජ. ඩොලර් වටිනාකම අනුව
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කාලපරිච්ඡේදය තුළ රසායනික නිෂ්පාදිත, පිඟන් මැටි නිෂ්පාදිත, රබර් නිෂ්පාදිත සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සඳහා වූ අපනයන මිල දර්ශක ද ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 වසරේදී කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ප්‍රවාහන උපකරණ, මූල ලෝහ හා මූල ලෝහ ආශ්‍රිත නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ සඳහා වූ මිල දර්ශක පහත වැටුණි. මේ අතර, තේ, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත, රබර් සහ කුළුබඩු වැනි බොහෝ කාණ්ඩවල මිල ගණන් පහත වැටීම හේතුවෙන් 2018 වසරේදී කෘෂිකාර්මික අපනයන සඳහා වූ මිල දර්ශකය සියයට 2.9 කින් පහත වැටුණි. කෙසේ වුවද, මෙම වසරේදී පොල්, මුහුදු ආහාර සහ සකස් නොකළ දුම්කොළ සඳහා වූ අපනයන මිල දර්ශක ඉහළ ගියේය.

**ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ සඳහා පැවති ඉහළ මිල ගණන් ද පාරිභෝගික භාණ්ඩ සඳහා මිල ගණන් සුළු වශයෙන් ඉහළ යෑම ද හේතුවෙන් 2018 වසරේදී සමස්ත ආනයන මිල දර්ශකය ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන් ඉන්ධන සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 19.7 ක ඉහළ යෑමක් වාර්තා කිරීම හේතුවෙන් අන්තර් භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 6.8 කින් ඉහළ ගියේය. තවද, 2018 වසරේදී කඩදාසි හා සන කඩදාසි සඳහා වූ ආනයන මිල දර්ශකය සියයට 6.8 කින් ඉහළ ගිය අතර, රසායනික නිෂ්පාදිත සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත

සඳහා වූ ආනයන මිල දර්ශක දෙකම සියයට 6.0 ක වේගයකින් ඉහළ ගියේය. මෙම වසරේදී තිරිඟු හා ඉරිඟු, රථවාහන හා යන්ත්‍ර සූත්‍ර කොටස්, දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ සහ පොහොර සඳහා වූ ආනයන මිල දර්ශක ද ඉහළ ගියේය. මේ අතර, 2018 වසරේදී අන්තර් භාණ්ඩ යටතේ වර්ග කර ඇති ආහාර සැකසුම්, කෘෂිකාර්මික යෙදවුම්, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ සකස් නොකළ දුම්කොළ සඳහා වූ ආනයන මිල දර්ශක පහත වැටුණි. 2018 වසරේදී පාරිභෝගික භාණ්ඩ සඳහා වූ මිල දර්ශකය පෙර වසරට සාපේක්ෂව සියයට 0.9 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. රථවාහන, රෙදිපිළි හා උපාංග, මුද්‍රිත ද්‍රව්‍ය හා ලිපි ද්‍රව්‍ය, මුහුදු ආහාර, පාන වර්ග සහ ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සඳහා වූ මිල ගණන් ඉහළ ගිය අතර ගෘහ උපකරණ, සීනි හා රසකැවිලි, එළවළු, කුළුබඩු, පලතුරු සහ කිරි නිෂ්පාදිත සඳහා වූ ආනයන මිල දර්ශක පහත වැටුණි. කෙසේ වුවද, ප්‍රවාහන උපකරණ සඳහා වූ මිල දර්ශකය ඉහළ ගිය ද, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය සඳහා වූ මිල ගණන් පහත වැටීම පිළිබිඹු කරමින් 2018 වසරේදී ආයෝජන භාණ්ඩ සඳහා වූ ආනයන මිල දර්ශකය පහත වැටුණි.

### 5.3.5 වෙළඳ දිශාව


**2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී ද ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් බොහෝදුරට නොවෙනස්ව පැවතිණි.** ඉන්දියාව 2018 වසරේදී ද ශ්‍රී ලංකාවේ ප්‍රධානතම වෙළඳ හවුල්කරුවා වූ අතර ඉන් අනතුරුව චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය පැවතුණි. 2017 වසරේදී මෙන්ම 2018 වසරේදී ද ශ්‍රී ලංකාව සමඟ ඉන්දියාව සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 5 ඉක්ම වූ අතර චීනය සහ ඇමෙරිකා එක්සත් ජනපදය සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය පිළිවෙළින් එ.ජ. ඩොලර් බිලියන 4 සහ එ.ජ. ඩොලර් බිලියන 3 ඉක්මවමින් එම රටවල් තුන සමස්ත විදේශීය වෙළඳාම සඳහා පිළිවෙළින් සියයට 14.7 කින්, සියයට 12.8 කින් සහ සියයට 10.6 කින් දායක විය. මීට අමතරව, 2018 වසරේදී එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය, සිංගප්පූරුව, එක්සත් රාජධානිය සහ ජර්මනිය ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් වූ අතර ඒ එක් එක් රට සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවීය. කෙසේ වුවද, 2018 වසරේදී ඉන්දියාව වෙතින් වූ ආනයනවල පහළ යෑම හේතුවෙන් ඉන්දියාව සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු පහත වැටුණ අතර, සිංගප්පූරුව වෙත සිදු කළ අපනයන සැලකිය යුතු ලෙස පහළ යෑම හේතුවෙන් සිංගප්පූරුව සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු පහත වැටුණි. ඊට වෙනස්ව යමින් පෙර වසර හා සැසඳීමේදී චීනය, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය, එක්සත් රාජධානිය සහ ජර්මනිය යන රටවල් සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු වසර තුළදී වර්ධනය විය. ශ්‍රී ලංකාවේ අපනයන ගමනාන්ත සැලකීමේදී සංවර්ධිත රටවල් ප්‍රධාන වශයෙන් ඇමෙරිකා එක්සත් ජනපදය සහ එක්සත් රාජධානිය අඛණ්ඩව විශාලම දායකත්වය ලබාදී ඇති අතර ශ්‍රී ලංකාවේ ආනයන ප්‍රභව සැලකීමේදී ඉන්දියාව සහ චීනය මූලික කොටගත් ආසියාතික රටවල් ප්‍රමුඛ ස්ථානය ගෙන ඇත.

**මුළු අපනයනවලින් සියයට 25.9 ක් වාර්තා කරමින් ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන ගමනාන්තය ලෙස තම ස්ථානයේ තවදුරටත් රැඳී සිටි අතර, අනතුරුව එක්සත් රාජධානිය (සියයට 8.2) සහ ඉන්දියාව (සියයට 6.5) පැවතිණි.** ඇමෙරිකා එක්සත් ජනපදය වෙත 2018 වසරේදී සිදු කළ අපනයනවලින් ලද ආදායම පසුගිය වසරට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 3,085 ක් දක්වා සියයට 6.0 කින් ඉහළ ගිය අතර ඇමෙරිකා එක්සත් ජනපදය වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 85 ක් පමණ වන ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය. 2018 වසරේදී මුළු ඇඟලුම් අපනයනවලින් සියයට 46 කට පමණ දායක වෙමින් ඇමෙරිකා එක්සත් ජනපදය ශ්‍රී ලංකාවේ ප්‍රධාන තනි ඇඟලුම් අපනයන ගමනාන්තය ලෙස තවදුරටත් පැවතුණි. වසර තුළදී ඇමෙරිකා එක්සත් ජනපදය වෙත අපනයනය කළ ඇඟලුම්, රබර් නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, ආහාර පාන වර්ග හා දුම්කොළ, තේ සහ රසායනික නිෂ්පාදිත ඉහළ ගිය අතර මුහුදු ආහාර, කුළුබඩු සහ පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත පහත වැටුණි. දෙවන විශාලතම අපනයන ගමනාන්තය වන එක්සත් රාජධානිය වෙත සිදු කළ අපනයනවලින් ලද ආදායම 2018 වසරේදී සියයට 5.4 කින් පහත වැටුණු අතර එරටට සිදු කළ ඇඟලුම්, රබර් නිෂ්පාදිත, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් සහ තේ අපනයන පහත වැටීම මේ සඳහා හේතු විය. කෙසේ වුවද, 2018 වසරේදී එක්සත් රාජධානිය වෙත සිදු කළ රෙදිපිළි සහ අනෙකුත් නිම කළ රෙදිපිළි ද්‍රව්‍ය, ආහාර පාන වර්ග හා දුම්කොළ, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත අපනයන වර්ධනය විය. එක්සත් රාජධානියට 2018 වසරේදී කරන ලද මුළු අපනයනවලින් සියයට 75 ක් පමණ ඇඟලුම් වන අතර එය ශ්‍රී ලංකාවේ සමස්ත ඇඟලුම්

අපනයනයෙන් සියයට 15 ක් පමණ විය. ශ්‍රී ලංකාවේ තුන්වන විශාලතම ගැනුම්කරු වන ඉන්දියාව වෙත සිදු කළ මුළු අපනයන 2017 වසරේදී වූ එ.ජ. ඩොලර් මිලියන 691 හා සැසඳීමේදී එ.ජ. ඩොලර් මිලියන 777 ක් දක්වා වර්ධනය වූ අතර සත්ත්ව ආහාර, රෙදිපිළි හා ඇඟලුම්, මූල ලෝහ හා මූල ලෝහ නිෂ්පාදිත, යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ආහාර පාන වර්ග හා දුම්කොළ අපනයනවලින් ලද ඉහළ ආදායම් මේ සඳහා හේතු විය. කෙසේ වුවද, 2018 වසරේදී ඉන්දියාවට අපනයනය කළ කුළු බඩු, දැව හා කඩදාසි නිෂ්පාදිත, ප්‍රවාහන උපකරණ සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත පහත වැටුණි. මේ අතර මුළු අපනයනවලින් සියයට 5.2 කට දායකත්වය දරන ජර්මනිය වෙත සිදු කළ අපනයන 2018 වසරේදී සියයට 13.7 කින් ඉහළ ගියේය. ජර්මනියට සිදු කළ අපනයනවලින් සියයට 66 කින් පමණ සමන්විත වන ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ 2018 වසරේදී ජර්මනිය වෙත සිදු කළ අපනයනවලින් ලද ආදායම ඉහළ යෑම කෙරෙහි විශාල වශයෙන් දායක විය. ඉතාලිය වෙත සිදු කළ අපනයන 2018 වසරේදී සියයට 9.1 කින් ඉහළ ගිය අතර ඉතාලිය වෙත සිදු කළ මුළු අපනයන වලින් සියයට 92 කට පමණ දායකත්වය දරන ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ මුහුදු ආහාර අපනයන ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කලාපීය වෙළඳපොළ වන යුරෝපා සංගමය වෙත 2018 වසරේදී සිදු කළ අපනයන මුළු අපනයනවලින් සියයට 29 ක් පමණ වූ අතර එම කලාපයට සිදු කළ අපනයනවලින් ලද ආදායම එ.ජ. ඩොලර් මිලියන 3,474 ක් දක්වා සියයට 5.3 කින් වර්ධනය විය. යුරෝපා සංගමය වෙත සිදු කළ මුළු අපනයනවලින් සියයට 76 ක පමණ වන ඇඟලුම්, රබර් නිෂ්පාදිත, ආහාර පාන වර්ග හා දුම්කොළ සහ මුහුදු ආහාර අපනයනයෙන් ලද ඉහළ ආදායම මෙම වර්ධනය සඳහා විශාල වශයෙන් දායක වී ඇති අතර යුරෝපා සංගමය මගින් ලබාදෙන ජී.එස්.පී ප්ලස් පහසුකම නැවත ලබාගැනීම සහ යුරෝපා වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාවේ මත්ස්‍ය නිෂ්පාදිත අපනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම ඉවත් කිරීමේ යහපත් බලපෑම මින් පිළිබිඹු විය. 2018 වසරේදී මැද පෙරදිග සහ රුසියාව ශ්‍රී ලංකාවේ තේ සඳහා ප්‍රධාන අපනයන ගමනාන්ත ලෙස පැවතුණි. මෙම රටවල් වෙත සිදු කළ තේ අපනයනවල පහළ යෑමක් වාර්තා වුවද, මෙම රටවල් මුළු තේ අපනයන ආදායමෙන් පිළිවෙළින් සියයට 43.7 කට හා සියයට 10.8 කට දායක විය.


**5.8 රූප සටහන**

**අපනයන වෙළඳ දිශාව**




**5.9 රූප සටහන**

**ආනයන වෙළඳ දිශාව**




5

**ඉන්දියාවෙන් සිදු කළ ආනයන මුළු ආනයන වියදමේ ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී පැවති සියයට 21.6 ට සාපේක්ෂව 2018 වසරේදී සියයට 19.0 දක්වා පහළ ගියද ඉන්දියාව තවදුරටත් ප්‍රධාන ආනයන මූලාශ්‍රය ලෙස පැවතිණි.** ඉන්දියාව වෙතින් සිදු කළ ආනයන සඳහා වූ වියදම 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 4,231 ක් දක්වා සියයට 6.5 කින් පහත වැටුණු අතර ඉන්දියාව වෙතින් සිදු කළ මුළු ආනයනවලින් සියයට 44 ක් පමණ වන ඛනිජ තෙල් නිෂ්පාදිත, ගොඩනැගිලි ද්‍රව්‍ය, රථ වාහන, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයනය පහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ශ්‍රී ලංකාව සිදු කළ මුළු ආනයනවලින් පිළිවෙළින් සියයට 18.5 කට සහ සියයට 8.3 කට දායක වෙමින් චීනය හා එක්සත් අරාබි එමීර් රාජ්‍යය දෙවන හා තුන්වන ප්‍රධාන ආනයන මූලාශ්‍ර ලෙස පැවතිණි. චීනය සමඟ සිදු කළ ආනයනවලින් සියයට 61 ක් පමණ වන රෙදිපිළි හා රෙදිපිළි උපාංග, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය එම රට සමඟ සිදුකළ ප්‍රධාන ආනයන වූ අතර එක්සත් අරාබි එමීර් රාජ්‍යය වෙතින් සිදු කළ මුළු ආනයනවලින් සියයට 87 ක් වන ඛනිජ තෙල් නිෂ්පාදිත සහ දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ එම රටෙන් වූ ප්‍රධාන ආනයන විය. ජපානය සහ සිංගප්පූරුව හතරවන හා පස්වන විශාලතම ආනයන මූලාශ්‍ර ලෙස පැවති අතර එම රටවල් මුළු ආනයනවලින් පිළිවෙළින් සියයට 7.1 කට සහ සියයට 6.2 කට දායක විය. ප්‍රධාන වශයෙන්ම, රථ වාහන ආනයනය සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, 2018 වසරේදී ජපානය වෙතින් සිදු කළ ආනයන එ.ජ. ඩොලර් මිලියන 1,585 ක් දක්වා සියයට 52.6 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර 2017 වසරේදී මුළු ආනයනවලින් සියයට 4.9 ක් වූ ජපානය සමඟ සිදු කළ ආනයන 2018 වසරේදී සියයට 7.1 ක් දක්වා ඉහළ ගියේය. ජපානයෙන් ආනයනය කළ රථ වාහන සඳහා වූ වියදම 2018 වසරේදී ජපානය සමඟ සිදු කළ ආනයනවලින් සියයට 62 ක් පමණ වූ අතර ශ්‍රී ලංකාව ආනයනය කළ රථ වාහනවලින් සියයට 62.4 ක් ජපානයෙන් ආනයනය කර ඇත. මේ අතර, ප්‍රධාන වශයෙන්ම ඛනිජ තෙල් නිෂ්පාදිත ආනයන ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේදී සිංගප්පූරුව සමඟ සිදු කළ ආනයන සඳහා වූ වියදම සියයට 1.5 කින් සුළු වශයෙන් ඉහළ ගියේය. දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ රසායනික නිෂ්පාදිත 2018 වසරේදී සිංගප්පූරුවෙන් සිදු කළ අනෙකුත් ප්‍රධාන ආනයන අයිතම වේ. කෙසේ වුවද, වසර තුළදී සිංගප්පූරුවෙන් ආනයනය කළ දියමන්ති, අගනා ගල් වර්ග හා ලෝහ වර්ග, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ රසායනික නිෂ්පාදිත පහත වැටුණි.

## 5.4 ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

### 5.4.1 සේවා වෙළඳාම

**2018 වසරේදී සේවා වෙළඳාම කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කරමින් විදේශීය ජංගම ගිණුම සඳහා දායක විය.** 2018 වසරේදී සංචාරක ඉපැයීම් ශක්තිමත් වර්ධනයක් වාර්තා කළ අතර, ප්‍රවාහන සහ පරිගණක සේවාවන්ද කැපී පෙනෙන ලෙස වර්ධනය විය. මෙම වර්ධනයන් පිළිබිඹු කරමින්, සේවා අපනයන ආදායම 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 7,724 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 8,374 ක් දක්වා සියයට 8.4 කින් ඉහළ ගියේය. මේ අතර, භාණ්ඩ ප්‍රවාහන සේවා, මගී ගාස්තු සහ පෞද්ගලික විදේශීය ගමන් යනාදී සේවා සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම හේතුවෙන් වසර තුළදී සේවා ගිණුමෙහි වූ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 4,608 ක් දක්වා සියයට 4.2 කින් ඉහළ ගියේය. මේ අනුව, සේවා ගිණුමේ අතිරික්තය 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 3,302 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 3,766 ක් දක්වා වර්ධනය විය.

#### ප්‍රවාහන සේවා

**2018 වසරේදී ප්‍රවාහන සේවා අංශයේ අතිරික්තය වර්ධනය වීම, සේවා ගිණුම ශක්තිමත් කිරීමට බෙහෙවින් දායක විය.** මගී ගාස්තු, නැව් කුලී සහ වරාය සහ ගුවන්තොටුපොළ ආශ්‍රිත ක්‍රියාකාරකම්වලින් වූ ලැබීම්වලින් සමන්විත වන ප්‍රවාහන සේවා වෙත වූ දළ ලැබීම් වසර තුළදී එ.ජ. ඩොලර් මිලියන 2,486 ක් දක්වා සියයට 6.2 ක වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, දේශීය ගුවන් සේවා විසින් විදේශයන්ට සිදු කළ ගෙවීම් ඉහළ යෑම සහ ශ්‍රී ලාංකික ආනයනකරුවන් අනේවාසික නැව් සමාගම් වෙත සිදු කළ ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේදී ප්‍රවාහන සේවා මත වූ ගෙවීම් එ.ජ. ඩොලර් මිලියන 1,737 ක් දක්වා සියයට 2.9 කින් ඉහළ ගියේය. ඒ අනුව, ප්‍රවාහන අංශය මත වූ ශුද්ධ ලැබීම් 2017 වසරේ එ.ජ. ඩොලර් මිලියන 652 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 750 ක් දක්වා ඉහළ ගියේය.

**2018 වසර තුළදී මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් ඉහළ ගියේය.** මගී ගාස්තු ආශ්‍රිත ලැබීම් මෙසේ ඉහළ යාම සඳහා හේතු ලෙස ශ්‍රී ලංකාවට පැමිණෙන මගීන් සංඛ්‍යාව වැඩි වීම සහ ගුවන් ගමන් ගාස්තු ඉහළ නැංවීම දැක්විය හැකිය. 2018 වසරේදී මගී ගාස්තු මගින් වූ ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 1,227 ක් දක්වා සියයට 5.9 කින් ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා, ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් කාර්යක්ෂමව සහ කාලීනව ගුවන්

### 5.8 සංඛ්‍යා සටහන
### ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2017 (අ) | | | 2018 (ආ) | | |
|---|---|---|---|---|---|---|
| | බැර | හර | ශුද්ධ | බැර | හර | ශුද්ධ |
| **භාණ්ඩ හා සේවා** | **19,084** | **25,401** | **-6,317** | **20,264** | **26,841** | **-6,577** |
| **භාණ්ඩ** | **11,360** | **20,980** | **-9,619** | **11,890** | **22,233** | **-10,343** |
| වෙළඳ භාණ්ඩ | 11,360 | 20,330 | -8,970 | 11,890 | 21,794 | -9,904 |
| මූල්‍ය නොවන රත්‍රන් | - | 650 | -650 | - | 439 | -439 |
| **සේවා** | **7,724** | **4,421** | **3,302** | **8,374** | **4,608** | **3,766** |
| ප්‍රවාහන | 2,340 | 1,688 | 652 | 2,486 | 1,737 | 750 |
| මුහුදු ප්‍රවාහන | 1,064 | 790 | 274 | 1,134 | 819 | 315 |
| නැව් කුලී | 1,064 | 790 | 274 | 1,134 | 819 | 315 |
| ගුවන් ප්‍රවාහන | 1,277 | 898 | 379 | 1,353 | 918 | 435 |
| මගී ගාස්තු | 1,158 | 810 | 348 | 1,227 | 827 | 400 |
| ගුවන් කුලී | 118 | 88 | 30 | 126 | 91 | 35 |
| සංචාරක (ඇ) | 3,925 | 1,599 | 2,326 | 4,381 | 1,660 | 2,721 |
| ඉදිකිරීම් | 69 | 32 | 37 | 65 | 33 | 32 |
| රක්ෂණ සහ විශ්‍රාම වැටුප් | 123 | 94 | 29 | 130 | 97 | 33 |
| මූල්‍ය සේවා | 263 | 415 | -152 | 242 | 447 | -205 |
| විදුලි සන්දේශ සහ පරිගණක සේවා | 926 | 455 | 471 | 995 | 484 | 511 |
| විදුලි සන්දේශ | 140 | 110 | 30 | 147 | 112 | 35 |
| පරිගණක සේවා | 786 | 345 | 440 | 848 | 372 | 475 |
| වෙනත් ව්‍යාපාරික සේවා | 44 | 69 | -25 | 40 | 75 | -34 |
| රජයේ භාණ්ඩ හා සේවා වියදම් (අන් තැනක සඳහන් නොවන) | 34 | 69 | -35 | 35 | 75 | -41 |
| **ප්‍රාථමික ආදායම්** | **173** | **2,492** | **-2,319** | **262** | **2,661** | **-2,399** |
| සේවක වැටුප් | 26 | 96 | -70 | 28 | 102 | -74 |
| ආයෝජන ආදායම් | 147 | 2,395 | -2,249 | 234 | 2,560 | -2,325 |
| සෘජු ආයෝජන | 27 | 915 | -888 | 23 | 790 | -767 |
| ලාභාංශ | 14 | 414 | -400 | 13 | 565 | -552 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | 13 | 500 | -487 | 10 | 225 | -215 |
| විවිධ ආයෝජන | - | 954 | -954 | - | 1,059 | -1,059 |
| හිමිකම් | - | 82 | -82 | - | 92 | -92 |
| පොලී ආදායම් | - | 873 | -873 | - | 967 | -967 |
| කෙටි කාලීන | - | 6 | -6 | - | 4 | -4 |
| දිගු කාලීන | - | 866 | -866 | - | 963 | -963 |
| අනෙකුත් ආයෝජන | 55 | 526 | -471 | 88 | 711 | -623 |
| සංචිත වත්කම් | 64 | - | 64 | 123 | - | 123 |
| **ද්විතීයික ආදායම්** | **7,175** | **848** | **6,327** | **7,023** | **860** | **6,163** |
| රජය | 11 | - | 11 | 8 | - | 8 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 7,164 | 848 | 6,316 | 7,015 | 860 | 6,155 |
| **ජංගම ගිණුම** | **26,432** | **28,741** | **-2,309** | **27,549** | **30,363** | **-2,814** |
| **ප්‍රාග්ධන ගිණුම** | **40** | **29** | **11** | **42** | **27** | **14** |
| ප්‍රාග්ධන සංක්‍රාම | 40 | 29 | 11 | 42 | 27 | 14 |
| රජය | 20 | - | 20 | 14 | - | 14 |
| සංස්ථා සහ කුටුම්බ | 20 | 29 | -9 | 28 | 27 | ... |
| **ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුම** | **26,472** | **28,770** | **-2,298** | **27,590** | **30,390** | **-2,799** |

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) අනේවාසිකයන්ට සැපයූ මගී සේවාවන්, ප්‍රවාහන සේවාවන්හි ඇතුළත්ය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යානා යෙදවීම සහ වෙළඳපොළ ප්‍රවණතා අනුව පියාසර කිරීමේ වාර ගණන තීරණය කිරීම දායක විය. ශ්‍රී ලංකන් ගුවන් සමාගම ගුවන් ගමනාන්ත 39 කට තම සේවා අඛණ්ඩව සැපයූ අතර, ලන්ඩන්, මෙල්බර්න්, ඩුබායි, අබුඩාබි, දෝහා සහ දිල්ලි යන ගමනාන්ත වෙත වූ ගුවන් ගමන් වාර ගණන ද වැඩි කළේය.

**2018 වසරේදී, කුලී ගාස්තු තුළින් වූ ඉපැයීම් ඉහළ ගියේය.** වරාය ආශ්‍රිත කටයුතු පුළුල් වීමත් සමග කොළඹ වරායේ භාණ්ඩ, බහලු සහ ප්‍රතිනැව්ගත කිරීම් හැසිරවීම් පරිමාව ඉහළ යාම පිළිබිඹු කරමින් වරාය හා ගුවන් තොටුපොළ ආශ්‍රිත කටයුතු සඳහා වූ කුලී ගාස්තු, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,260 ක් දක්වා සියයට 6.6 කින් වර්ධනය විය. වසර තුළදී, කොළඹ වරාය සිය ඉතිහාසය තුළ ප්‍රථම වරට බහලු ඒකක මිලියන 7 කට වඩා වැඩි ප්‍රමාණයක් හසුරුවමින් නාවික සේවා අංශයෙහි වර්ධනය සඳහා දායක විය. මේ අතර, Alphaliner ගෝලීය වරායන් ශ්‍රේණිගත කිරීමට අනුව, ලොව ඉහළම බහලු හැසිරවීමේ වරායන් 30 අතුරින් 2018 වසරේ බහලු හැසිරවීමේ වර්ධනය සලකා බැලීමේදී, කොළඹ වරාය පළමු ස්ථානයට නම් කරන ලදී. මෙය, කොළඹ වරාය ඉතිහාසය තුළ ගෝලීය සමුද්‍රීය ශ්‍රේණිගත කිරීමක දී ඉහළ ම ස්ථානය ලබාගත් ප්‍රථම අවස්ථාව බැවින් එය සැලකිය යුතු ජයග්‍රහණයකි.

### විදේශ ගමන් සහ සංචාරක සේවා

**2018 වසරේදී සංචාරක පැමිණීම්වල සිදු වූ හිතකර වර්ධනයත් සමග සංචාරක ඉපැයීම් රට තුළට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස අඛණ්ඩව පැවතිණි.** වසරක් තුළ දී වූ ඉහළම වාර්ෂික සංචාරක පැමිණීම් සංඛ්‍යාව වාර්තා කරමින් 2018 වසරේදී සංචාරක පැමිණීම් 2,333,796 ක් දක්වා සියයට 10.3 කින් වර්ධනය විය. පිළිගත් ජාත්‍යන්තර සංචාරක සංවිධාන මගින් ලබා දුන් නිර්දේශ සහ සම්මාන, ප්‍රබල ප්‍රවර්ධන වැඩසටහන්, සංචාරක කර්මාන්තය තුළ ආයෝජන කැපී පෙනෙන ලෙස ඉහළ යෑම, සේවා සැපයුමෙහි ගුණාත්මක බව ඉහළ යෑම සහ ගුවන් හා මුහුදු මාර්ග හරහා අනෙකුත් රටවල් සමග සම්බන්ධතාව වැඩිදියුණු වීම, 2018 වසරේදී සංචාරක කර්මාන්තයෙහි වැඩි දියුණු වීම සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.

**2018 වසරේදී නැගෙනහිර ආසියාව සහ මැද පෙරදිග හැර අනෙකුත් ප්‍රධාන කලාප සියල්ලකින්ම වූ සංචාරක පැමිණීම් ඉහළ ගියේය.** බටහිර යුරෝපය මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 36.0 කට දායක වෙමින් ශ්‍රී ලංකාවේ විශාලතම සංචාරක ප්‍රභවය ලෙස තවදුරටත් පැවති අතර, මෙම කලාපයෙන් පැමිණි

5


සංචාරකයින් සංඛ්‍යාව 840,956 ක් දක්වා සියයට 23.5 කින් වර්ධනය විය. ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම සංචාරක ප්‍රභවය වන දකුණු ආසියාව වෙතින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 543,160 ක් දක්වා සියයට 4.8 කින් වර්ධනය විය. කෙසේ වුවද, දකුණු ආසියාව වෙතින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරකයින්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 වසරේදී වාර්තා වූ සියයට 24.5 ට සාපේක්ෂව 2018 වසරේදී සියයට 23.3 ක් දක්වා පහත වැටුණි. 2016 වසර දක්වා පැවති චීනයේ සිට පැමිණි සංචාරකයින්ගේ සැලකිය යුතු වර්ධනය හේතුවෙන් 2011 වසරේ සිට අඛණ්ඩව වර්ධනය වූ නැගෙනහිර ආසියාවෙන් පැමිණි සංචාරකයින්ගේ ප්‍රතිශතය ද සියයට 18.1 ක් දක්වා පහත වැටුණු අතර එම කලාපයෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 2018 වසරේදී සියයට 4.7 කින් පහළ ගියේය. කෙසේ වුවද, ඔස්ට්‍රලේසියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව සියයට 35.9 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර එම කලාපය වෙතින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරකයින්ගේ ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 වසරේදී වාර්තා වූ සියයට 4.3 ට සාපේක්ෂව 2018 වසරේදී සියයට 5.4 ක් දක්වා වර්ධනය විය. ඔස්ට්‍රේලියාවෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව ඉහළ යෑම මෙවැනි වර්ධනයක් සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ශ්‍රී ලංකාව සහ ඔස්ට්‍රේලියාව අතර ඍජු ගුවන් ගමන් ආරම්භ කිරීම මේ සඳහා යම්තාක් දුරකට බලපාන ලදී. රටවල් අනුව ගත් කල සංචාරක පැමිණීම් 424,887 ක් සමග ඉන්දියාව ඉහළම මට්ටමේ රැඳී සිටි අතර චීනයෙන් වූ සංචාරක පැමිණීම්වල සුළු අඩුවීමක් වාර්තා වුවද, චීනය දෙවන ස්ථානය ද අනතුරුව පිළිවෙළින් එක්සත් රාජධානිය, ජර්මනිය සහ ඔස්ට්‍රේලියාව ද විශාලතම සංචාරක ප්‍රභව ලෙස පැවතුණි. 2018 වසරේදී මෙම ඉහළම සංචාරක මූලාශ්‍ර පහෙන් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව ශ්‍රී ලංකාවට පැමිණි මුළු සංචාරකයින්ගෙන් සියයට 52 ක් පමණ විය. සංචාරකයින් පැමිණීමේ අරමුණ සැලකීමේ දී බහුතරයක් (සියයට 84.8) විවේකය ගත කිරීම සඳහා මෙරටට පැමිණ ඇති අතර සියයට 3.1 ක් ව්‍යාපාර කටයුතු සඳහා පැමිණ ඇත. 2018 වසරේදී ඥාති මිත්‍රාදීන් මුණගැසීම, ආගමික හා සංස්කෘතික කටයුතු, සෞඛ්‍ය, අධ්‍යාපන හා ක්‍රීඩා කටයුතු වැනි අනෙකුත් අරමුණු සඳහා පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 12.1 ක් විය.

**සංචාරක පැමිණීම් වාර්තාගත ඉහළම මට්ටමක පැවතීම සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම ඉහළ යෑම හේතුවෙන් වසර තුළදී සංචාරක ඉපැයීම් හිතකර වර්ධනයක් වාර්තා කළේය.** සංචාරක ඉපැයීම් 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 3,925 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 4,381 ක් දක්වා සියයට 11.6 කින් වර්ධනය විය. සංචාරකයින්ගේ වියදම් සහ සංචාරකයෙකු මෙරට ගත කරන කාලය පිළිබඳව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද නවතම වාර්ෂික සමීක්ෂණයට අනුව, සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදම 2017 වසරේදී වාර්තා වූ එ.ජ.ඩොලර් 170.1 සිට 2018 වසරේදී එ.ජ.ඩොලර් 173.8 ක් දක්වා ඉහළ ගොස් ඇත. තවද, සංචාරකයෙකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය 2017 වසර සඳහා ඇස්තමේන්තු කළ දින 10.9 සමග සැසඳීමේ දී 2018 වසරේදී දින

5

**5.10 රූප සටහන**


**රටවල් අනුව සංචාරක පැමිණීම් - 2018**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**5.11 රූප සටහන**

**සංචාරක පැමිණීම් සහ ඉපැයීම්**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

10.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. ඉලක්කගත ප්‍රවර්ධන වැඩසටහන් සහ මෙරට සංචාරක කර්මාන්තය ආශ්‍රිත යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා පුළුල් කිරීම සඳහා අඛණ්ඩව ආයෝජන සිදු කිරීමත් සමග සංචාරක ඉපැයීම් මැදි කාලීනව අඛණ්ඩව ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, 2018 වසරේදී සංචාරක සේවා සඳහා වූ ගෙවීම් ද සියයට 3.8 ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් මිලියන 1,660 ක් වශයෙන් ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව විදේශ ගමන් හා සංචාරක සේවා උප අංශයෙහි අතිරික්තය 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,326 හා සැසඳීමේ දී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,721 ක් දක්වා ඉහළ ගියේය.

**2018 වසරේදී සංචාරක අංශය සඳහා වූ ආයෝජන තවදුරටත් පුළුල් විය.** ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට 2017 වසරේදී ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 314 ක මුළු ආයෝජන වටිනාකමක් සහිත ව්‍යාපෘති 95 ට සාපේක්ෂව 2018 වසර තුළදී එ.ජ. ඩොලර් මිලියන 919 ක වටිනාකමකින් යුත් හෝටල් ව්‍යාපෘති 141 ක් සඳහා යෝජනා ලැබුණි. 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 201 ක ආයෝජන වටිනාකමක් සහිත කාමර 1,302 කින් සමන්විත හෝටල් ව්‍යාපෘති 44 ක් සඳහා අවසාන අනුමැතිය ලබා දෙන ලදී. මීට අමතරව, මෙම කාලය තුළදී හෝටල් ව්‍යාපෘති 35 ක් සිය මෙහෙයුම් කටයුතු ආරම්භ කර ඇති අතර එමගින් කාමර 1,125 ක් අලුතින් එකතු වී ඇත. මේ අතර, සංචාරක ආකර්ෂණයන් පවතින ජනප්‍රිය ස්ථානවල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභාවල ද සහයෝගය ඇතිව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. 2019 අයවැය මගින් සංචාරක කර්මාන්තය හා සම්බන්ධ ව්‍යාපාර සහ ආයෝජන සඳහා මූලිකව දැරිය යුතු පිරිවැය අඩුකිරීමට සහ හෝටල් නවීකරණය සහ සංචාරක කර්මාන්තය හා සම්බන්ධ උපකරණ ආනයනය කිරීම සඳහා පහසුකම් සැලසීමට බදු සහන කිහිපයක් හඳුන්වා දෙන ලදී. තවද, 2019 අයවැය මගින් සංචාරක හෝටල් විසින් විදේශ ව්‍යවහාර මුදල් ලැබීම් මත ගෙවිය යුතු වූ ජාතිය ගොඩනැගීමේ බද්ද ඉවත් කිරීමට යෝජනා කර ඇත. සංචාරක අංශයේ නියැලෙන ආයතන ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට නියමිත අතර එමගින් සංචාරක කර්මාන්තයේ අවිධිමත් අංශය ප්‍රධාන ප්‍රවාහයට එක් කිරීමට දිරිමත් කරනු ලැබේ. ඉදිරිය පිළිබඳව සැලකීමේ දී යටිතල පහසුකම් සහ අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම සහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සහ ක්ෂේත්‍රයේ හවුල්කරුවන්ගේ සහභාගිත්වයෙන් ශ්‍රමිකයන්ගේ පුහුණු මට්ටම වැඩි දියුණු කිරීම සංචාරක කර්මාන්තය සඳහා ඇති ප්‍රධාන ප්‍රමුඛතා වේ.

**ශ්‍රී ලංකාව තුළ සංචාරක කර්මාන්තය සඳහා පවතින ශක්‍යතාවයෙන් උපරිම ප්‍රයෝජන ගැනීම සඳහා 2018 වසරේදී ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගණනාවක් ආරම්භ කරන ලද අතර විවිධ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.** 2017 වසරේදී හඳුන්වා දෙන ලද 2017 - 2020 සඳහා නව සංචාරක උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම 2018 වසරේදී ද අඛණ්ඩව සිදු කෙරිණි. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2018 වසරේදී සංචාරක සල්පිල්, ප්‍රචාරණ වැඩසටහන් සහ

5

**5.9 සංඛ්‍යා සටහන**
**සංචාරක අංශයේ ක්‍රියාකාරිත්වය**

| ශීර්ෂය | 2014 | 2015 | 2016 | 2017 | 2018 (අ) | වාර්ෂික වෙනස්වීම (%) 2018 |
|---|---|---|---|---|---|---|
| සංචාරක පැමිණීම් (සංඛ්‍යාව) | 1,527,153 | 1,798,380 | 2,050,832 | 2,116,407 | 2,333,796 | 10.3 |
| පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින් ගණන | | | | | | |
| විනෝදාස්වාදය | 1,037,644 | 1,198,240 | 1,710,027 | 1,744,149 (ආ) | 1,979,819 | 13.5 |
| ව්‍යාපාර | 20,270 | 23,323 | 37,121 | 70,683 (ආ) | 71,255 | 0.8 |
| වෙනත් | 469,239 | 576,817 | 303,684 | 301,575 (ආ) | 282,722 | - 6.3 |
| සංචාරකයින් ගත කළ රාත්‍රී ගණන (දහස්) | 15,119 | 18,163 | 20,918 | 23,068 | 25,205 | 9.3 |
| කාමර උපයෝජන අනුපාතය (%) | 74.3 | 74.5 | 74.8 | 73.3 | 72.8 | - 0.7 |
| දළ සංචාරක ලැබීම් (රු. මිලියන) | 317,479 | 405,492 | 512,373 | 598,143 | 711,961 | 19.0 |
| ඒක පුද්ගල සංචාරක ලැබීම් (රු.) | 207,889 | 225,476 | 249,837 | 282,622 | 305,066 | 7.9 |
| මුළු සේවා නියුක්තිය (සංඛ්‍යාව) (ඇ) | 299,890 | 319,436 | 335,659 | 359,215 | 388,487 | 8.1 |
| සෘජු සේවා නියුක්තිය | 129,790 | 135,930 | 146,115 | 156,369 | 169,003 | 8.1 |
| වක්‍ර සේවා නියුක්තිය | 170,100 | 183,506 | 189,544 | 202,846 | 219,484 | 8.2 |

(අ) තාවකාලික
(ආ) සංශෝධිත
(ඇ) ඇස්තමේන්තු

මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

පාරිභෝගික හා ආහාර උත්සව සඳහා සහභාගිවීම ඇතුළත්ව හඳුනාගත් වෙළඳපොළ 34 ක රටවලට ආවේණික වූ ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් 2018 වසරේදී සංචාරක බ්ලොග් සටහන්කරුවන්ගේ වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යෑම, සී.එන්.එන් වැනි පිළිගත් ජාත්‍යන්තර මාධ්‍ය ආයතන තුළ ප්‍රචාරණ වැඩසටහන් දියත් කිරීම, වෙබ් දැන්වීම් සහ සමාජ මාධ්‍යජාල වැඩසටහන් හරහා ඩිජිටල් ප්‍රචාරණය සිදු කිරීම තුළින් අන්තර්ජාලය පදනම් කරගත් ප්‍රවර්ධන කටයුතු ශක්තිමත් කරන ලදී. මෙම ප්‍රවර්ධන වැඩසටහන්වල සහයෝගයෙන් 2018 වසරේ නොවැම්බර් මාසයේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය 'So Sri Lanka' නමින් නව සන්නාම නාමයක් දියත් කළේය. ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් ක්‍රියාත්මක කරන ලද ඵලදායී සහ අඛණ්ඩ ප්‍රවර්ධන වැඩසටහන්හි ප්‍රතිඵලයක් ලෙස 2019 වසරේ සංචාරය කළ හැකි හොඳම ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ලෝන්ලි ප්ලැනට් (Lonely Planet), නැෂනල් ජියොග්‍රැෆික් (National Geographic) ඇතුළු සංචාරක කටයුතු සම්බන්ධ බොහෝ ආයතන මගින් නිර්දේශ කර ඇත. මේ අතර මගී නෞකා 50 කින් මගීන් 86,000 ක් පමණ කොළඹ වරාය වෙත පැමිණ ඇත. තවද, ශ්‍රී ලංකාව කලාපය තුළ විවිධත්වයෙන් යුතු සංචාරක ගමනාන්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 වසරේදී ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මගින් සංවිධානය කරන ලද අයන්මෑන් 70.3 (Ironman 70.3) සහ රේඩ් ඇමසන්ස් (Raid Amazons) වැනි ජාත්‍යන්තර වශයෙන් ජනප්‍රිය වික්‍රමාන්විත ක්‍රීඩා ඉසව් කිහිපයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වුණි. මේ අතර සංචාරකයින් සඳහා සුහදශීලී ත්‍රී රෝද රථ, නව ජීවිතාරක්ෂක ඒකක පිහිටුවීම සහ ජංගම සංචාරක පොලිස් කොට්ඨාශ වැනි සංචාරකයින්ගේ ආරක්ෂාව සහ සුව පහසුව වැඩි කිරීම ඉලක්ක කර ගත් ව්‍යාපෘති ගණනාවක් 2018 වසරේදී ආරම්භ කරන ලදී. එක්සත් රාජධානිය, ජර්මනිය, ප්‍රංශය, ඉන්දියාව සහ චීනය තුළ වඩාත් යෝග්‍ය ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාව ස්ථානගත කිරීම සඳහා වන ඩිජිටල් ප්‍රවර්ධන වැඩසටහන සඳහා කොන්ත්‍රාත් පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ අතර, ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරනු ලබන පළමු ජාත්‍යන්තර ගවේෂණ වික්‍රමාන්විත ක්‍රීඩා තරඟාවලිය ලෙස ජාත්‍යන්තරව කීර්තිමත් ත්‍රාසජනක ක්‍රීඩා ඉසව්වක් වන ඇඩ්වෙන්චර් රේසිං ලෝක ශූරතාවය (Adventure Racing World Championship) 2019 වසරේ දෙසැම්බර් මාසයේදී පැවැත්වීමට නියමිතව ඇති අතර ඒ සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය අනුග්‍රහය දක්වයි.

5

**ගෝලීය සංචාරක වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ විභවතාව සැලකියයුතු ලෙස ළඟා කරගෙන නොමැත.** සංචාරක කර්මාන්තයේ ඉතාමත් හොඳින් නිරත වී සිටින සිංගප්පූරුව, හොංකොං සහ තායිවානය වැනි කලාපයේ කුඩා දිවයිනවලට සාපේක්ෂව පුළුල් සංචාරක වෙළඳපොළක් සඳහා පහසුකම් සැලසීමට ශ්‍රී ලංකාවට හැකියාව පවතී. උදාහරණයක් ලෙස ශ්‍රී ලංකාවට සාපේක්ෂව 91 ක් ගුණයකින් කුඩා වන සිංගප්පූරුව ශ්‍රී ලංකාව මෙන් 6.6 ගුණයක් පමණ සංචාරකයින් හට පහසුකම් සලසා ඇති අතර 2017 වසරේදී 5 ගුණයක පමණ ආදායමක් සංචාරක කර්මාන්තයෙන් උපයාගෙන ඇත. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරක සංවිධානය විසින් මෑතක දී සිදු කරන ලද අධ්‍යයනයක් මගින් නගරවල සංචාරකයින්ගේ වර්ධනය අවබෝධ කර ගැනීමට සහ කළමනාකරණය කර ගැනීමට ක්‍රමෝපායන් 11 ක් සහ මිනුම් දඬු 68 ක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2017-2020 සඳහා වන සංචාරක ක්‍රමෝපාය සැලැස්මේ මග පෙන්වීම සහ වැඩි දියුණු කළ යටිතල පහසුකම් හා අනෙකුත් පහසුකම් සමගින් ශ්‍රී ලංකාවට සංචාරක ධාරිතාවට එනම් තම පරිසරයට, සමාජීය සහ සංස්කෘතික සම්පත්වලට හානි කිරීමකින් තොරව රටකට නවාතැන් දිය හැකි උපරිම සංචාරකයින් සංඛ්‍යාව නොඉක්මවා ගනිමින් තවත් සංචාරකයින් බොහෝ පිරිසකට පහසුකම් සැලසීමට හැකි වනු ඇත. සංචාරක උපායමාර්ගික සැලැස්ම යටතේ හඳුන්වා දෙන ලද තිරසාර සංචාරක ඉලක්ක කරා 2020 වසර වන විට ළඟා වීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයක් හරහා රජය හා සංචාරක ව්‍යාපාරයේ පාර්ශ්වකරුවන් අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැගීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සංචාරක ගමනාන්ත සහ සමහර ජාතික වනෝද්‍යාන සංචාරකයින් වැඩි වශයෙන් පැමිණෙන කාලවලදී ප්‍රමාණයට වඩා සංචාරකයන්ගෙන් පිරී යන අතර, මෙමගින් කෝටා පදනම් කරගත් මංගත ප්‍රවේශපත් නිකුත් කිරීම් පද්ධති, විදුලි රැහැන් රිය පද්ධති, ගොඩබිමින්, ගුවනින් හා ජල මාර්ගවලින් සම්බන්ධ කරමින් මුළු රටම ආවරණය වන පරිදි උසස් හා කාර්යක්ෂම පොදු ප්‍රවාහන පහසුකම් සැලසීම වැනි සුහුරු විසඳුම් සහ සම්බන්ධීකරණ ප්‍රවේශවල අවශ්‍යතාව පෙන්නුම් කරයි.

### විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා

**2018 වසරේදී අඛණ්ඩව විදුලි සන්දේශ, පරිගණක සහ තොරතුරු සේවා අපනයන ඉපැයීම් ස්ථාවර ලෙස වර්ධනය විය.** විදුලි සන්දේශ, පරිගණක හා තොරතුරු සේවා අපනයන ඉපැයීම් 2018 වසරේදී එ.ජ. ඩොලර්

මිලියන 995 ක් දක්වා සියයට 7.5 කින් වර්ධනය විය. විදුලි සන්දේශ උප අංශයෙහි ඉපැයීම් ප්‍රමාණය 2017 වසර තුළදී එ.ජ. ඩොලර් මිලියන 140 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 147 දක්වා වැඩි විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන්ම අධිවේගී දත්ත සේවා සපයන අන්තර්ජාලය මත පදනම් වූ සන්නිවේදන පහසුකම් භාවිතය වර්ධනය වීම හේතු වී ඇති අතර, එය වසර තුළදී ස්ථාවර සහ ජංගම අධිවේගී දත්ත සේවා සඳහා ඇති ඉල්ලුම වැඩි වීමෙන් පිළිබිඹු වේ. ගනුදෙනුකරුවන් සඳහා අධිවේගී සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් ජාතික දත්ත මධ්‍යස්ථානය නමින් (National Data Centre) අති නවීන තාක්ෂණයෙන් යුත් 3 වන ස්ථරයේ දත්ත මධ්‍යස්ථානයක් ආරම්භ කළ අතර, එමගින් ශ්‍රී ලංකාවේ ආරක්ෂිත හා විශ්වසනීය දත්ත ධාරක පහසුකම සහ Cloud පරිගණක සේවා සැපයීම වර්ධනය වේ.

**පරිගණක සහ තොරතුරු සේවා උප අංශයෙහි වර්ධන ප්‍රවණතාව 2018 වසරේදී ද අඛණ්ඩව පැවතුණි.** ඒ අනුව, පරිගණක සහ තොරතුරු සේවා වෙත වූ ලැබීම් 2017 වසරේදී පැවැති එ.ජ. ඩොලර් මිලියන 786 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 848 දක්වා වර්ධනය විය. මෘදුකාංග දියුණු කිරීමේ සේවාවලට අමතරව, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) සහ දැනුම පදනම් කරගත් ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (KPO) ඇතුළත් තොරතුරු තාක්ෂණය පදනම් කරගත් සේවාවල (ITES) ශීඝ්‍ර වර්ධනය මෙම අංශයෙහි හිතකර වර්ධනය සඳහා තවදුරටත් දායක විය. මේ සම්බන්ධයෙන්, ශ්‍රී ලංකාවේ තොරතුරු තාක්ෂණ සමාගම්වලට ගෝලීය පරිමාණයේ ඉහළ ප්‍රමිතියෙන් යුත් විසඳුම් ඉදිරිපත් කිරීමට ඇති හැකියාව ඉස්මතු කරමින්, ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (ICT/BPM) ක්ෂේත්‍රය සඳහා "Island of Ingenuity-Sri Lanka Knowledge Solutions", යන තේමාව සහිත ජාතික සන්නාමය 2018 වසරේ අප්‍රේල් මාසයේ දී එළිදක්වන ලදී. මෙමගින් ගෝලීය සමාගම්වලට නවෝත්පාදන මධ්‍යස්ථාන පිහිටුවීමටත්, ආසියාවේ ඩිජිටල් ද්වාරය ලෙස ශ්‍රී ලංකාව සවිබල ගැන්වීමටත් අවධානය යොමු කරයි.

### 5.4.2 ප්‍රාථමික ආදායම

**2018 වසරේදී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ආන්තික ලෙස ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන්, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ රජය ලබාගත් ව්‍යාපෘති ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හා සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ලාභාංශ ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය 2017 වසරේදී වූ එ.ජ. ඩොලර් මිලියන 2,319 සමග සැසඳීමේ දී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,399 ක් විය. මේ අතර, ලාභදායී සෘජු ආයෝජන ව්‍යාපාර පෙර වසර හා සැසඳීමේ දී 2018 වසරේදී වැඩි ලාභාංශ ගෙවීමක් සිදු කළේය. කෙසේ වුවත්, විශේෂයෙන් ලැයිස්තුගත සමාගම් වූ සමහර විශාල සෘජු ආයෝජන ව්‍යාපාර ඉපැයූ ලාභ සාපේක්ෂව අඩුවීමත් සමග, 2018 වසරේදී ප්‍රතිආයෝජිත ඉපැයීම් සැලකිය යුතු ලෙස පහළ ගියේය. තවද, පෙර වසර වල දී නිකුත් කළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වූ කූපන ගෙවීමට අමතරව, 2017 වසරේ මැයි මාසයේ දී සහ 2018 වසරේ අප්‍රේල් මාසයේ දී රජය විසින් නිකුත් කළ නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා ද කූපන ගෙවීම සමග, 2018 වසරේදී කූපන ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් විවිධ ආයෝජන වෙනුවෙන් වූ පොලී ගෙවීම් වසර තුළදී ඉහළ ගියේය. කෙසේ වුවද, 2018 වසරේදී එ.ජ. ඩොලර් බිලියන 1.35 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර පියවීමත් සමග බැංකු අංශය නිකුත් කළ ජාත්‍යන්තර බැඳුම්කර සඳහා වූ කූපන ගෙවීම් පහළ ගියේය. නව විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් සහ රජය ලබාගත් ව්‍යාපෘති ණය හේතුවෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ අනෙකුත් ආයෝජන සඳහා පොලී ගෙවීම් යටතේ ඉහළම අගයක් ගන්නා රජයේ විදේශ ණය සඳහා වූ පොලී ගෙවීම් ඉහළ ගියේය. 2018 වසරේදී ගෝලීය ණය පොලී අනුපාතික ඉහළ යෑම හේතුවෙන්, බැංකු අංශය විසින් සිදුකළ විදේශීය ණය සඳහා වූ පොලී ගෙවීම් වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, ප්‍රධාන වශයෙන් නිල සංචිත වත්කම් ආයෝජනය මත වූ ඉපැයීම් ඉහළ යෑම හේතුවෙන්, වසර තුළදී ප්‍රාථමික ආදායම් ගිණුම වෙත වූ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 262 ක් දක්වා ඉහළ ගියේය.

### 5.4.3 ද්විතීයික ආදායම

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඛණ්ඩව මන්දගාමී වීම හේතුවෙන් ද්විතීයික ආදායම් ගිණුම වෙත ලැබීම් 2018 වසරේදී අඩු මට්ටමක පැවතුණි.** ද්විතීයික ආදායම් ගිණුමේ ලැබීම් සඳහා වැඩි දායකත්වයක් සපයන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2017 වසර තුළ දී සියයට 1.1 කින් අඩු වීමෙන් පසුව, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 7,015 ක් දක්වා සියයට 2.1 කින් අඩු විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල දක්නට ලැබුණු මෙම අඛණ්ඩ අඩුවීමේ ප්‍රවණතාවය සඳහා, ඛනිජ තෙල් මිල විචලනය වීම හමුවේ මැද පෙරදිග රටවල ඇති වී තිබෙන

**විශේෂ සටහන 6**

## ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

### හැඳින්වීම

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු ඇතුලත්, බැංකු අංශය තුලින් ක්‍රියාත්මක වන, රටවල් අතර සිදුවන ගනුදෙනු සහ විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය කිරීමේ පුළුල් පද්ධතියක අවශ්‍යතාවය හඳුනාගනිමින් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (International Transactions Reporting System - ITRS) නමින් නව දත්ත රැස්කිරීමේ පද්ධතියක් හඳුන්වාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගෙන ඇත. ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව හා තායිලන්තය වැනි ආසියානු කලාපීය රටවල් ඇතුළුව ලොව පුරා රටවල් විශාල සංඛ්‍යාවක් මෙම ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය භාවිතා කරයි.


රටවල් අතර සිදුවන ගනුදෙනු හා විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වල ලැබීම් සහ ගෙවීම් වල කාලීන සහ සවිස්තරාත්මක දත්ත සැපයීම මෙම ව්‍යාපෘතිය මගින් සිදුවන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන දෙපාර්තමේන්තු කිහිපයකම අධීක්ෂණ කටයුතු වලට සහය ලබාදීමට අපේක්ෂා කරයි. මෙමගින්, නියාමන අධීක්ෂණ කටයුතු සඳහා සාධනීය දත්ත වාර්තාකරණ රාමුවක් සැපයීමටත් වඩාත් පුළුල් ලෙස විදේශීය අංශයේ සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීමට මෙන්ම ඵලදායී සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමටත් පහසුකම් සලසනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 1. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ සංකල්පමය නිර්මාණය සහ එහි ප්‍රධාන සංරචක

රටවල් අතර සිදුවන සියළුම ගනුදෙනු, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් අතර සිදුවන දේශීය හුවමාරු කිරීම්, විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හි සිදුවන තැන්පතු සහ ආපසු ගැනීම් මෙන්ම බැංකු පද්ධතිය හරහා ගිණුමක් නොමැති ගණුදෙණුකරුවන් විසින් රටවල් අතර සිදුකරන ගනුදෙනු, ITRS පද්ධතියෙන් ලබාගන්නා දත්තවලට ඇතුලත් වේ. මෙම සංකල්පමය නිර්මාණයට ඇතුලත් වන සංයුක්ත පද්ධතිය ස්ථාපනය කිරීමෙන් විවිධ ගනුදෙනු තනි වාර්තාකරණ පද්ධතියක් මගින් හඳුනාගැනීමට සහ වාර්තා කිරීමට හැකිවේ. "සංවෘත ITRS" වාර්තාකරණ පද්ධතියක් මත පදනම්ව, රූප සටහන වි.ස. 6.1 හි දැක්වෙන පරිදි "සේවාග්‍රාහක ITRS" සහ "බැංකු ITRS" නම් වාර්තාකරණ ආකෘති 2කින් මෙම වාර්තාකරණ රාමුව සමන්විත වේ.

**රූප සටහන වි.ස. 6.1**

**යෝජිත ITRS වාර්තාකරණ යාන්ත්‍රණය**




5

**සේවාග්‍රාහක ITRS**: සේවාග්‍රාහක ITRS පද්ධතියක් මගින් අපේක්ෂා කරනු ලබන්නේ බැංකු අංශයේ සිටින ගනුදෙනුකරුවන්ගේ රටවල් අතර සිදුවන සියළුම ගනුදෙනු (විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රුපියල් ගිණුම් යන දෙවර්ගයම වෙත) සහ ගනුදෙනුකරුවන් සතු විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුවන සියළුම විදේශ මුදල් ගනුදෙනු වාර්තා කිරීමයි.

**බැංකු ITRS**: බැංකු ITRS පද්ධතිය මගින් අපේක්ෂා කරනු ලබන්නේ යම්කිසි බැංකුවක විදේශ ව්‍යවහාර මුදල් නොස්ට්‍රෝ ගිණුම් තුළින් සිදුකළ සියළුම ගනුදෙනු හඳුනා ගැනීමයි.

**සංවෘත ITRS වාර්තාකරණ පද්ධතිය**: සේවාග්‍රාහක ITRS සහ බැංකු ITRS පද්ධති මගින් ජනනය වූ වාර්තා වාණිජ බැංකු සතු විවිධ විදේශ ව්‍යවහාර මුදල් නොස්ට්‍රෝ ගිණුම් හි ශේෂයන් සමග සැසඳීමෙන් මුළු ITRS පද්ධතිය තුළින් වාර්තා වූ දත්ත පුළුල් ලෙස ආවරණය වූ බව තහවුරු කරගැනීම මෙමගින් සිදුවේ.


රටවල් අතර සිදුවන ගනුදෙනු (ජාත්‍යන්තර ගනුදෙනු) සහ දේශීය ගනුදෙනු ලෙස ITRS වාර්තාකරණය සඳහා විවිධ ගනුදෙනු වර්ගීකරණය වන්නේ ගනුදෙනු වර්ග, ප්‍රවාහයන්, අරමුදල් වල මූලාශ්‍ර සහ ගිණුම් වර්ග යනාදිය අනුව වේ.

- **ගනුදෙනු වර්ගය**: විදේශීය හෝ දේශීය ගනුදෙනු
- **ගනුදෙනු ප්‍රවාහය**: ලැබීම් (බැර) හෝ ගෙවීම් (හර)
- **ගනුදෙනු ආරම්භක ගිණුම**: ගනුදෙනුකරුවාගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, බැංකුවේ මුදල් ගිණුම
- **අරමුදල්වල මූලාශ්‍ර**: විදේශීය ප්‍රතිලාභියා, ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, බැංකුවේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම, බැංකුවේ මුදල් ගිණුම

ගනුදෙනුව සිදුකිරීමට හේතුව, ගනුදෙනුකරුගේ වර්ගය සහ ප්‍රතිලාභියාගේ තොරතුරු ඇතුළත් යම් නිශ්චිත තොරතුරු ග්‍රහණය කරගැනීමට ගනුදෙනුවේ වටිනාකම මත පදනම් වූ යම්කිසි සීමාවක් පනවනු ලැබේ. ගනුදෙනුවෙහි අරමුණ, ITRS වාර්තාකරණ පද්ධතිය සමග හඳුන්වාදෙන ITRS අරමුණු කේතය (ITRS Purpose Code) මත පදනම්ව ඇත. ITRS පද්ධතිය තුළින් වාර්තාකිරීමට අපේක්ෂිත විවිධ ගනුදෙනු වර්ග රූපසටහන වි.ස. 6.2 සහ රූපසටහන වි.ස. 6.3 මගින් පැහැදිලි කෙරේ.

**රූප සටහන වි.ස. 6.2**

**ජාත්‍යන්තර හා දේශීය විදේශ මුදල් ගනුදෙනු ප්‍රභේද - අදාළ ගිණුම් වෙත ලැබීම්**





| | ගනුදෙනුවේ ස්වභාවය | උදාහරණ |
|---|---|---|
| 1 | ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත වෙනත් රටකින් ලැබෙන ආදායම් | ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත අපනයන ආදායම් ලැබීම |
| 2 | විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් රහිතව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය වූ වෙනත් රටකින් ලැබුණු විදේශ ව්‍යවහාර මුදල් | ජාත්‍යන්තර මුදල් මාරුකිරීමේ සේවාවන් මගින් ලැබුණු විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ |
| 3 | විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත දේශීය අරමුදල් හුවමාරු කිරීමෙන් වූ ලැබීම් | ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම වෙත තවත් ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් අරමුදල් මාරුකිරීමක් හරහා ලැබුණු විදේශ ව්‍යවහාර අරමුදල් |
| 4 | බැංකුව විසින් ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට දේශීයව සිදුකරන බැර කිරීම් | ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට ලැබෙන පොලී ආදායම් |
| 5 | ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි තැන්පත් කරන විදේශ මුදල් | ගනුදෙනුකරුවකු තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි සිදුකරන විදේශ මුදල් තැන්පතු |
| 6 | බැංකුව විසින් විදේශ මුදල් මිලදී ගැනීම | ගනුදෙනුකරු විසින් බැංකුවට විදේශ මුදල් විකිණීම මගින් ශ්‍රී ලංකා රුපියල් ලබාගැනීම |
| 7 | ගනුදෙනුකරුවකුගේ රුපියල් ගිණුමට අනේවාසික පාර්ශවයන්ගෙන් රුපියල් ලැබීම | ශ්‍රී ලාංකික සංක්‍රමණික ශ්‍රමිකයෙකුගෙන් ශ්‍රී ලංකා රුපියල් වලින් ලැබුණු ප්‍රේෂණ |

5

රූප සටහන වි.ස. 6.3

ජාත්‍යන්තර හා දේශීය විදේශ මුදල් ගනුදෙනු ප්‍රභේද - අදාළ ගිණුම් වලින් සිදුකරන ගෙවීම්




| | ගනුදෙනුවේ ස්වභාවය | උදාහරණ |
|---|---|---|
| 8 | ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් රටවල් අතර සිදුකරන ගෙවීම් | අපනයනකරුවකු තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් තුළින් ආනයන සඳහා සිදුකරන ගෙවීම් |
| 9 | මුදල් පරිවර්තනය කිරීමෙන් පසු ගනුදෙනුකරු තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් රටවල් අතර සිදුකරන ගෙවීම් | ගනුදෙනුකරු විසින් තමන් සතු රුපියල්, විදේශ මුදල් වලට පරිවර්තනය කර තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි තැන්පත් කිරීමෙන් පසු තම ගිණුම හරහා සිදුකරන ගෙවීම් |
| 10 | ගනුදෙනුකරුවකු විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් රහිතව රටවල් හරහා සිදුකරන විදේශ මුදල් ගෙවීම් | ගනුදෙනුකරුවෙකු විසින් ණයවර ලිපියක් විවෘත කර වාහනයක් ආනයනය කිරීමෙන් පසු ගෙවීම් සිදුකිරීම |
| 11 | ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් තවත් ගිණුමකට දේශීයව අරමුදල් මාරු කිරීම | එක් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් තවත් ගිණුමකට විදේශ අරමුදල් මාරු කිරීම |
| 12 | මුදල් පරිවර්තනයෙන් පසු විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් සිදුකරන දේශීය ගෙවීම් | ගනුදෙනුකරුවකු තමන් සතු ශ්‍රී ලංකා රුපියල් විදේශ මුදල් වලට පරිවර්තනය කර තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙහි තැන්පත් කිරීමෙන් වෙනත් විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට, විදේශ මුදල් මාරුකිරීම |
| 13 | බැංකුව විසින් ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් දේශීයව සිදුකරන හර කිරීම් | ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් අයකර ගන්නා බැංකු ගාස්තු |
| 14 | ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ශ්‍රී ලංකා රුපියල් ලෙස මුදල් ආපසු ගැනීම | ගනුදෙනුකරු තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් ශ්‍රී ලංකා රුපියල් ලෙස මුදල් ආපසු ගැනීම් |
| 15 | ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් විදේශ මුදල් ආපසු ගැනීම | ගනුදෙනුකරු තම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමෙන් විදේශ මුදල් ගැනීම් |
| 16 | විදේශීය ගනුදෙනු සඳහා විදේශ විනිමය විකිණීම | විදේශ සංචාර සඳහා ගනුදෙනුකරු විසින් බැංකුවකින් විදේශ විනිමය මිලදී ගැනීම |
| 17 | ගනුදෙනුකරුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් රුපියල් ගිණුමට අරමුදල් මාරුකිරීම | ගනුදෙනුකරුවකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම සහ රුපියල් ගිණුම අතර අරමුදල් මාරු කිරීම |

## 2. ITRS පද්ධතියක් භාවිතා කිරීමේ ප්‍රයෝජන

ITRS දත්තවල ප්‍රයෝජන අතරට, නියාමන අධීක්ෂණය සඳහා දත්ත සැපයීම, ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීම සඳහා දත්ත ලබාගැනීම සහ ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා අතිරේක තොරතුරු සැපයීම අන්තර්ගත වේ.

### 2.1 නියාමන අධීක්ෂණය සඳහා දත්ත වාර්තාකරණ රාමුව

බැංකු පද්ධතිය හරහා රටවල් අතර සිදුවන ගනුදෙනු සහ දේශීයව සිදුවන විදේශ මුදල් ගනුදෙනු අධීක්ෂණය කිරීම සඳහා මෙම යෝජිත ITRS පද්ධතිය ඵලදායී ලෙස භාවිතා කළ හැකිය. රටවල් අතර සිදුවන ප්‍රාග්ධන ගනුදෙනු නව විදේශ විනිමය පනත තුළින් තවදුරටත් ලිහිල් කිරීමට අපේක්ෂා කරන බැවින් අධීක්ෂණය ද ශක්තිමත් කිරීමට අවශ්‍ය වන අතර, බොහෝ රටවල් තම ප්‍රාග්ධන ගිණුම් ලිහිල් කිරීමේ ක්‍රියාවලිය අතරතුර ITRS පද්ධතිය යොදාගන්නා ලදී. ඵලදායී නියාමන අධීක්ෂණය සඳහා ITRS පද්ධතිය භාවිතා කිරීමෙන් අපේක්ෂා කරන වාසි පහත සඳහන් පරිදි අවධාරණය කළ හැකිය.

- **බැංකු අංශයෙහි, ජාත්‍යන්තර සහ විදේශ මුදල් සම්බන්ධ ගනුදෙනු රාශියක දත්ත වාර්තාකරණ අවශ්‍යතා එක් පද්ධතියක් මගින් සපුරාලීම:** මෙම යෝජිත පද්ධතිය මගින් දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකක බොහොමයක නියාමන වාර්තාකරණ අවශ්‍යතාවයන් තනි දත්ත වාර්තාකරණ පද්ධතියක් තුළින් සපුරා දෙයි. විවිධ නියාමන අවශ්‍යතාවයන් සඳහා සමාන දත්ත කිහිපවරක් වාර්තා කිරීමට සිදුවීම මෙම යෝජිත පද්ධතිය මගින් වළක්වයි.

- **නියාමන දත්ත වාර්තා කාලීනව හා සුරක්ෂිතව වාර්තා කිරීම:** නව පද්ධතිය මගින් නියාමන දත්ත කාලීනව හා සුරක්ෂිතව වාර්තා කිරීමට හැකියාව ලැබෙන අතර එය දෝෂ අනාවරණය කිරීමේ නිර්ණායකයකින් ද සමන්විත වේ. මෙමගින්, දත්ත වාර්තාකරණයේදී වාණිජ බැංකු සඳහා දැරීමට සිදුවන ප්‍රයත්නයන් ලිහිල් වන අතර නියාමන අරමුණු සඳහා බොහෝ සවිස්තරාත්මකව සහ පුළුල්ව දත්ත වාර්තා කිරීමට හැකිවේ. ITRS පද්ධතිය මගින් වාර්තා වූ දත්ත මුදල් විශුද්ධිකරණය වැළැක්වීම ශක්තිමත් කිරීමට සහ ත්‍රස්තවාදී කටයුතු සඳහා මූල්‍ය පහසුකම් සැලසීම වැළැක්වීම සඳහා ද භාවිතා කළ හැකිය.

- **නියාමන අවශ්‍යතාවන්ගේ නව සංශෝධන සිදුකිරීම සඳහා සහ නව නියාමන වාර්තාකරණය සඳහා පහසුකම් සැලසීම:** යෝජිත පද්ධතිය මගින් දැනට පවතින නියාමන අවශ්‍යතාවන්ගේ නව සංශෝධන

5

සඳහා සහ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුවන ජාත්‍යන්තර ගනුදෙනු සහ දේශීය ගනුදෙනු වල නව නියාමන වාර්තාකරණ අවශ්‍යතා කාර්යක්ෂමව සපුරාලිය හැකි වේ.

- **දැනට පවතින නියාමනයන් වල කාර්යක්ෂමතාව තහවුරු කිරීම:** විදේශ මුදල් ගනුදෙනු සම්බන්ධ නියාමනයන්හි කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා මෙම පද්ධතිය යොදා ගත හැක. මෙය දැනට පවතින ප්‍රතිපත්ති සුදුසු ලෙස වෙනස් කිරීමට සහ නව ප්‍රතිපත්ති අවශ්‍ය වේලාවට ක්‍රියාත්මක කිරීමට සහය වේ.
- **අපනයන ආදායම් අධීක්ෂණය සහ වාර්තා කිරීම:** විදේශ විනිමය පනත යටතේ නිකුත්කර ඇති නියාමනයන්ට අනුව අපනයනකරුවන්ගේ අපනයන ආදායම යම්කිසි කාලසීමාවක් ඇතුළත රට තුළට ගෙනඒමේ අවශ්‍යතාවයට අනුකූල වීම අධීක්ෂණයට ලක්කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුවෙන් ලැබෙන දත්ත වලට අමතරව ITRS පද්ධතිය යොදාගත හැක.
- **වාණිජ බැංකුවලට ඉලක්කගත පර්යේෂණ කටයුතු සහ අලෙවිකරණ කටයුතු වෙනුවෙන් පාරිභෝගිකයන් මත පදනම් වූ දත්ත ගබඩාවක් ලෙස යොදාගත හැකිවීම.** වාණිජ බැංකු සඳහා තම පාරිභෝගිකයන් සහ ගනුදෙනු අරමුණු මත පදනම් වූ දත්ත ගබඩාවක් දියුණු කිරීමෙන් දත්ත ඒකරාශී කිරීමට සහ විශ්ලේෂණය කිරීමට හැකිවීමෙන් වාසි අත්වීම.

### 2.2 ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීම

ITRS දත්ත ප්‍රධාන වශයෙන් ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීම සඳහා යොදාගත හැක. මෙය සපුරාගනු ලබන්නේ ගනුදෙනුවෙහි අරමුණ මත පදනම්වූ දත්ත ඒකරාශී කිරීම තුළිනි. ITRS පද්ධතිය විසින්, ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත පිළිබඳව ජාත්‍යන්තරව පිලිගත් දත්ත වාර්තා කිරීමේ ප්‍රමිතීන්ට අනුගතවූ එයටම අවේනික අරමුණු කේත පද්ධතියක් භාවිතා කරනු ඇත. ඍජු සමීක්ෂණ හරහා තවදුරටත් අධීක්ෂණය කළයුතු වන යම් සුවිශේෂ ගනුදෙනුවල ප්‍රතිලාභීන් සහ අරමුදල් යැවූ පුද්ගලයින් හඳුනාගැනීම සඳහා ITRS පද්ධතිය ප්‍රධාන මූලාශ්‍රයක් වනු ඇත. සේවා ගිණුමෙහි සියලුම ප්‍රධාන ගනුදෙනු වර්ග ITRS පද්ධතිය හරහා සම්පාදනය කළ හැක. ITRS පද්ධතිය ස්ථාපනය කිරීම තුළින් ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරගත හැකි ආකාර කිහිපයක් පහතින් දක්වා ඇත.

- **ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සමස්තයක් ලෙස වැඩිදියුණු වීම:** දත්ත ආවරණය ගත්කල, යෝජිත පද්ධතිය මගින් ගෙවුම් තුලන සංඛ්‍යා දත්ත සම්පාදනය කිරීමේ රාමුව විශාල ලෙස වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය. නව දත්ත මගින් ගෙවුම් තුලනය සම්පාදනය කිරීමේ ක්‍රියාවලියට අලුතින් ඇතුලත් කළ හැකි විවිධ ගනුදෙනු හඳුනාගැනීමට අපේක්ෂා කෙරේ. ITRS පද්ධතියෙන් ලබාගන්නා දත්ත ප්‍රධාන වශයෙන් සේවා, ප්‍රාථමික ආදායම් සහ ද්විතීයික ආදායම් ගිණුම්වල තෝරාගත් ගනුදෙනු වර්ග වාර්තා කිරීමට යොදාගත හැකි අතර, ගෙවුම් ශේෂයෙහි මූල්‍ය ගිණුමට අදාලව දැනට පවත්නා සමීක්ෂණ සඳහා ද උපකාරී කරගත හැකිය.
- **සේවා අංශයෙහි ආවරණය පුළුල් කිරීම:** සේවා ගිණුමෙහි පවත්නා සියලුම ප්‍රධාන ගනුදෙනු වර්ග ITRS පද්ධතිය මගින් සම්පාදනය කරගත හැකිය. සේවා ගිණුමෙහි සංඛ්‍යා දත්ත දැනට වාර්ෂික සහ අර්ධ වාර්ෂික සමීක්ෂණ මත පදනම්වූ ඇස්තමේන්තු මගින් සම්පාදනය කෙරේ. එවැනි දත්තවල ගුණාත්මකභාවය ITRS පද්ධතිය හරහා සැලකිය යුතු ලෙස වැඩිදියුණු කළ හැකිය. මෙවැනි විශේෂ අංශ අතර තොරතුරු තාක්ෂණ (IT) / ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම (BPO) තුළින් වූ ලැබීම්, ශ්‍රී ලාංකිකයින් විදේශ සංචාරවලදී දරනු ලබන වියදම්, ප්‍රවාහන, විදුලි සන්දේශ සහ රක්ෂණ සේවා ඇතුළත් වේ. එපමණක් නොව, පර්යේෂණ හා සංවර්ධන කටයුතු, උපදේශන සේවා, පේටන්ට් අයිතිය සහ අනෙකුත් නැගී එන සේවා උප අංශවල ගනුදෙනු ද ITRS පද්ධතිය යටතේ ආවරණය කළ හැකිය.
- **විදේශීය අංශයෙහි දැනට පවත්නා සමීක්ෂණවල ආවරණය පුළුල් කිරීම:** ITRS පද්ධතිය මගින් දැනට පවත්නා සමීක්ෂණවල, විශේෂයෙන්ම ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම හා සම්බන්ධ සමීක්ෂණවල ආවරණය සැලකිය යුතු ලෙස වැඩි දියුණු වනු ඇත. මූල්‍ය ගිණුමට අදාල විශේෂිත ගනුදෙනු හා සම්බන්ධ අනෙකුත් සියලු ගනුදෙනු හඳුනාගැනීම මගින් ඉදිරියේදී සමීක්ෂණ රාමුව වැඩි දියුණු කිරීමට ITRS පද්ධතිය කාර්යක්ෂම ලෙස භාවිතා කළ හැකිය.
- **විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පිළිබඳ සංඛ්‍යා දත්ත වැඩිදියුණු කිරීම:** නව විදේශ විනිමය පනත හඳුන්වාදීමත් සමඟ සියලුම නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (NRFC) විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වලට අදාළ නොවන ගනුදෙනු ද සමඟින්, පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCA) හා ඒකාබද්ධ කරන ලදී. නව පද්ධතිය මගින් අලුතින් හඳුන්වාදුන් විදේශ විනිමය පනතට අනුව, සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වෙන්කර හඳුනාගනු ඇත. යෝජිත ITRS පද්ධතිය, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සහ ගෙවීම් පිළිබඳ දත්ත ලබාගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇත.
- **ජාතික ගිණුම් සංඛ්‍යා දත්ත සඳහා දත්ත ලබාදීම:** ගෙවුම් ශේෂ සංඛ්‍යා දත්ත රාමුවෙහි වැඩිදියුණු වීම තුළින් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව

විසින් සම්පාදනය කරනු ලබන ජාතික ගිණුම් සඳහා අවශ්‍ය සවිස්තරාත්මක දත්ත ලබාදීමට හැකිවනු ඇත.

### 2.3 සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තොරතුරු සැපයීම

ITRS පද්ධතිය තුළින් ලබාගන්නා දත්ත, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා උපකාරක තොරතුරු ලෙසද භාවිතා කළ හැක. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේදී ITRS පද්ධතිය පහත දක්වා ඇති පරිදි උපයෝගී කර ගත හැක.


- **විදේශීය අංශයේ අසමතුලිතතා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ සංඥා නිකුත් කිරීම:** රටවල් අතර සිදුවන ගනුදෙනු සම්බන්ධයෙන් තත්කාලීන දත්ත ලබාගැනීම සඳහා ITRS පද්ධතිය උපකාරී වේ. උදාහරණයක් ලෙස, දේපල වෙළඳාම/මහල් නිවාස සඳහා වූ විදේශ ආයෝජන පිළිබඳ දත්ත ITRS පද්ධතිය හරහා ලබාගැනීම තුළින් විදේශ ආයෝජන මගින් දේපල මිල ගණන් අධික ලෙස ඉහළ යෑමට ඇති හැකියාව හඳුනාගත හැක.
- **ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය ඇගයීම සඳහා තොරතුරු සැපයීම:** කාලය සහ ආර්ථික සම්පත් ඉතිරි කරගැනීම සඳහා ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට පෙර ඒවායේ යෝග්‍යතාවය ඇගයීම වැදගත් වේ. කාලීනව සහ අඛණ්ඩව පුළුල් ලෙස දත්ත ආවරණය කිරීම හේතුවෙන් ITRS පද්ධතිය මගින් මෙම අරමුණ සපුරාලනු ලැබේ. උදාහරණයක් ලෙස, විදේශ විශ්ව විද්‍යාලවල දේශීය ශාඛා ශ්‍රී ලංකාවේ පිහිටුවීම තුළින් ඉතිරි කරගත හැකි විදේශ විනිමය පිළිබඳ තොරතුරු ITRS පද්ධතිය හරහා ලබාගත හැක.
- **මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහතික කිරීමට උපකාරී වීම:** දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ද්‍රවශීලතා ගැටළු හේතුවෙන් අවදානම් සහගත තත්ත්වයන්ට මුහුණ දෙන අංශ ITRS පද්ධතිය මගින් ලබාගන්නා දත්ත හරහා හඳුනාගැනීමට හැකි වන අතර, එමගින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සහතික කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා දත්ත සපයනු ලැබේ.

### 3. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ රාමුව

2019 වසරේදී සියලුම ප්‍රධාන ආරම්භක කර්තව්‍යයන් සිදුකිරීමත් සමඟ, ITRS පද්ධතිය වාණිජ බැංකුවලට හඳුන්වා දීමේ කටයුතු 2019 වසරේ දෙවන භාගයේදී ආරම්භ කිරීමට නියමිතව ඇති අතර, 2020 වසරේ පළමුවන භාගයේදී එය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මේ වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව ITRS වාර්තාකරණ අවශ්‍යතා සැලසුම් කිරීම සහ නියාමනය කිරීමේ රාමුව පිළිබඳ මූලික කෙටුම්පත් සකස් කිරීමේ කටයුතුවල නිරතව සිටියි.

රූප සටහන වි. ස. 6.4

ජාත්‍යන්තර ගණුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන සන්ධිස්ථාන




දැනට පවත්නා වාර්තාකරණ ක්‍රම සහ තාක්ෂණික යටිතල පහසුකම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන සහයෝගීතා දෙපාර්තමේන්තු අතර ITRS පද්ධතිය ස්ථාපනය කිරීම පිළිබඳව තාක්ෂණික මට්ටමේ සාකච්ඡා මේ වන විට පවත්වාගෙන යනු ලැබේ. ඉදිරියේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම පද්ධතිය බැංකු අංශයට හඳුන්වා දෙනු ලබන අතර, වාර්තාකරණ අවශ්‍යතා හඳුන්වාදීම, බැංකුවල තොරතුරු තාක්ෂණ පද්ධති වැඩිදියුණු කිරීම සහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම යනාදී ක්‍රියාවලි සඳහා බැංකු අංශය සමඟ සමීප සම්බන්ධීකරණයක් සහිතව කටයුතු කරනු ඇත.

භූ-දේශපාලනික අස්ථාවරත්වය සහ ගෝලීය ආර්ථික වර්ධනයේ මන්දගාමී වීම දැක්විය හැකිය. තවද, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දත්ත අනුව විදේශ රැකියා සඳහා සමස්ත ශ්‍රම සංක්‍රමණය 2018 වසරේදී අඛණ්ඩ අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. විදේශ රැකියා සඳහා ශ්‍රම සංක්‍රමණය පහළ යෑම කෙරෙහි, දේශීය ශ්‍රම වෙළඳපොළෙහි රැකියා අවස්ථා බහුලවීම සහ නුපුහුණු කාණ්ඩ යටතේ කාන්තා ශ්‍රම සංක්‍රමණය අධෛර්යමත් කිරීමට රජය විසින් ඇතැම් ක්‍රියාමාර්ග අඛණ්ඩව අනුගමනය කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, වසර තුළදී රජයේ සංක්‍රාම ලැබීම් සුළු පහළ යෑමක් වාර්තා

කළේය. මෙම ප්‍රවණතා හමුවේ, 2018 වසරේදී ද්විතීයික ආදායම් ගිණුම වෙත ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 7,023 ක් දක්වා සියයට 2.1 කින් පහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකාවේ වෙසෙන අනේවාසිකයන් විසින් 2018 වසරේදී සිදු කරන ලද පෞද්ගලික සංක්‍රාම සහ අදාළ ගෙවීම් සුළු වශයෙන් ඉහළ ගියේය. ඒ අනුව, ද්විතීයික ආදායම් ගිණුම වෙත වූ ශුද්ධ ලැබීම්, පෙර වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 6,327 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 6,163 ක් විය.

## 5.5 ජංගම ගිණුමේ ශේෂය

**2018 වසරේදී ජංගම ගිණුමේ හිඟය සැලකිය යුතු ලෙස පුළුල් විය.** සේවා ගිණුමේ අතිරික්තය කැපී පෙනෙන ලෙස වර්ධනය වීම හමුවේ වුවද, වෙළඳ හිඟයෙහි සැලකිය යුතු වැඩිවීම, ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය හා ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂය සුළු වශයෙන් අඩු වීම හේතුවෙන්, ජංගම ගිණුමේ හිඟය පුළුල් විය. වෙළඳ භාණ්ඩ අපනයනය වසර තුළ හිතකර වර්ධනයක් වාර්තා කළ ද, ආනයනවල ඉහළ වර්ධනය නිසා වෙළඳ හිඟය පුළුල් විය. ප්‍රධාන වශයෙන්, පෞද්ගලික මෝටර් රථ, රත්‍රන් සහ ඉන්ධන ආනයන හේතුකොට ගෙන ආනයන වියදම ඉහළ ගියේය. සංචාරක ඉපැයීම්, ප්‍රවාහන සහ පරිගණක සේවා යන උප අංශ වෙත ලැබීම් ශක්තිමත් ලෙස වර්ධනය වීම සමග, 2018 වසර තුළදී සේවා ගිණුමේ අතිරික්තය එහි ධනාත්මක ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගෙන ගියේය. ලාභාංශ සහ පොලී ගෙවීම් ඉහළ යෑම සහ සෘජු ආයෝජන ව්‍යාපාරවල ප්‍රතිආයෝජිත ඉපැයීම් සැලකිය යුතු ලෙස පහළ යෑම සමග වසර තුළදී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය සුළු වශයෙන් පුළුල් විය. වසර තුළදී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අඩු වීම ජංගම ගිණුමට අහිතකර බලපෑමක් ඇති කළේය. ඒ අනුව, ජංගම ගිණුමේ හිඟය 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,309 ට සාපේක්ෂව 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,814 ක් දක්වා පුළුල් විය. ජංගම ගිණුමේ හිඟය, ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී වාර්තා වූ සියයට 2.6 ට සාපේක්ෂව 2018 වසරේදී සියයට 3.2 ක් විය.

## 5.6 ප්‍රාග්ධන ගිණුමේ ශේෂය

**2018 වසරේදී ප්‍රාග්ධන ගිණුම වෙත වූ ලැබීම් පහළ මට්ටමක පැවතුණි.** පෙර වසර සමග සැසඳීමේ දී, 2018 වසරේදී පෞද්ගලික අංශය වෙත ලැබුණු ප්‍රාග්ධන සංක්‍රාම වර්ධනය වූ අතර, රජය වෙත ලැබුණු ප්‍රාග්ධන සංක්‍රාම පහළ ගියේය. ඒ අනුව, ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය 2017 වසරේදී පැවති එ.ජ. ඩොලර් මිලියන 11 සමග සැසඳීමේ දී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 14 ක් විය.


## 5.7 මූල්‍ය ගිණුම

**2017 වසර හා සැසඳීමේ දී 2018 වසර තුළදී ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් සහ ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් පහළ ගියේය.** කෙසේ වුවත්, 2018 වසරේදී මූල්‍ය ගිණුමෙහි ගෙවීම්වලට සාපේක්ෂව ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන්, ශුද්ධ විදේශීය වගකීම් ප්‍රමාණය වර්ධනය විය. එ.ජ. ඩොලර් බිලියන 2.5 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීමෙන් වූ ලැබීම්, එ.ජ. ඩොලර් බිලියනයක විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් විදේශීය ණය ද ඇතුළත් එ.ජ. ඩොලර් බිලියන 2.1 ක විදේශ සෘජු ආයෝජන ලැබීම් යනාදිය වසර තුළදී මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් විය. බැංකු අංශය විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් බිලියන 1.35 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර කල්පිරීම සහ රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 990 ක ශුද්ධ විදේශ ආයෝජන ඉවත් කර ගැනීම් මූල්‍ය ගිණුම වෙතින් වූ ප්‍රධාන ගෙවීම් විය. මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත්වීම සහ රජය විසින් සිදුකළ විදේශීය ණය සේවාකරණ ගෙවීම් නිසා දළ නිල සංචිත ප්‍රමාණය අඩු වීම, වසර තුළදී ශුද්ධ

5

5.12 රූප සටහන

මූල්‍ය ගිණුම




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.10.අ. සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| **මූල්‍ය ගිණුම** | **2,938** | **5,061** | **-591** | **2,737** |
| **සෘජු ආයෝජන** | **72** | **1,373** | **68** | **1,611** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | 68 | 532 | 58 | 463 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් නොවන හිමිකම් | 55 | 32 | 48 | 238 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 55 | 32 | 48 | 238 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | 13 | 500 | 10 | 225 |
| ණය උපකරණ | 4 | 840 | 10 | 1,148 |
| සෘජු ආයෝජකයන් විසින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි | 4 | 840 | 10 | 1,148 |
| **විවිධ ආයෝජන** | **...** | **1,771** | **-** | **129** |
| හිමිකම් සහ ආයෝජන කොටස් අරමුදල් | - | 359 | - | -4 |
| ණය සුරැකුම්පත් | ... | 1,413 | - | 134 |
| තැන්පතු භාරගන්නා ආයතන | ... | -500 | - | -1,350 |
| දිගු කාලීන | ... | -500 | - | -1,350 |
| රජය | - | 1,913 | - | 1,484 |
| කෙටි කාලීන (භාණ්ඩාගාර බිල්පත්) | - | 81 | - | -96 |
| දිගු කාලීන | - | 1,832 | - | 1,580 |
| භාණ්ඩාගාර බැඳුම්කර | - | 360 | - | -894 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | - | -28 | - | -26 |
| ස්වෛරීත්ව බැඳුම්කර | - | 1,500 | - | 2,500 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **82** | **1,916** | **343** | **997** |
| මුදල් සහ තැන්පතු | 78 | -228 | 80 | - 632 |
| මහ බැංකුව | - | -402 | - | -1 |
| කෙටි කාලීන | - | -2 | - | -1 |
| දිගු කාලීන | - | -400 | - | - |
| තැන්පතු භාරගන්නා ආයතන | 78 | 173 | 80 | - 631 |
| කෙටි කාලීන | 11 | 173 | -189 | - 631 |
| දිගු කාලීන | 67 | - | 268 | - |

**පිටු අංක 178 හා සම්බන්ධයි**

| | 2017 | | 2018 | |
|---|---|---|---|---|
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **විදේශීය සෘජු ආයෝජන** | | | | |
| හිමිකම් | | 32 | | 238 |
| ප්‍රති ආයෝජිත ඉපැයුම් | | 500 | | 225 |
| අන්තර් සමාගම් ණය | | 959 | | 1,574 |
| අන්තර් සමාගම් ණය ආපසු ගෙවීම් | | -119 | | -426 |
| **මුළු විදේශීය සෘජු ආයෝජන (1)** | | **1,373** | | **1,611** |
| ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණය (2) | | 538 | | 525 |
| **ආයෝජන මණ්ඩලයේ සමාගම්වලට ලබා දුන් ණයද ඇතුළුව මුළු විදේශීය සෘජු ආයෝජන (1+2) (ඇ)** | | **1,910** | | **2,136** |
| **කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු ශුද්ධ ලැබීම්** | | **279** | | **-55** |
| සෘජු ආයෝජන | | -80 | | -51 |
| විවිධ ආයෝජන | | 359 | | -4 |
| **රුපියල්වලින් නාමනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත්හි ශුද්ධ විදේශීය ආයෝජන (භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර)** | | **441** | | **-990** |
| විදේශීය මිල දී ගැනීම් | | 1,667 | | 706 |
| විදේශීය විකුණුම් | | 1,226 | | 1,696 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ ඇස්තමේන්තුවලින් වෙනස් වනුයේ ආවරණ සහ ගණනය කිරීමේ ක්‍රමවේදයන්හි වෙනස්කම් හේතුවෙනි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මූල්‍ය වත්කම් අත්කර ගැනීම් සැලකිය යුතු ලෙස පහළ යැමට හේතු විය. ඒ අනුව, 2018 වසර තුළදී ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් එ.ජ. ඩොලර් මිලියන 2,737 ක් වූ අතර ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් එ.ජ. ඩොලර් මිලියන 591 කින් පහළ ගියේය. 2018 වසරේ මුල් මාස හතර තුළ දී, දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ හිතකර තත්ත්වයක් පැවතීම හේතුවෙන් විදේශීය අංශයෙහි ආරක්ෂණ තත්ත්වයන් ගොඩනගා ගැනීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය මිලදී ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබුණි. මේ සමග, 2018 වසරේ අප්‍රේල් මාසයේ දී රජය විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් බිලියන 2.5 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙකෙහි ලැබීම් ද සමගින්, 2018 වසරේ අප්‍රේල් මස අවසානයේ දී දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 9.9 ක මෙතෙක් පැවති ඉහළම මට්ටම වෙත ළඟා වීමට සහය විය. කෙසේ වුවත්, ගෝලීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් දැඩි වීම සහ එහි ප්‍රතිඵලයක් ලෙස රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ප්‍රාග්ධන අරමුදල් ඉවත්කර ගැනීම් තුළින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ මත විශාල පීඩනයක් ඇති වූ අතර, එම නිසා 2018 වසරේ අප්‍රේල් මස අවසානයේ සිට මහ බැංකුවට වෙළඳපොළ වෙත විදේශ විනිමය සැපයීමට සිදු විය. මෙම ප්‍රවණතා සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන් 2018 වසර අවසානය වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 6.9 දක්වා අඩු වූ අතර, සමස්ත ශේෂය එ.ජ. ඩොලර් මිලියන 1,103 ක හිඟයක් වාර්තා කළේය.

### 5.7.1 සෘජු ආයෝජන

**ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් ලබාගත් විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන 2018 වසරේදී ඉතිහාසයේ ඉහළම අගය දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.** ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් විදේශීය ණය ද ඇතුළත් මුළු විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රමාණය, 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,910 හා සැසඳීමේ දී, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,136 ක් විය. මේ අතර, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන, 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,373 සිට 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,611 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. වසර තුළදී, ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් ලබාගත් ණය ඉවත් කළ පසු විදේශීය සෘජු ආයෝජන, ශුද්ධ අන්තර් සමාගම් ණය එ.ජ. ඩොලර් මිලියන 1,148 කින් ද, ප්‍රතිආයෝජිත

5

ඉපැයීම් එ.ජ. ඩොලර් මිලියන 225 කින් ද, හිමිකම් කොටස් වෙත වූ ශුද්ධ ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 238 කින් ද සමන්විත විය. වසර තුළදී, සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ප්‍රකාශයට පත් කරන ලද ලාභ සාපේක්ෂව අඩුවීම පිළිබිඹු කරමින්, පෙර වසරට සාපේක්ෂව 2018 වසරේදී ප්‍රතිආයෝජනය කළ ඉපැයීම්වල සැලකිය යුතු අඩුවීමක් වාර්තා විය. මීට අමතරව, එ.ජ. ඩොලර් මිලියන 426 ක සැලකිය යුතු ඉහළ අන්තර් සමාගම් ණය ගෙවීම, වසර තුළ දී ශුද්ධ විදේශ සෘජු ආයෝජන ලැබීම් කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කළේය. ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් විසින් එම සමාගම් හා සම්බන්ධතාවයක් නොමැති පාර්ශ්වයන්ගෙන් ලබාගත් විදේශීය ණය ප්‍රමාණය, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 538 හා සැසඳීමේ දී, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 525 ක් විය. 2018 වසරේදී වූ විදේශීය සෘජු ආයෝජන ලැබීම් ප්‍රධාන වශයෙන් හම්බන්තොට ඉන්ටර්නැෂනල් පෝට් ග්‍රෑප් පෞද්ගලික සමාගම වෙත ලැබුණු එ.ජ. ඩොලර් මිලියන 828 කින් සමන්විත වූ අතර, ඉන් එ.ජ. ඩොලර් මිලියන 682 ක් හම්බන්තොට වරාය වෙත වූ ආයෝජනය වෙනුවෙන් වසර තුළදී රජය විසින් ලද ලැබීම් වේ. 2018 වසර තුළ දී, විදේශීය සෘජු ආයෝජන ලැබීම්, විශාල වශයෙන් වරාය, විදුලි සන්දේශ, නිවාස හා දේපළ සංවර්ධන සහ හෝටල් ආශ්‍රිත ව්‍යාපෘති සඳහා ලැබුණු අතර, නිෂ්පාදන අංශය වෙත වූ විදේශීය සෘජු ආයෝජන ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. ආයෝජන රට වෙත ලැබුණු ආසන්නතම රට අනුව ගත් කල, 2018 වසරේ විදේශීය සෘජු ආයෝජන සිදු කළ ප්‍රධාන රටවල් පහ වූයේ චීනය, හොංකොං, ඉන්දියාව, මැලේසියාව සහ එක්සත් රාජධානියයි. මේ අතර, ශ්‍රී ලාංකික සමාගම් විසින් විදේශීය රටවල සිදු කළ සෘජු ආයෝජන ශුද්ධ වත්කම් අත්කර ගැනීම් 2017 වසරේ වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 72 හා සැසඳීමේ දී, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 68 ක් විය.

## 5.7.2 විවිධ ආයෝජන

### හිමිකම්

**සෘජු ආයෝජන හැරුණුවිට හිමිකම් කොටස් වෙත ලැබුණු අනෙකුත් විදේශීය ආයෝජන පිළිබිඹු කරන හිමිකම් කොටස් වෙත වූ විවිධ ආයෝජන, 2018 වසරේදී සුළු ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය.** හිමිකම් මත සිදු කෙරෙන විවිධ ආයෝජන, සෘජු ආයෝජන ගනුදෙනු හැර කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජනයන්ගෙන් සමන්විත වන අතර, ශ්‍රී ලාංකික ව්‍යාපාරයක මුළු කොටස් ප්‍රමාණයෙන් සියයට 10 කට වඩා අඩු තනි විදේශීය ආයෝජනයන් වශයෙන් සැලකේ. නැගී එන ආර්ථිකයන්හි ප්‍රාග්ධන වෙළඳපොළ පිළිබඳ ගෝලීය ආයෝජක ආකර්ෂණය පහළ යෑම පිළිබිඹු කරමින්, හිමිකම් කොටස් ආකාරයෙන් ලද විවිධ ආයෝජන 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 4 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. මේ තුළ, ද්විතීයික වෙළඳපොළ වෙතින් වූ එ.ජ. ඩොලර් මිලියන 82 ක ශුද්ධ ගෙවීම් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 78 ක ලැබීම් අන්තර්ගත විය. 2017 වසරට සාපේක්ෂව 2018 වසරේදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම්වල සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබුණු අතර, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 359 ක් වූ කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ විදේශීය ලැබීම් තුළ ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 202 ක ශුද්ධ ලැබීම් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ. ඩොලර් මිලියන 157 ක ලැබීම් අන්තර්ගත විය.

### ණය සුරැකුම්පත්

**ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද විශාලතම වාර්ෂික අක්වෙරළ බැඳුම්කර නිකුතුව නියෝජනය කරමින්, රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙක, ණය සුරැකුම්පත් මත වූ ප්‍රධාන ලැබීම් වන අතර, බැංකු අංශය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර බැඳුම්කර කිහිපයක් 2018 වසරේදී කල් පිරීම ප්‍රධාන ගෙවීම් වශයෙන් වාර්තා විය.** වසර 5 ක සහ වසර 10 ක කල්පිරීමේ කාලයක් සහිතව එකක් එ.ජ. ඩොලර් බිලියන 1.25 ක් වශයෙන් 2018 වසරේදී සාර්ථකව නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු දෙක, 2007 වසරේ සිට ජාත්‍යන්තර බැඳුම්කර වෙළඳපොළෙහි ශ්‍රී ලංකාව සිදු කළ දොළොස් වන එක්සත් ජනපද ඩොලර් බැඳුම්කර නිකුතුව සනිටුහන් කරයි. ශ්‍රී ලංකාව පිළිබඳ අඛණ්ඩ ආයෝජක විශ්වාසය පිළිබිඹු කරමින් මෙම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතු, මූලික මිල මාර්ගෝපදේශයට වඩා අඩු අගයකින් මිලකරණය විය. ඇමරිකා එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුව විසින් ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීමත් සමග, රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ වෙතින් සැලකිය යුතු ලෙස විදේශීය ආයෝජන ගෙවීම් සිදු විය. ඒ අනුව, 2018 වසර තුළ දී, භාණ්ඩාගාර බැඳුම්කර සහ භාණ්ඩාගාර බිල්පත් වෙත වූ විදේශීය අයෝජන පිළිවෙළින් එ.ජ. ඩොලර් මිලියන 894 ක සහ එ.ජ.ඩොලර් මිලියන 96 ක ශුද්ධ ගෙවීම් වාර්තා කළේය. මේ අතර, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල විදේශීය ආයෝජන ද 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 26 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. ලංකා බැංකුව විසින් නිකුත් කළ

**5.10.ආ සංඛ්‍යා සටහන**

**මූල්‍ය ගිණුම**

එ.ජ. ඩොලර් මිලියන

| ශීර්ෂය | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | මූල්‍ය වගකීම්හි ශුද්ධ වෙනස්වීම් |
| අනෙකුත් ආයෝජන (පිටු අංක 176 හා සම්බන්ධයි) | | | | |
| ණය | - | 1,889 | - | 1,568 |
| මහ බැංකුව | - | 184 | - | 252 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | - | 184 | - | 252 |
| සමීපස්ථ ණය පහසුකම | - | -235 | - | - |
| විස්තීර්ණ ණය පහසුකම | - | 419 | - | 252 |
| තැන්පතු භාරගන්නා ආයතන | - | 271 | - | 697 |
| කෙටි කාලීන | - | -280 | - | 844 |
| දිගු කාලීන | - | 551 | - | -146 |
| රජය | - | 1,223 | - | 558 |
| දිගු කාලීන | - | 1,223 | - | 558 |
| අනෙකුත් අංශ (ඇ) | - | 211 | - | 61 |
| දිගු කාලීන | - | 211 | - | 61 |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 35 | 195 | 148 | 224 |
| තැන්පතු භාරගන්නා ආයතන | 17 | - | -10 | - |
| කෙටි කාලීන | 17 | - | -10 | - |
| අනෙකුත් අංශ (ඈ) | 18 | 195 | 157 | 224 |
| කෙටි කාලීන | 18 | 195 | 157 | 224 |
| අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම් | -31 | 61 | 116 | -162 |
| මහ බැංකුව | - | 61 | - | -162 |
| කෙටි කාලීන (ඉ) | - | 61 | - | -162 |
| තැන්පතු භාරගන්නා ආයතන | -31 | - | 116 | - |
| කෙටි කාලීන | -31 | - | 116 | - |
| විශේෂ ගැනුම් හිමිකම් | - | - | - | - |
| **සංචිත වත්කම්** | **2,784** | | **-1,002** | |
| මූල්‍ය රත්‍රන් | - | | -103 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 2 | | -3 | |
| ජා. මූ. අරමුදලේ සංචිත මට්ටම | - | | - | |
| අනෙකුත් සංචිත වත්කම් | 2,782 | | -896 | |
| මුදල් සහ තැන්පතු | 393 | | -1,012 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 859 | | 466 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | -465 | | -1,478 | |
| සුරැකුම්පත් | 2,389 | | 122 | |
| ණය සුරැකුම්පත් | 2,389 | | 122 | |
| දිගු කාලීන | 2,389 | | 122 | |
| අනෙකුත් හිමිකම් | ... | | -6 | |
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **-2,123** | | **-3,328** | |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| **රජයේ දිගු කාලීන ණය (ශුද්ධ)** | | **1,223** | | **558** |
| ලැබීම් (ණය මුදා හැරීම්) | | 2,544 | | 2,329 |
| ව්‍යාපෘති ණය | | 1,544 | | 1,204 |
| විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම | | 1,000 | | 1,000 |
| වැඩසටහන් ණය | | - | | 125 |
| ගෙවීම් | | 1,320 | | 1,771 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ පෞද්ගලික අංශයේ සමාගම් ඇතුළත් වේ.
(ඈ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්වල වෙළඳ ණය ඇතුළත් වේ.
(ඉ) ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල ශුද්ධ ගනුදෙනු ඇතුළත් වේ.

එ.ජ. ඩොලර් මිලියන 500 ක බැඳුම්කරය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් නිකුත් කළ එ.ජ. ඩොලර් මිලියන 750 ක බැඳුම්කරය සහ ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් නිකුත් කළ එ.ජ. ඩොලර් මිලියන 100 ක බැඳුම්කරය යනාදී වශයෙන් බැංකු අංශය විසින් නිකුත් කරන ලද මුළු වටිනාකම එ.ජ. ඩොලර් මිලියන 1,350 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර කිහිපයක් කල්පිරීම, 2018 වසර තුළදී ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් වූ ප්‍රධානතම ගෙවීම් විය.

## 5.7.3 වෙනත් ආයෝජන

### මුදල් සහ තැන්පතු

**2018 වසර තුළදී මුදල් සහ තැන්පතු වත්කම් ඉහළ ගිය අතර, මුදල් සහ තැන්පතු වගකීම් සැලකිය යුතු ලෙස පහළ ගියේය.** තැන්පතු භාරගන්නා ආයතනයන්හි මුදල් සහ තැන්පතු ආශ්‍රිත වත්කම් ඉහළ යෑම සහ වගකීම් පහළ යෑම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, තැන්පතු භාරගන්නා ආයතනයන්හි වත්කම් ස්වරූපයෙන් වූ මුදල් සහ තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 80 කින් වැඩිවූ අතර, මුදල් සහ තැන්පතු වගකීම් එ.ජ. ඩොලර් මිලියන 632 කින් අඩු විය. බැංකු අංශයේ මුදල් සහ තැන්පතු වගකීම් සැලකිය යුතු ලෙස අඩුවීමට දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ ඇති වූ සැලකිය යුතු පීඩනයෙහි ප්‍රතිඵලයක් ලෙස වාණිජ බැංකුවල අනේවාසිකයන් සතු තැන්පතු වගකීම් අඩුවීම සහ 2018 වසරේ අග භාගයේ දී අපනයන ආදායම් රට තුළට පැමිණීම අඩුවීම හේතුවන්නට ඇත.

### විදේශීය ණය

**2018 වසරේදී මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** රජය වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් අඩු වීම, මුළු ශුද්ධ විදේශීය ණය ලැබීම් අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, වසර තුළ බැංකු අංශය විසින් ලබාගත් කෙටිකාලීන විදේශීය ණය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. ඒ අනුව, 2018 වසරේදී මූල්‍ය ගිණුම වෙත වූ ශුද්ධ විදේශීය ණය ප්‍රමාණය 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 1,889 හා සැසඳීමේ දී එ.ජ. ඩොලර් මිලියන 1,568 ක් විය.

**2018 වසරේදී සැලකිය යුතු විදේශීය ණය ආපසු ගෙවීම් නිසා රජය වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් මධ්‍යස්ථ මට්ටමක පැවතුණි.** රජය වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,223 හා සැසඳීමේ දී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 558 ක් විය. මෙය, එ.ජ.

**5.11 සංඛ්‍යා සටහන**

**2018 වසර තුළ විදේශ ණය මගින් මූල්‍යනය කරන ලද ප්‍රධාන ව්‍යාපෘතීන්**

| දායකයා සහ ව්‍යාපෘතිය | ලැබුණු ණය මුදල එ.ජ. ඩොලර් මිලියන |
|---|---|
| **රජයේ ව්‍යාපෘතීන් මුළු එකතුව** | **1,204** |
| එයින්; | |
| **චීන අපනයන - ආනයන බැංකුව** | **315** |
| එයින්; | |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 1 කොටස මාතර සිට බෙලිඅත්ත දක්වා | 109 |
| පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - 3 වන අදියර කෙරවලපිටිය සිට කඩවත දක්වා | 70 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 4 කොටස අන්දරවැව ව්‍යාපෘතිය හරහා මත්තල සිට හම්බන්තොට දක්වා | 37 |
| දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය - 2 කොටස බෙලිඅත්ත සිට වැටිය දක්වා | 24 |
| හම්බන්තොට කේන්ද්‍ර සංවර්ධන ව්‍යාපෘතිය | 21 |
| **ආසියානු සංවර්ධන බැංකුව** | **276** |
| එයින්; | |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 3 වන වාරිකය | 46 |
| කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය | 37 |
| කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායයන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය - අතිරේක මූල්‍යනය | 25 |
| ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 4 වන වාරිකය | 20 |
| දෙවන ඒකාබද්ධ මහාමාර්ග ආයෝජන වැඩසටහන - 1 වන වාරිකය | 18 |
| **ජපානය** | **157** |
| එයින්; | |
| කැලණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 48 |
| මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් අලාභ අඩු කිරීමේ ව්‍යාපෘතිය | 35 |
| මහනුවර අපවහන කළමණාකරණ ව්‍යාපෘතිය | 16 |
| ජාතික මාර්ග ජාලයේ නායයෑම් ආපදා වැළැක්වීමේ ව්‍යාපෘතිය | 16 |
| ජාතික මාර්ග පද්ධතියෙහි ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 12 |
| **ජාත්‍යන්තර සංවර්ධන සංගමය** | **125** |
| එයින්; | |
| දෙවන සෞඛ්‍ය අංශය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 24 |
| ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව වර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | 21 |
| උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය | 15 |
| **කැල්යොන් ක්‍රෙඩිට් ඇග්රිකොල් (Calyon Credit Agricole)** | **57** |
| කැලණි දකුණු ඉවුර ජල සම්පාදන යෝජනා ක්‍රමය 2 වන අදියර ක්‍රියාත්මක කිරීම | 38 |
| මහ මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය | 19 |
| **ඉන්දියාව** | **49** |
| එයින්; | |
| මුහුදු තීරය ආරක්ෂා කිරීමේ නැව් දෙකක් ප්‍රසම්පාදනය කිරීම | 27 |
| **චීන සංවර්ධන බැංකුව** | **41** |
| එයින්; | |
| ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීම හා පුනරුත්ථාපනය කිරීම | 19 |
| **නෙදර්ලන්ත රබෝ බැංකුව (Rabobank)** | **32** |
| එයින්; | |
| ග්‍රාමීය පාලම් 463 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය | 9 |

මූලය: මුදල් අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව

ඩොලර් මිලියන 2,329 ක් වූ විදේශීය ණය මුදාහැරීම් සහ එ.ජ. ඩොලර් මිලියන 1,771 ක් වූ විදේශීය ණය ආපසු ගෙවීම් වලින් සමන්විත විය. මුළු විදේශීය ණය මුදාහැරීම් වලින් එ.ජ. ඩොලර් මිලියන 1,204 ක් ව්‍යාපෘති ණය ද එ.ජ. ඩොලර් මිලියන 1,000 ක් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම යටතේ ද එ.ජ. ඩොලර් මිලියන 125 ක් වැඩසටහන් ණය මුදාහැරීම්වලින් ද සමන්විත විය. 2018 වසරේදී රජයේ ව්‍යාපෘති සඳහා වූ ප්‍රධාන ණය ලැබීම් තුළ දක්ෂිණ අධිවේගී මාර්ගය දීර්ඝ කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාතර සිට බෙලිඅත්ත දක්වා වූ 1 කොටස, පිටත වටරවුම් අධිවේගී මාර්ග ව්‍යාපෘතිය යටතේ කෙරවලපිටිය සිට කඩවත දක්වා වූ 3 වන අදියර, කැළණි ගඟ හරහා නව පාලමක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ඒකාබද්ධ මහා මාර්ග ආයෝජන වැඩසටහන යටතේ වූ 3 වන වාරිකය යනාදී ණය ලැබීම් ඇතුළත් විය. විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම චීන සංවර්ධන බැංකුවෙන් ලබාගත් අතර වැඩසටහන් මූල්‍යයන ණය ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාගන්නා ලදී. විදේශීය ණය ආපසු ගෙවීම්වලින් එ.ජ. ඩොලර් මිලියන 1,158 ක් විදේශීය ව්‍යාපෘති ණය ආපසු ගෙවීම් සඳහා වූ අතර, එ.ජ. ඩොලර් මිලියන 613 ක් විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම් සඳහා විය. රජයේ විදේශීය ණය ආපසු ගෙවීමේ වගකීම් පසුගිය වසර ගණනාව පුරා ඉහළ ගොස් ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රජය වෙත ලැබුණු විදේශීය ණය ප්‍රමාණය ශුද්ධ පදනම මත ක්‍රමයෙන් අඩු විය.

2018 වසරේදී, **තැන්පතු භාරගන්නා ආයතන, පෞද්ගලික අංශය හා රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වූ විදේශීය ණය ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.** බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්වලින් සමන්විත තැන්පතු භාරගන්නා ආයතන වෙත වූ ශුද්ධ විදේශීය ණය ප්‍රමාණය 2017 වසරේදී වාර්තා කළ එ.ජ. ඩොලර් මිලියන 271 සමග සැසඳීමේ දී, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 697 ක් විය. බැංකු අංශය වෙත වූ සැලකිය යුතු මට්ටමක කෙටිකාලීන ණය ලැබීම් මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, අනෙකුත් අංශය වෙත වූ ශුද්ධ විදේශීය ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 61 ක් වූ අතර, එය එම වසර තුළදී පෞද්ගලික අංශය වෙත වූ විදේශීය ණය ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 657 කින් සමන්විත වූ අතර රජය සතු වාණිජ ව්‍යවසායයන් සඳහා කිසිඳු විදේශීය ණය ලැබීමක් සිදු නොවිණි. පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ගෙවන ලද මුළු විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 596 ක් වූ අතර,

එය රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ගෙවන ලද එ.ජ. ඩොලර් මිලියන 186 කින් සහ පෞද්ගලික අංශය විසින් ගෙවන ලද එ.ජ. ඩොලර් මිලියන 410 කින් සමන්විත විය. මේ අතර, වසර තුළදී ජා.මූ.අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වූ පස්වෙනි වාරිකය ලැබීමත් සමග, මහ බැංකුව වෙත වූ විදේශීය ණය ප්‍රමාණය එ.ජ. ඩොලර් මිලියන 252 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

### වෙළඳ ණය හා අත්තිකාරම් සහ අනෙකුත් ලැබිය යුතු/ගෙවිය යුතු ගිණුම්

**2018 වසරේදී, නේවාසිකයන්ට ලැබුණු වෙළඳ ණය හා අත්තිකාරම් මෙන්ම අනේවාසිකයන්ට ලබාදුන් වෙළඳ ණය හා අත්තිකාරම් ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන්, ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ලැබුණු වෙළඳ ණයවලින් සමන්විත වන, අනේවාසිකයින්ගෙන් ලැබුණු මුළු වෙළඳ ණය ප්‍රමාණය 2018 වසරේදී වර්ධනය විය. 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 195 කින් ඉහළ ගිය වෙළඳ ණය ප්‍රමාණය හා සැසඳීමේ දී, ඉන්ධන ආනයනය ඉහළ යෑම හේතුවෙන් 2018 වසරේදී වෙළඳ ණය ආකාරයෙන් වූ ශුද්ධ විදේශීය වගකීම් වෙනස්වීම් එ.ජ. ඩොලර් මිලියන 224 ක් දක්වා වැඩි විය. මේ අතර, ශ්‍රී ලාංකික අපනයනකරුවන් විසින් විදේශීය වෙළඳ හවුල්කරුවන් වෙත සහ තැන්පතු ලබාගන්නා ආයතන වෙත ලබාදුන් වෙළඳ ණය තුළින් ඉපයූ ශුද්ධ මූල්‍ය වත්කම් අත්කර ගැනීම් 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 35 ක වැඩිවීම හා සැසඳීමේ දී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 148 ක් දක්වා වැඩි විය. තවද, 2018 වසරේදී මූලික වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් ඇතුළත් අනෙකුත් ගෙවිය යුතු ගිණුම් එ.ජ. ඩොලර් මිලියන 162 ක ශුද්ධ අඩුවීමක් වාර්තා කළ අතර බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත වූ අනෙකුත් ලැබිය යුතු ගිණුම් එ.ජ. ඩොලර් මිලියන 116 ක ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය.

### 5.7.4. විදේශීය සංචිත වත්කම්

**2018 වසරේදී විදේශීය සංචිත වත්කම් තත්ත්වයෙහි පහළ යෑමට අනුකූලව, 2018 වසර තුළදී විදේශීය සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු පහළ යෑමක් වාර්තා විය.** සංචිත වත්කම් හා සම්බන්ධ ගනුදෙනු ලෙස 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 2,784 ක සැලකිය යුතු ශුද්ධ වැඩිවීම හා සැසඳීමේ දී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,002 ක ශුද්ධ අඩුවීමක් වාර්තා කළේය. වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් සහ තැන්පතු එ.ජ. ඩොලර් මිලියන 1,012 කින් අඩු වූ අතර විදේශීය ණය සුරැකුම්පත්වල ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද ආයෝජන එ.ජ. ඩොලර් මිලියන 122 කින් වැඩි විය. තවද, 2018 වසරේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය රත්‍රන් සංචිත එ.ජ. ඩොලර් මිලියන 103 ක ශුද්ධ විකිණීමක් සිදුකිරීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූල්‍ය රත්‍රන් සංචිත ප්‍රමාණය අඩු විය.

## 5.8 සමස්ත ශේෂය

**සළකා බලන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල සිදුවන වෙනස පිළිබිඹු කරන සමස්ත ශේෂය, 2018 වසරේදී හිඟයක් වාර්තා කළේය.** 2017 වසරේදී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 2,068 ක අතිරික්තයට සාපේක්ෂව 2018 වසරේ සමස්ත ශේෂය එ.ජ.ඩොලර් මිලියන 1,103 ක හිඟයක් වාර්තා කළේය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීමෙන් වූ ලැබීම්, විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙන් ලද ලැබීම්, හම්බන්තොට වරාය වෙත ලැබුණු ආයෝජන ඇතුළු මූල්‍ය ගිණුම වෙත වූ සැලකිය යුතු ලැබීම් හමුවේ වුව ද අඛණ්ඩ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සහ 2018 වසරේ මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළට ශුද්ධ පදනම මත විදේශ විනිමය සැපයීම හේතුවෙන් 2017 වසර අවසානය වන විට පැවති එ.ජ.ඩොලර් මිලියන 6,597 ක ශුද්ධ විදේශීය සංචිත ප්‍රමාණය 2018 වසර අවසානය වන විට එ.ජ.ඩොලර් මිලියන 5,495 ක් දක්වා පහළ ගියේය.

## 5.9 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**2018 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ විදේශීය වගකීම් තත්ත්වය ඉහළ ගිය අතර, විදේශීය වත්කම් තත්ත්වය පහළ ගියේය.** සෘජු ආයෝජන, මුදල් හා තැන්පතු සහ අනේවාසිකයන්ට ලබාදුන් වෙළඳ ණය හා අත්තිකාරම් යන වත්කම් තත්ත්වයන්වල වැඩිවීමක් සිදු වුවද, ප්‍රධාන වශයෙන් සංචිත වත්කම් තත්ත්වය පහළ යෑම හේතුවෙන්, 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 12,704 ක්ව පැවති මුළු විදේශීය වත්කම් තත්ත්වය, 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 12,065 ක් දක්වා පහළ ගියේය. 2018 වසර අවසානය වන විට පැවති අනේවාසිකයින් වෙත වූ ශ්‍රී ලංකාවේ මුළු වගකීම් තත්ත්වය, එ.ජ. ඩොලර් මිලියන 62,486 ක් දක්වා වසර මුල පැවති තත්ත්වයට වඩා එ.ජ. ඩොලර් බිලියන 1.9 කින් වැඩි විය. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, වසර මුල හා

### 5.12 සංඛ්‍යා සටහන
### අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)

| ශීර්ෂය | 2017 (අ) | | 2018 (ආ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන (ඇ)** | **1,375** | **10,755** | **1,433** | **12,757** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,366 | 7,423 | 1,414 | 8,351 |
| ණය උපකරණ | 9 | 3,332 | 19 | 4,406 |
| **විවිධ ආයෝජන** | **...** | **15,620** | **...** | **14,629** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | | 1,533 | | 1,824 |
| අනෙකුත් අංශ | | 1,533 | | 1,824 |
| ණය සුරැකුම්පත් (ඈ) | ... | 14,087 | ... | 12,805 |
| තැන්පතු භාරගන්නා ආයතන | ... | 1,666 | ... | 249 |
| දිගු කාලීන | ... | 1,666 | ... | 249 |
| රජය | | 12,244 | | 12,385 |
| කෙටි කාලීන | | 167 | | 60 |
| දිගු කාලීන | | 12,077 | | 12,326 |
| අනෙකුත් අංශ | | 177 | | 171 |
| දිගු කාලීන | | 177 | | 171 |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | - | - | - | - |
| **අනෙකුත් ආයෝජන** | **3,371** | **34,186** | **3,714** | **35,100** |
| **මුදල් සහ තැන්පතු** | **784** | **2,213** | **864** | **1,581** |
| මහ බැංකුව | | 1 | | ... |
| කෙටි කාලීන | | 1 | | ... |
| දිගු කාලීන | | - | | - |
| තැන්පතු භාරගන්නා ආයතන | 784 | 2,212 | 864 | 1,580 |
| කෙටි කාලීන | 546 | 2,212 | 357 | 1,580 |
| දිගු කාලීන | 238 | | 507 | |
| **ණය** | | **28,884** | | **30,382** |
| මහ බැංකුව | | 765 | | 992 |
| ජා.මූ. අරමුදලෙන් ලද ණය | | 765 | | 992 |
| තැන්පතු භාරගන්නා ආයතන | | 4,833 | | 5,530 |
| කෙටි කාලීන | | 2,929 | | 3,772 |
| දිගු කාලීන | | 1,904 | | 1,758 |
| රජය | | 19,111 | | 19,623 |
| දිගු කාලීන | | 19,111 | | 19,623 |
| අනෙකුත් අංශ (ඉ) | | 4,175 | | 4,237 |
| දිගු කාලීන | | 4,175 | | 4,237 |
| **වෙළඳ ණය සහ අත්තිකාරම්** | **1,002** | **1,930** | **1,150** | **2,154** |
| තැන්පතු භාරගන්නා ආයතන | 109 | | 100 | |
| කෙටි කාලීන | 109 | | 100 | |
| අනෙකුත් අංශ (ඊ) | 893 | 1,930 | 1,050 | 2,154 |
| කෙටි කාලීන | 893 | 1,930 | 1,050 | 2,154 |
| **අනෙකුත් ගිණුම් ලැබිය යුතු/ගෙවිය යුතු** | **1,584** | **594** | **1,700** | **432** |
| මහ බැංකුව (උ) | | 594 | | 432 |
| කෙටි කාලීන | | 594 | | 432 |
| තැන්පතු භාරගන්නා ආයතන | 1,584 | | 1,700 | |
| කෙටි කාලීන | 1,584 | | 1,700 | |
| **විශේෂ ගැනුම් හිමිකම්** | | **563** | | **550** |
| **සංචිත වත්කම්** | **7,959** | | **6,919** | |
| මූල්‍ය රත්‍රන් | 928 | | 819 | |
| විශේෂ ගැනුම් හිමිකම් | 4 | | 1 | |
| ජා.මූ.අරමුදලේ සංචිත මට්ටම | 68 | | 67 | |
| අනෙකුත් සංචිත වත්කම් | 6,958 | | 6,032 | |
| මුදල් සහ තැන්පතු | 3,037 | | 2,026 | |
| මූල්‍ය අධිකාරියේ හිමිකම් | 1,660 | | 2,126 | |
| අනෙකුත් ආයතනයන්හි හිමිකම් | 1,377 | | -100 | |
| සුරැකුම්පත් | 3,921 | | 4,006 | |
| ණය සුරැකුම්පත් | 3,921 | | 4,006 | |
| **මුළු වත්කම්/වගකීම්** | **12,704** | **60,561** | **12,065** | **62,486** |
| **ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය** | | **-47,857** | | **-50,421** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය | 12,704 | 60,561 | 12,065 | 62,486 |
| කෙටි කාලීන | 7,166 | 9,367 | 6,118 | 9,824 |
| දිගු කාලීන | 5,538 | 51,194 | 5,947 | 52,663 |

මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ආයෝජන මණ්ඩලයේ, කොළඹ කොටස් හුවමාරුවේ සහ අනෙකුත් පෞද්ගලික සමාගම්වල පැවති සෘජු ආයෝජනද ඇතුළත් වේ.
(ඈ) විදේශ විනිමය ණය එකතුව වෙළඳපොළ වටිනාකම මත පදනම් වන අතර දේශීය විනිමය ණය නිකුතුව පොත් අගය මත පදනම් වේ.
(ඉ) රජය සතු වාණිජ ව්‍යවසායයන් ලබාගත් ව්‍යාපෘති ණය සම්බන්ධයෙන් වූ නොපියවා ඉතිරිව ඇති ණය ඇතුළත් වේ.
(ඊ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික සමාගම්වල නොපියවූ වෙළඳ ණය ඇතුළත් වේ.
(උ) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම්වල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය

සසඳන විට සෘජු ආයෝජන තත්ත්වය සහ වාණිජ බැංකුවල හා රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ යාමයි. මෙම ප්‍රවණතා හමුවේ, මුළු විදේශීය වත්කම් සහ වගකීම් තත්ත්වය අතර වෙනස සැලකිල්ලට ගනු ලබන ශ්‍රී ලංකාවේ ශුද්ධ ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය, 2017 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 47,857 ක ශුද්ධ වගකීම් තත්ත්වයෙහි සිට 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 50,421 ක ශුද්ධ වගකීම් තත්ත්වයක් දක්වා ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ ශුද්ධ වගකීම් තත්ත්වයෙහි මෙම ක්‍රමික ඉහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ, රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සහ සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි සෘජු ආයෝජන වගකීම් තත්ත්වය ක්‍රමයෙන් ඉහළ යෑමයි.

### 5.9.1 සෘජු ආයෝජන තත්ත්වය

2018 වසරේදී, **සෘජු ආයෝජන වත්කම් තත්ත්වය සහ සෘජු ආයෝජන වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** වසර තුළදී, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් සහ හම්බන්තොට වරාය වෙත වූ සැලකිය යුතු මට්ටමක සෘජු ආයෝජන ලැබීම් හේතුවෙන් 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 10,755 ක්ව පැවති සෘජු ආයෝජන වගකීම් තත්ත්වය 2018 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් මිලියන 12,757 ක් දක්වා ඉහළ ගියේය. කොළඹ කොටස් වෙළඳපොළෙහි ලැයිස්තුගත සමාගම් තක්සේරු අලාභ වාර්තා කිරීම, සෘජු ආයෝජන වගකීම් තත්ත්වය කෙරෙහි සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් ඇති කළේය. සමහර ප්‍රධාන සමාගම්වල ණය, හිමිකම් කොටස් බවට පරිවර්තනය කිරීම සැලකිය යුතු ලෙස සිදුවීම හේතුවෙන් මෙම සමාගම්වල හිමිකම් කොටස් ආයෝජන තත්ත්වය ඉහළ ගිය අතර, ණය තත්ත්වය ඊට සමානව පහළ ගියේය. මේ අතර, සැලකිය යුතු ඉහළ සෘජු ආයෝජන සහිත සමහර විශාල සමාගම් වෙනත් සමාගම් සමග ඒකාබද්ධ වීම සිදු වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මෙම සමාගම්වල හිමිකම් කොටස් සහ ණය තත්ත්වයන් ඒකාබද්ධ විය. සමහර විශාල සෘජු ආයෝජන ව්‍යාපාරයන් ණය, හිමිකම් කොටස්වලට පරිවර්තනය කිරීම හමුවේ ණය තත්ත්වය සැලකිය යුතු ලෙස අඩු වුවත්, සෘජු ආයෝජකයන් විසින් ලබාදුන් ණය වැඩිවීම පිළිබිඹු කරමින් සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි ණය උපකරණවල වගකීම් තත්ත්වය ඉහළ ගියේය. 2018 වර්ෂය අවසානය වන විට පැවති සෘජු ආයෝජන වගකීම් තත්ත්වය අනුව සලකා බලන විට ප්‍රධාන

5

මූලාශ්‍ර පහ වූයේ චීනය, නෙදර්ලන්තය, ඉන්දියාව, සිංගප්පූරුව සහ මැලේසියාවයි. මේ අතර, ශ්‍රී ලාංකික නේවාසිකයන්ගේ විදේශීය ඍජු ආයෝජන වත්කම් තත්ත්වය මගින් පිළිබිඹු කරන ඍජු ආයෝජන වත්කම් තත්ත්වය, 2017 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,375 සමග සැසඳීමේ දී 2018 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් මිලියන 1,433 ක් විය.

### 5.9.2 විවිධ ආයෝජන තත්ත්වය

**2018 වසරේදී විවිධ ආයෝජන වගකීම් තත්ත්වය පහළ ගියේය.** රජය විසින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කළ ද, රජයේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳ වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීම, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන ඉවත් කර ගැනීම සහ බැංකු අංශය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ණය සුරැකුම්පත් කිහිපයක් කල්පිරීම හේතුවෙන් 2018 වසර අවසාන වන විට විවිධ ආයෝජන වගකීම් තත්ත්වය පහළ ගියේය. ඒ අනුව, විවිධ ආයෝජන වගකීම් තත්ත්වය, 2017 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 15,620 සිට 2018 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් මිලියන 14,629 දක්වා පහළ ගියේය. විවිධ ආයෝජන හිමිකම් කොටස් වගකීම් තත්ත්වය 2017 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 1,533 සමග සැසඳීමේ දී 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,824 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර විවිධ ආයෝජන ණය සුරැකුම්පත් වගකීම් තත්ත්වය, 2017 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 14,087 සමග සැසඳීමේ දී 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 12,805 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. 2018 වසර අග භාගයේ දී ඇති වූ දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් ද්විතීයික වෙළඳපොළ පිළිබඳ ආයෝජකයන්ගේ විශ්වාසය අඩුවීම පිළිබිඹු කරමින් 2018 දෙසැම්බර් මස අවසාන වන විට නොපියවා ඉතිරිව පැවති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස පහළ ගියේය. වෙළඳපොළ අපේක්ෂාවන් පිරිහීම හේතුවෙන් ද්විතීයික වෙළඳපොළෙහි දැනට නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මත වන ඵලදා අනුපාතික වැඩි වීම ද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම සැලකිය යුතු ලෙස පහළ යෑමට හේතු විය. වසර තුළ නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම සමග රජය විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය 2018 වර්ෂයේදී වර්ධනය වුවද, අනේවාසිකයින් විසින් තමන් සතු රුපියල්වලින් නාමනය කරන ලද රජයේ සුරැකුම්පත් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින් සිය ආයෝජන ඉවත් කර ගැනීම සහ දැනට නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල වෙළඳපොළ වටිනාකම අඩු වීම හේතුවෙන් 2018 වසර අවසානය වන විට අනේවාසිකයින් සතු නොපියවා ඉතිරිව ඇති රජයේ ණය සුරැකුම්පත් තත්ත්වය වැඩි වීම මධ්‍යස්ථ විය. මේ අතර, බැංකු කිහිපයක් විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් මිලියන 1,350 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර පියවීම හේතුවෙන් වසර අවසාන වන විට තැන්පතු භාරගන්නා ආයතනවල ණය සුරැකුම්පත් වගකීම් තත්ත්වය සැලකිය යුතු ලෙස අඩු විය.

### 5.9.3 අනෙකුත් ආයෝජන තත්ත්වය

#### මුදල් සහ තැන්පතු

**2018 වසර අවසානය වන විට මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය සුළු වශයෙන් ඉහළ ගිය අතර, වගකීම් තත්ත්වය සැලකිය යුතු ලෙස අඩු විය.** ප්‍රධාන වශයෙන් අනේවාසිකයින්ගේ සහ අපනයනකරුවන්ගේ තැන්පතු වගකීම් පහළ යෑම හේතුවෙන් තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වගකීම් තත්ත්වය 2017 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 2,213 සිට 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,581 ක් දක්වා අඩු විය. තැන්පතු භාරගන්නා ආයතනවල මුදල් සහ තැන්පතු වත්කම්වලින් සමන්විත වන මුදල් සහ තැන්පතු වත්කම් තත්ත්වය 2018 වසර ආරම්භයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 784 සිට වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 864 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය.

#### විදේශීය ණය

**2018 වසර අවසානය වන විට අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ ගියේය.** රජයේ, ශ්‍රී ලංකා මහ බැංකුවේ, තැන්පතු භාර ගන්නා ආයතනවල සහ පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යාවසායන්ගෙන් සමන්විත අනෙකුත් අංශයෙහි විදේශීය ණය වගකීම් තත්ත්වය වැඩි වීම නිසා මුළු නොපියවා ඉතිරිව ඇති ණය වගකීම් ප්‍රමාණය වැඩි විය. ඒ අනුව, විදේශීය ණය වගකීම් තත්ත්වය 2017 වසර අවසානයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 28,884 සිට 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 30,382 ක් දක්වා ඉහළ ගියේය. රජයේ විදේශීය ණය වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 19,623 ක් දක්වා ඉහළ ගිය අතර, මේ සඳහා රජය විසින්

ලබාගන්නා ලද නව ව්‍යාපෘති ණය, නව වැඩසටහන් ණය සහ කාලීන විදේශීය විනිමය මූල්‍ය පහසුකම හේතු විය. කෙටිකාලීන විදේශීය ණය වැඩි වීමත් සමග තැන්පතු භාරගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය වැඩි විය. 2018 වසර තුළදී ණය ආපසු ගෙවීම සහ නව ණය මුදාහැරීම් නොමැති වීමේ ප්‍රතිඵලයක් ලෙස රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ ණය තත්ත්වය අඩු වුවද, සමහර ප්‍රධාන සමාගම් සහ ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල විදේශීය ණය ඉහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශයෙහි නොපියවා ඉතිරි වූ ණය වගකීම් තත්ත්වය සුළු වැඩිවීමක් වාර්තා කළේය. ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පස්වන වාරිකය ලැබීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති වගකීම් තත්ත්වය ඉහළ ගියේය.

### වෙළඳ ණය සහ අත්තිකාරම්

**2018 වසරේදී වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය මෙන්ම වගකීම් තත්ත්වය ද ඉහළ ගියේය.** ප්‍රධාන වශයෙන්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඉහළ යෑම හේතුවෙන් පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ වෙළඳ ණය සහ අත්තිකාරම්වලින් සමන්විත වන නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය අත්තිකාරම් වගකීම් තත්ත්වය 2017 වසර අවසානයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 1,930 ක සිට 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 2,154 ක් දක්වා වැඩි විය. මේ අතර, තැන්පතු භාර ගන්නා ආයතන සහ පෞද්ගලික අංශය විසින් ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්වලින් පිළිබිඹු වන නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය සහ අත්තිකාරම් වත්කම් තත්ත්වය 2017 වසර අවසාන වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,002 ක සිට 2018 වසර අවසාන වන විට එ.ජ. ඩොලර් මිලියන 1,150 ක් දක්වා ඉහළ ගියේය.

### අනෙකුත් ලැබිය යුතු/ ගෙවිය යුතු ගිණුම් සහ විශේෂ ගැනුම් හිමිකම්


**2018 වසරේදී නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය ඉහළ ගිය අතර, අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය පහළ ගියේය.** තැන්පතු භාර ගන්නා ආයතනවල නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ලැබිය යුතු ගිණුම් තත්ත්වය 2017 වසර අවසානය වන විට පැවති එ.ජ. ඩොලර් මිලියන 1,584 ක සිට 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 1,700 ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ ආසියානු නිශ්කාෂණ සංගමය වෙතැති වගකීම් අඩු වීමත් සමග නොපියවා ඉතිරිව ඇති අනෙකුත් ගෙවිය යුතු ගිණුම් තත්ත්වය 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් මිලියන 432 ක් දක්වා අඩු විය. තවද, 2018 වසර අවසානය වන විට විනිමය අනුපාතිකයේ සිදු වූ වෙනස්කම් හමුවේ විශේෂ ගැනුම් හිමිකම් වගකීම් තත්ත්වය එ.ජ. ඩොලර් මිලියන 550 ක් දක්වා සුළු වශයෙන් අඩු විය.

## 5.9.4 විදේශීය සංචිත වත්කම් තත්ත්වය

**ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත තත්ත්වය 2017 වසර අවසානයේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 8.0 ක සිට 2018 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.9 ක් දක්වා අඩු විය.** 2018 වසර අවසානයේ දී රට තුළ පැවති දළ නිල සංචිත ප්‍රමාණය, භාණ්ඩ ආනයනික මාස 3.7 කට සමාන විය. සාපේක්ෂ වශයෙන් ස්ථාවර දේශීය විදේශ විනිමය වෙළඳපොළ තත්ත්වයන් හේතුවෙන් පළමු මාස හතර තුළ දී ශුද්ධ පදනම මත වෙළඳපොළෙන් එ.ජ. ඩොලර් මිලියන 459 ක් අවශෝෂණය කර ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය. මෙය සහ 2018 අප්‍රේල් මාසයේ දී රජය විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් බිලියන 2.5 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විත්වය හේතුවෙන් 2018 වසරේ අප්‍රේල් මාසය අවසන් වන විට දළ නිල සංචිත එ.ජ. ඩොලර් බිලියන 9.9 ක වාර්තාගත මට්ටමකට ඉහළ නංවා ගත හැකි විය. මීට අමතරව, වසර තුළ දී දළ නිල සංචිත ඉහළ නංවා ගැනීම සඳහා හම්බන්තොට වරාය වෙත වූ ආයෝජන, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි පස්වන

5.13 රූප සටහන

කාර්තුමය දළ නිල සංචිත සහ මුළු විදේශීය වත්කම්




මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

**5.13 සංඛ්‍යා සටහන**

**දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය**

*(කාලපරිච්ඡේදය අවසානයේදී තත්ත්වය)*

| | එ.ජ. ඩොලර් මිලියන | | | | |
|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 | 2018 (අ) |
| 1. රජයේ විදේශීය වත්කම් | 635 | 470 | 289 | 488 | 817 |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 7,573 | 6,834 | 5,730 | 7,470 | 6,102 |
| 3. දළ නිල සංචිත වත්කම් (1+2) | 8,208 | 7,304 | 6,019 | 7,959 | 6,919 |
| 4. තැන්පතු භාරගන්නා ආයතනවල විදේශීය වත්කම් | 1,676 | 2,033 | 2,414 | 2,478 | 2,664 |
| 5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ) | 9,884 | 9,337 | 8,433 | 10,436 | 9,583 |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 1,691 | 2,275 | 1,490 | 1,361 | 1,425 |
| 7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6) | 6,517 | 5,029 | 4,529 | 6,597 | 5,495 |
| 8. සමස්ත ශේෂය (ඈ) | 1,369 | -1,489 | -500 | 2,068 | -1,103 |
| 9. දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 9.1 වෙළඳ භාණ්ඩ | 5.1 | 4.6 | 3.8 | 4.6 | 3.7 |
| 9.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 4.3 | 3.8 | 3.1 | 3.8 | 3.1 |
| 10. මුළු විදේශීය වත්කම් මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ගණන | | | | | |
| 10.1 වෙළඳ භාණ්ඩ | 6.1 | 5.9 | 5.3 | 6.0 | 5.2 |
| 10.2 වෙළඳ භාණ්ඩ හා සේවා | 5.1 | 4.9 | 4.3 | 4.9 | 4.3 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

(ආ) 'විදේශයන්හි සිදුකරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.

(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)

(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස් වීම

වාරිකයේ ලැබීම් සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකමෙන් වූ ලැබීම් දායක විය. කෙසේ වෙතත්, ගෝලීය මූල්‍ය තත්ත්වයන් දැඩි වීම හමුවේ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් හා කොළඹ කොටස් වෙළඳපොළෙන් වූ ප්‍රාග්ධන ගෙවීම්වල ප්‍රතිඵලයක් ලෙස, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි සැලකිය යුතු පීඩනයක් ඇති වූ අතර, මේ නිසා 2018 වසරේ අප්‍රේල් මාසය අවසානයේ සිට දේශීය විදේශ විනිමය වෙළඳපොළට විදේශ විනිමය සැපයීමට මහ බැංකුවට සිදු විය. මෙම ප්‍රවණතා සහ විදේශීය ණය සේවාකරණ ගෙවීම් හේතුවෙන්, 2018 වසර අවසන් වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 6.9 දක්වා අඩු විය. 2018 වසර අවසානයේදී පැවති දළ නිල සංචිත රටෙහි කෙටි කාලීන ණය සහ වගකීම්වලින් සියයට 50 ක් ආවරණය කිරීමට ප්‍රමාණවත් විය. මේ අතර, දළ නිල සංචිත සහ තැන්පතු භාර ගැනීමේ ආයතනවල විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය වත්කම් ද 2017 වසර අවසානයේදී පැවති එ.ජ. ඩොලර් බිලියන 10.4 සිට 2018 වසර අවසානයේදී එ.ජ. ඩොලර් බිලියන 9.6 ක් දක්වා අඩු වූ අතර එය භාණ්ඩ ආනයනික මාස 5.2 කට සමාන විය. මෙම පහළ යෑම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ දළ නිල සංචිත තත්ත්වය පහළ යෑම වූ අතර, බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය 2017 වසර සමග සැසඳීමේ දී 2018 වසරේදී සමාන මට්ටමක පැවතුණි.


## 5.10 විදේශීය ණය සහ ණය සේවාකරණය

### 5.10.1 විදේශීය ණය

**2018 වසරේදී ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය එ.ජ. ඩොලර් මිලියන 706 කින් ඉහළ ගියේය.** ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය, 2017 වසර අවසානයේ වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 51,604 සිට 2018 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් මිලියන 52,310 ක් දක්වා වැඩි වූ අතර ඒ සඳහා රජය, පෞද්ගලික අංශයේ සමාගම් සහ සෘජු ආයෝජන ව්‍යාපාර සතු විදේශීය ණය ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය. වසර තුළදී නව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කළද, එම වසර තුළ සිදු කළ ව්‍යාපෘති ණය ගෙවීම්, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ විදේශ ආයෝජන ගෙවීම් මගින් ඇති වූ බලපෑම පිළිබිඹු කරමින් රජයේ විදේශීය ණය 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 654 කින් ඉහළ ගියේය. වසර තුළදී රජයේ විදේශීය ණය මූල්‍යායනය කිරීම, එ.ජ. ඩොලර් බිලියන 2.5 ක් වූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර දෙකක් නිකුත් කිරීම, එ.ජ. ඩොලර් බිලියන 1.2 ක් වූ ව්‍යාපෘති ණය ලැබීම් සහ එ.ජ. ඩොලර් බිලියනයක් වූ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම මගින් සිදු විය. මේ අතර, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ පස්වෙනි වාරිකය මහ බැංකුව වෙත ලැබුණ අතර

**5.14 රූප සටහන**

**විදේශීය ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**5.14 සංඛ්‍යා සටහන**

**නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය**

එ.ජ. ඩොලර් මිලියන
*(වසර අවසානයේදී තත්ත්වය)*

| ශීර්ෂය | 2017 (අ) | 2018 (ආ) |
|---|---|---|
| **රජය** | **31,355** | **32,009** |
| **කෙටි කාලීන** | **167** | **60** |
| ණය සුරැකුම්පත් | 167 | 60 |
| භාණ්ඩාගාර බිල්පත් (ඇ) | 167 | 60 |
| **දිගු කාලීන** | **31,188** | **31,949** |
| ණය සුරැකුම්පත් | 12,077 | 12,326 |
| භාණ්ඩාගාර බැඳුම්කර (ඇ) | 1,700 | 728 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර (ඈ) | 30 | 4 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (ඉ) | 10,347 | 11,594 |
| ණය | 19,111 | 19,623 |
| **මහ බැංකුව** | **1,924** | **1,975** |
| **කෙටි කාලීන** | **596** | **432** |
| මුදල් සහ තැන්පතු | 1 | … |
| අනෙකුත් ගිණුම් ගෙවිය යුතු | 594 | 432 |
| ආසියානු නිෂ්කාශන සංගමයේ වගකීම් | 594 | 432 |
| **දිගු කාලීන** | **1,329** | **1,542** |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 563 | 550 |
| මුදල් සහ තැන්පතු | … | … |
| ණය | 765 | 992 |
| ජා.මූ. අරමුදලේ ණය | 765 | 992 |
| විස්තීර්ණ ණය පහසුකම | 765 | 992 |
| **තැන්පතු භාරගන්නා ආයතන** | **8,711** | **7,359** |
| **කෙටි කාලීන** | **5,140** | **5,353** |
| මුදල් සහ තැන්පතු (ඊ) | 2,212 | 1,580 |
| වාණිජ බැංකු | 2,212 | 1,580 |
| ණය | 2,929 | 3,772 |
| වාණිජ බැංකු | 2,929 | 3,772 |
| **දිගු කාලීන** | **3,571** | **2,007** |
| ණය සුරැකුම්පත් (ඉ) | 1,666 | 249 |
| වාණිජ බැංකු | 613 | - |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 1,053 | 249 |
| ණය | 1,904 | 1,758 |
| වාණිජ බැංකු | 1,886 | 1,643 |
| තැන්පතු භාරගන්නා අනෙකුත් ආයතන | 19 | 115 |
| **අනෙකුත් අංශ (උ)** | **6,282** | **6,562** |
| **කෙටි කාලීන** | **1,930** | **2,154** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඌ) | 1,930 | 2,154 |
| **දිගු කාලීන** | **4,352** | **4,407** |
| ණය සුරැකුම්පත් (ඉ) | 177 | 171 |
| ණය | 4,175 | 4,237 |
| පෞද්ගලික අංශය | 1,919 | 2,167 |
| රජය සතු වාණිජ ව්‍යවසායයන් සහ රාජ්‍ය සංස්ථා | 2,256 | 2,070 |
| **සෘජු ආයෝජන : අන්තර් සමාගම් ණය (එ)** | **3,332** | **4,406** |
| **දළ විදේශීය ණය තත්ත්වය** | **51,604** | **52,310** |
| **ද.දේ.නි. යේ ප්‍රතිශතයක් වශයෙන්** | | |
| දළ විදේශීය ණය | 58.6 | 58.7 |
| කෙටි කාලීන ණය | 8.9 | 9.0 |
| දිගු කාලීන ණය | 49.7 | 49.7 |
| **දළ විදේශීය ණයෙහි ප්‍රතිශතයක් වශයෙන්** | | |
| කෙටි කාලීන ණය | 15.2 | 15.3 |
| දිගු කාලීන ණය | 84.8 | 84.7 |
| **විශේෂිත අයිතමයන්** | | |
| **ණය සුරැකුම්පත්හි මුහුණත වටිනාකම - ආංශික වර්ගීකරණය** | **13,566** | **13,448** |
| රජය | 11,791 | 13,023 |
| භාණ්ඩාගාර බිල්පත් | 180 | 65 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 1,930 | 804 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 30 | 4 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | 9,650 | 12,150 |
| මහ බැංකුව හැර තැන්පතු භාරගන්නා ආයතන | 1,600 | 250 |
| වාණිජ බැංකු | 600 | - |
| ලියාපදිංචි විශේෂිත බැංකු | 1,000 | 250 |
| අනෙකුත් අංශ | 175 | 175 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පොත් අගය මත පදනම්ව
(ඈ) මුහුණත වටිනාකම මත පදනම්ව
(ඉ) වෙළඳපොළ මිල මත පදනම්ව
(ඊ) අනේවාසික විදේශ මුදල් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(උ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඌ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(එ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වසර ආරම්භයට සාපේක්ෂව මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ආසියානු නිෂ්කාශන සංගමයේ නොපියවා ඉතිරිව ඇති වගකීම් පහළ ගියේය. 2018 වසරේදී ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ඩී.එෆ්.සී.සී. බැංකුව විසින් නිකුත් කරන ලද එ.ජ. ඩොලර් බිලියන 1.35 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර කල්පිරීමත් සමඟ තැන්පතු භාර ගන්නා ආයතනයන්හි නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු විය. 2018 වසර තුළ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් සැලකිය යුතු ඉහළ විදේශ ණය ගෙවීම් සිදු කළ ද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වෙළඳ ණය ඉහළ යාමත් සමඟ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි නොපියවා ඉතිරිව ඇති ණය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කළේය. තවද, 2018 වසරේදී එ.ජ. ඩොලර් බිලියන 1.1 ක් වූ සෘජු ආයෝජන ව්‍යාපාර සතු වූ අන්තර් සමාගම් ණය ප්‍රමාණය වර්ධනය වූ අතර ඒ සඳහා වරාය, විදුලි සංදේශ සහ හෝටල් ක්ෂේත්‍රයන්හි ප්‍රධාන සෘජු ආයෝජන ව්‍යාපාර කිහිපයක් වෙත වසර තුළදී ලැබුණු අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් හේතු විය.

2018 **වසරේදී, දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස රටෙහි නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය** 2017 **වසර මට්ටමේම පැවතියේය.** 2018 වසරේදී නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණයේ සුළු වැඩිවීම නාමික ද.දේ.නි.යෙහි වැඩිවීමට සමාන වීම සමඟ 2017 වසර අවසානයේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 58.6 ක් වූ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය ප්‍රමාණය 2018 වසර අවසානයේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 58.7 ක් විය. 2018 වසර ආරම්භයේ දී වූ දිගුකාලීන කල්පිරීම් සහිත මුළු විදේශීය ණය ප්‍රමාණය වසර මුල හා සැසඳීමේදී සමාන මට්ටමක පැවතියේය. තවද, මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් විශාලතම කොටස ලෙස පැවතුණු රජයේ නොපියවා ඉතිරිව ඇති ණය ප්‍රමාණය, 2017 වසර අවසානයේ දී පැවති මුළු විදේශීය ණය ප්‍රමාණයෙන් සියයට 60.8 ට සාපේක්ෂව 2018 වසර අවසානයේ දී සියයට 61.2 ක් දක්වා ඉහළ ගියේය.

### 5.10.2 විදේශීය ණය සේවාකරණ ගෙවීම්

2018 **වසරේදී ණය වාරික සහ පොලී ගෙවීම් ඇතුළත් විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ ගියේය.** 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 3,167 ක් වූ ණය වාරික ගෙවීම්, රජය, බැංකු අංශය, පෞද්ගලික සමාගම් සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් සැලකිය යුතු ලෙස විදේශීය වගකීම් ආපසු ගෙවීමත්

5

**5.15 සංඛ්‍යා සටහන**

**විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

| ශීර්ෂය | එ.ජ. ඩොලර් මිලියන | | | | | රුපියල් මිලියන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) | 2014 | 2015 | 2016 | 2017 (අ) | 2018 (ආ) |
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **3,635** | **4,772** | **4,461** | **4,566** | **5,866** | **474,527** | **648,541** | **648,315** | **695,690** | **954,971** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **2,479** | **3,580** | **3,243** | **3,167** | **4,188** | **323,626** | **487,275** | **472,270** | **482,750** | **682,374** |
| රජය | 1,296 | 1,976 | 1,040 | 1,354 | 1,815 | 169,150 | 265,662 | 151,236 | 206,531 | 294,845 |
| ව්‍යාපෘති ණය | 793 | 798 | 876 | 1,320 | 1,771 | 103,540 | 107,536 | 127,396 | 201,430 | 287,381 |
| ණය සුරැකුම්පත් | 503 | 1,178 | 164 | 34 | 45 | 65,610 | 158,126 | 23,840 | 5,101 | 7,464 |
| මහ බැංකුව | 719 | 907 | 1,555 | 635 | - | 93,917 | 125,686 | 226,118 | 96,584 | - |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 719 | 507 | 455 | 235 | - | 93,917 | 68,775 | 65,956 | 35,601 | - |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | - | 400 | 1,100 | 400 | - | - | 56,911 | 160,162 | 60,983 | - |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 464 | 698 | 648 | 1,178 | 2,373 | 60,559 | 95,928 | 94,916 | 179,635 | 387,528 |
| විදේශීය ණය | 309 | 553 | 559 | 559 | 596 | 40,280 | 76,199 | 81,944 | 85,242 | 97,270 |
| ණය සුරැකුම්පත් | - | - | - | 500 | 1,350 | - | - | - | 76,169 | 217,384 |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 155 | 145 | 88 | 119 | 426 | 20,279 | 19,729 | 12,972 | 18,225 | 72,874 |
| **1.2 පොලී ගෙවීම්** | **1,156** | **1,192** | **1,219** | **1,399** | **1,678** | **150,901** | **161,266** | **176,045** | **212,419** | **270,209** |
| රජය | 876 | 870 | 862 | 1,063 | 1,280 | 114,368 | 117,496 | 124,042 | 161,458 | 207,905 |
| ව්‍යාපෘති ණය | 260 | 266 | 264 | 332 | 425 | 33,883 | 36,024 | 38,440 | 50,652 | 68,847 |
| ණය සුරැකුම්පත් | 616 | 604 | 597 | 731 | 855 | 80,485 | 81,472 | 85,602 | 110,806 | 139,057 |
| මහ බැංකුව | 20 | 13 | 10 | 16 | 30 | 2,546 | 1,693 | 1,436 | 2,119 | 4,834 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 20 | 10 | 8 | 12 | 24 | 2,546 | 1,395 | 1,179 | 1,897 | 3,833 |
| විනිමය හුවමාරු ගිවිසුම් සහ වෙනත් ණය වගකීම් | - | 2 | 2 | 3 | 6 | - | 298 | 257 | 222 | 1,001 |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාර ගන්නා ආයතන | 260 | 309 | 347 | 311 | 354 | 33,986 | 42,077 | 50,567 | 47,433 | 57,441 |
| විදේශීය ණය | 118 | 148 | 179 | 169 | 242 | 15,470 | 20,128 | 26,121 | 25,775 | 39,498 |
| ණය සුරැකුම්පත් | 142 | 159 | 159 | 142 | 112 | 18,517 | 21,779 | 23,186 | 21,658 | 17,943 |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | - | 1 | 9 | 9 | 15 | - | 170 | 1,260 | 1,409 | 2,388 |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **16,735** | **16,943** | **17,448** | **19,084** | **20,264** | | | | | |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **23,936** | **24,078** | **24,835** | **26,432** | **27,549** | | | | | |
| **4. ණය සේවාකරණ අනුපාතිකය** | | | | | | | | | | |
| 4.1 ඉහත 2 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 21.7 | 28.2 | 25.6 | 23.9 | 28.9 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 17.3 | 25.1 | 22.9 | 22.6 | 28.8 | | | | | |
| 4.2 ඉහත 3 හි ප්‍රතිශතයක් වශයෙන් | | | | | | | | | | |
| සමස්ත අනුපාතිකය | 15.2 | 19.8 | 18.0 | 17.3 | 21.3 | | | | | |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගනුදෙනු හැර | 12.1 | 17.7 | 16.1 | 16.3 | 21.2 | | | | | |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | | | | | | | | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 2,172 | 2,846 | 1,901 | 2,417 | 3,095 | | | | | |
| 5.2 ඉහත 1 හි ප්‍රතිශතයක් වශයෙන් | 59.7 | 59.6 | 42.6 | 52.9 | 52.8 | | | | | |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සමඟ 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 4,188 ක් දක්වා ඉහළ ගියේය. 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 613 ක් වූ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම සහ එ.ජ. ඩොලර් මිලියන 1,158 ක් වූ ව්‍යාපෘති ණය ආපසු ගෙවීමත් සමඟ රජයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, බැංකු අංශය විසින් වසර තුළදී කල් පිරුණු එ.ජ. ඩොලර් මිලියන 1,350 ක් වූ ජාත්‍යන්තර බැඳුම්කර ආපසු ගෙවන ලදී. පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් විසින් ගෙවන ලද විදේශීය ණය වාරික ගෙවීම්ද වසර තුළදී සැලකිය යුතු ලෙස වැඩි විය. නොපියවා ඉතිරිව ඇති මුළු විදේශීය ණය මත පොලී ගෙවීම් 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 1,399 හා සැසඳීමේදී 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 1,678 ක් දක්වා වැඩි විය. පොලී ගෙවීම් ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා කූපන ගෙවීම සහ රජය ලබාගත් විදේශීය ණය සඳහා පොලී ගෙවීම් ඉහළ යෑම හේතුවෙන් රජයට දැරීමට සිදු වූ පොලී ගෙවීම ඉහළ යාමයි. එක්සත් ජනපදයේ ෆෙඩරල් සංචිත බැංකුවේ පොලී අනුපාතික ඉහළ දැමීම මඟින් සිදු වූ ගෝලීය පොලී අනුපාතික වැඩි වීම රජයේ, වාණිජ බැංකුවල සහ පෞද්ගලික අංශයේ පොලී ගෙවීම් වැඩිවීම සඳහා හේතු විය. මේ අතර, 2018 වසරේදී

සමස්ත විදේශ ණය සේවාකරණ ගෙවීම්, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන වල ප්‍රතිශතයක් වශයෙන් ගත් විට වැඩි විය. විදේශීය ණය සේවාකරණ ගෙවීම් වැඩිවීම, වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායම් වැඩි වීම ඉක්මවා යෑම හේතුවෙන් වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස ගත්විට සමස්ත විදේශීය ණය සේවාකරණ ගෙවීම් 2017 වසරේදී වාර්තා වූ සියයට 23.9 සිට 2018 වසරේදී සියයට 28.9 ක් දක්වා ඉහළ ගියේය.

**මැදිකාලීනව, විදේශීය ණය සේවාකරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සැලකිය යුතු අභියෝග රැසකට මුහුණ දීමට ඉඩ ඇත.** 2019 වසරේ සිට වාර්ෂික විදේශීය ණය ආපසු ගෙවීම් එ.ජ. ඩොලර් බිලියන 4 - 5 ක් අතර අගයක් ගන්නා බැවින්, ජාත්‍යන්තර මූල්‍ය වෙළඳපොළ මඟින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා වෙනත් මූල්‍ය පහසුකම් ආකාරයෙන් ණය ගැනීමේ සැලකිය යුතු අවශ්‍යතාවයක් පවතී. මැදිකාලීනව, ගෝලීය පොලී අනුපාත ඉහළ යාමට ඇති හැකියාව සමඟ ණය සඳහා වන පිරිවැය ඉහළ යෑමට ඉඩ ඇත. විදේශීය ණය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සඳහා, ජංගම ගිණුම ප්‍රතිතුලනය කිරීමට මෙන්ම මූල්‍ය ගිණුම වෙත විදේශීය සෘජු ආයෝජන සහ හිමිකම් ආයෝජන ආකාරයෙන් වූ ණය නොවන ලැබීම් ආකර්ෂණය කර ගැනීමට දිගුකාලීන ප්‍රවේශයක් ගත යුතුය.

## 5.11 විනිමය අනුපාතිකයේ හැසිරීම

**2018 වසරේ මුල් මාස හතර තුළ සාපේක්ෂ වශයෙන් ස්ථාවර මට්ටමක පැවතුණු විනිමය අනුපාතිකය, ඉන් අනතුරුව විශේෂයෙන්ම 2018 වසරේ අග භාගයේදී සැලකිය යුතු පීඩනයකට ලක් විය.** පළමු මාස හතර තුළදී දේශීය විදේශ විනිමය වෙළඳපොළට විදේශ විනිමය ලැබීම් හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් මිලියන 459 ක විදේශ විනිමය ප්‍රමාණයක් අවශෝෂණය කර ගැනීමට හැකි විය. කෙසේ වෙතත්, විදේශීය හා දේශීය සාධක හේතුවෙන් 2018 වසරේ මැයි මාසයේ සිට මෙම හිතකර තත්ත්වය වෙනස් විය. විදේශීය සාධක සැලකීමේදී, එක්සත් ජනපද ආර්ථිකය ශක්තිමත් වීම හේතුවෙන් ෆෙඩරල් සංචිත බැංකුව ප්‍රතිපත්ති පොලී අනුපාතය ඉහළ දැමීමට තීරණය කළ අතර, 2018 සහ 2019 වසර සඳහා පොලී අනුපාතික කිහිපවරක් වැඩි කිරීමට අපේක්ෂා කළේය. මෙම ප්‍රවණතා හේතුවෙන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ අඩු ද්‍රවශීලතා තත්ත්වයක් ඇති කරමින් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළෙන් සහ කොළඹ කොටස් වෙළඳපොළෙන් අඛණ්ඩව විදේශ ආයෝජන ගෙවීම් සිදු විය. දේශීය වශයෙන්, ආනයනකරුවන් විසින් විදේශ

5

5.16 සංඛ්‍යා සටහන

**විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍යය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| යුරෝ | 157.87 | 182.49 | 208.99 | 161.16 | 171.73 | 191.71 | -13.49 | -12.68 | -6.16 | -10.42 |
| ඉන්දියානු රුපියල් | 2.21 | 2.39 | 2.61 | 2.17 | 2.34 | 2.38 | -7.54 | -8.72 | -7.48 | -1.47 |
| ජපන් යෙන් | 1.29 | 1.36 | 1.65 | 1.34 | 1.36 | 1.47 | -5.10 | -18.05 | -1.12 | -7.58 |
| බ්‍රිතාන්‍ය පවුම් | 184.04 | 205.54 | 231.86 | 197.15 | 196.47 | 216.67 | -10.46 | -11.35 | 0.35 | -9.32 |
| එක්සත් ජනපද ඩොලර් | 149.80 | 152.85 | 182.75 | 145.60 | 152.46 | 162.54 | -2.00 | -16.36 | -4.50 | -6.20 |
| විශේෂ ගැනුම් හිමිකම් | 201.38 | 217.69 | 253.51 | 202.39 | 211.49 | 229.90 | -7.49 | -14.13 | -4.31 | -8.00 |
| සඵල විනිමය අනුපාතික දර්ශක (ආ) (ඇ) (2017 = 100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතක වෙනස්වීම | | | |
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍යය දර්ශකය | |
| | 2016 | 2017 | 2018 | 2016 | 2017 | 2018 | 2017 | 2018 | 2017 | 2018 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 105.00 | 97.17 | 85.81 | 104.89 | 100.00 | 94.08 | -7.46 | -11.69 | -4.66 | -5.92 |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 103.05 | 99.34 | 87.81 | 100.79 | 100.00 | 95.49 | -3.60 | -11.60 | -0.78 | -4.51 |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කර ගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශ ව්‍යවහාර මුදල් ඒකකයට එරෙහිව අඩු වීම පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(ආ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරගකාරී රටවල් 24 ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැලපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ඇ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය වැඩිවීම හෝ අඩුවීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළයාම හෝ පහළයාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

විනිමය සඳහා ඉල්ලුම වැඩිකිරීම, අපනයනකරුවන් විසින් එ.ජ. ඩොලර්, රුපියල්වලට පරිවර්තනය කිරීම අඩුවීම සහ අයහපත් දේශපාලනික වාතාවරණයන්, විශේෂයෙන්ම 2018 වසරේ අග භාගයේදී රුපියල අවප්‍රමාණය වීමට හේතු විය. විනිමය අනුපාතිකය වඩා නම්‍යශීලීවීමට ඉඩහැරීම සමග වෙළඳපොළ මූලධර්මයන් අනුව විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීමට අවස්ථාව ලබාදෙමින් විනිමය අනුපාතිකයෙහි අධික විචලනයන් අවම කිරීම සඳහා පමණක් ද්‍රවශීලතාවය සපයමින් ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් විය. මේ හේතුවෙන්, 2018 වසර තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එ.ජ. ඩොලර් මිලියන 1,120 ක් ශුද්ධ පදනම මත දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත සැපයූ අතර, වසර තුළ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියල සියයට 16.4 කින් අවප්‍රමාණය විය.

**එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව විසින් පොලී අනුපාත ඉහළ දැමීම හමුවේ සමස්තයක් ලෙස එ.ජ. ඩොලරය ශක්තිමත් වීමත් සමග අනෙකුත් ප්‍රධාන මුදල් වර්ග එ.ජ. ඩොලරයට සාපේක්ෂව අවප්‍රමාණය විය.** ඒ අනුව, යූරෝවලට සාපේක්ෂව සියයට 12.68 කින් ද, ඉන්දියානු රුපියලට සාපේක්ෂව සියයට 8.72 කින් ද, ජපන් යෙන් වලට සාපේක්ෂව සියයට 18.05 කින් ද සහ ස්ටර්ලිං පවුමට සාපේක්ෂව සියයට 11.35 කින් ද, ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය විය. ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව අවප්‍රමාණය වීමේ සංයුක්ත ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා රුපියල වසර තුළ දී විශේෂ ගැනුම් හිමිකම්වලට සාපේක්ෂව සියයට 14.13 කින් අවප්‍රමාණය විය.

5


### 5.11.1 නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**මුදල් වර්ග 5 කින් සැදුම්ලත් පැස මත හා මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් (2017=100) වසර තුළ දී පහළ ගියේය.**[1] විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම සමඟින් අනෙකුත් තෝරාගත් ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි සිදු වූ නාමික අවප්‍රමාණය වීම පිළිබිඹු කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන් අවප්‍රමාණය විය. ඒ අනුව, 2018 වසර තුළ දී මුදල් වර්ග 5 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශකය සියයට 12.74 කින් අවප්‍රමාණය වූ අතර, මුදල් වර්ග 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශකය සියයට 11.69 කින් අවප්‍රමාණය විය. මේ අතර, නාමික විනිමය අනුපාතිකවල වෙනස්වීමට අමතරව මුදල් පැසෙහි ඇතුළත් රටවල හා ශ්‍රී ලංකාවේ උද්ධමන වෙනස ද සැලකිල්ලට ගෙන ගණනය කෙරෙන, එමෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවේ තරගකාරීත්වය පිළිබිඹු කරන මුදල් වර්ග 5 කින් සහ 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පිළිවෙළින් සියයට 12.46 කින් සහ සියයට 11.60 කින් පහළ ගියේය. ශ්‍රී ලංකා රුපියලෙහි අඛණ්ඩ විදේශීය තරගකාරීත්වය පිළිබිඹු කරමින්, මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන්, 2018 වසරේදී බොහෝ විට පදනම් වර්ෂයේ සීමාවට පහළින් පැවතුණි.

1 නාමික සඵල සහ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකවල පදනම් වර්ෂය 2010 සිට 2017 දක්වා යාවත්කාලීන කර ඇත. මෙම පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම පිළිබඳ වැඩිදුර තොරතුරු විශේෂ සටහන 7 හි දක්වා ඇත.

5.15 රූප සටහන

විනිමය අනුපාතිකයේ වෙනස්වීම්




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**විශේෂ සටහන 7**

## මූර්ත සඵල විනිමය අනුපාතිකයේ පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම

### 1. හැඳින්වීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් වර්ග 5කින් සහ 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික (නා.ස.වි.අ.) සහ මූර්ත සඵල විනිමය අනුපාතික (මූ.ස.වි.අ.) දර්ශක පදනම් වර්ෂයට වරින් වර හඳුන්වා දුන් සංශෝධන සහිතව 1989 වර්ෂයේ සිට ගණනය කරනු ලැබේ. ඇතැම් රටවල් අතර ද්වීපාර්ශ්වික වෙළඳාමේ සාපේක්ෂ කොටස වෙනස්වීමට හැකි නිසා සඵල විනිමය අනුපාතික දර්ශක[1] නිරන්තරයෙන් සංශෝධනය කරයි. උදාහරණ ලෙස, යුරෝපීය මහ බැංකුව සහ ජාත්‍යන්තර පියවීමේ බැංකුව විසින් සෑම වසර තුනකට වරක් මූ.ස.වි.අ. දර්ශකවල පදනම් කාල යාවත්කාලීන කරනු ලබයි. නා.ස.වි.අ. සහ මූ.ස.වි.අ. දර්ශකයන් හි වර්තමාන පදනම් වර්ෂය 2010 වන අතර, එය 2017 වෙත ඉදිරියට ගෙන ඒම වෙළඳ හවුල්කරුවන්ගේ සාපේක්ෂ කොටසේ ඇතිවන වෙනස්කම් වඩාත් හොඳින් පිළිබිඹු කිරීමේ අරමුණෙන් සිදුකරන ලදී. පදනම් වර්ෂය 2017 ලෙස සංශෝධනය වූ පසු මුදල් වර්ග 5 කින් සහ 24 කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නා.ස.වි.අ. සහ මූ.ස.වි.අ. හි වර්තමාන දර්ශක 2013 වසරේ ජනවාරි මස සිට ආරම්භ වන පරිදි ගණනය කරන ලදී.

### 2. පදනම් වර්ෂය තෝරා ගැනීම

නාමික සඵල සහ මූර්ත සඵල විනිමය අනුපාතිකවල පදනම් වර්ෂය මගින් සෑම රටක් සඳහාම නියම කර ඇති සාපේක්ෂ බර තැබීම තුළින් නවතම වෙළඳ ප්‍රවණතාවන් පිළිබිඹු කරයි. ඒ අනුව, තාත්ත්වික බර තැබීමක් පවත්වා ගැනීම සඳහා පදනම් වර්ෂය වරින් වර යාවත්කාලීන කළ යුතුය. සාපේක්ෂ බර තැබීම් නිර්ණය කිරීම සඳහා පදනම් වර්ෂය තෝරා ගැනීමේ දී, නවතම වෙළඳ ප්‍රවණතාවන් පිළිබිඹු වීම සහ විදේශ විනිමය අනුපාතිකවල ස්ථායීතාවය පැවතීම වැනි සාධක කිහිපයක් සැලකිල්ලට ගත යුතු වේ. යම්කිසි රටක විදේශ වෙළඳාමෙහි ව්‍යුහය නිතර වෙනස්කම්වලට භාජනය වන්නේ නම්, කුඩා කාල ප්‍රාන්තරවල දී යාවත්කාලීන කිරීම් සිදුකළ යුතුය. 2010 සහ 2017 වර්ෂවල ශ්‍රී ලංකාවේ වෙළඳ හවුල්කරුවන් සමඟ සිදුවූ ද්වීපාර්ශ්වික වෙළඳාම මත පදනම් වූ වෙළඳ බර තැබීම් සැසඳීමේ දී, සැලකිය යුතු වෙනස්කම් කිහිපයක් නිරීක්ෂණය කළ හැකි විය. උදාහරණයක් ලෙස, 2010 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළදී චීනය සහ ඉන්දියාව සමග ශ්‍රී ලංකාව සිදුකල ද්වීපාර්ශ්වික වෙළඳාමේ සාපේක්ෂ කොටස වැඩි වූ අතර, එක්සත් රාජධානිය, බෙල්ජියම, ප්‍රංශය, ජර්මනිය සහ හොංකොං සමග ශ්‍රී ලංකාව සිදුකළ ද්වීපාර්ශ්වික වෙළඳාමේ සාපේක්ෂ කොටස අඩු විය. චීනය සමග තිබූ ද්වීපාර්ශ්වික වෙළඳාමේ කොටස ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ රෙදිපිළි, යන්ත්‍රසූත්‍ර, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ විදුලි සංදේශ උපකරණ ආනයනය ඉහළ යාම වූ අතර, ඉන්දියාව සමග වූ ද්වීපාර්ශ්වික වෙළඳාමේ කොටස ඉහළ යාමට ප්‍රධාන වශයෙන් රෙදිපිළි, යන්ත්‍රසූත්‍ර, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වාහන ආනයනය ඉහළ යාම හේතු විය. අනෙකුත් බොහොමයක් රටවල් සමඟ තිබූ ද්වීපාර්ශ්වික වෙළඳාමේ සාපේක්ෂ කොටස ඊට අනුකූල වන ලෙස සකස් වී ඇත (සංඛ්‍යා සටහන වි.ස. 7.1 මගින් සංශෝධනය වූ විදේශ වෙළඳාමට අදාළ බර තැබීම් දැක්වේ). එබැවින්, 2010 සිට 2017 දක්වා නා.ස.වි.අ. සහ මූ.ස.වි.අ. පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම මගින් වෙළඳ හවුල්කරුවන් සමඟ තිබූ වෙළඳ ප්‍රවණතාවන් වල වෙනස්වීම් ප්‍රමාණවත් ලෙස නිරූපණය කරයි. විදේශ විනිමය අනුපාතිකය සැලකීමේදී, සලකා බලන වර්ෂය අධික විචලනයකට ලක් වූවක් නොවිය යුතුය. එම නිසා, විදේශ විනිමය අනුපාතිකය සාපේක්ෂව ස්ථාවරව පැවති 2017 වර්ෂය යෝග්‍ය වර්ෂයක් ලෙස සලකනු ලැබිණි.

**සංඛ්‍යා සටහන වි.ස. 7.1**

**මුදල් වර්ග 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නා.ස.වි.අ./මූ.ස.වි.අ. හි විදේශ වෙළඳාමට අදාල බර තැබීම් සැසඳීම**

| රට | 2017 පදනම් වර්ෂය සඳහා භාවිතා කළ බර තැබීම් (%) | 2010 පදනම් වර්ෂය සඳහා භාවිතා කළ බර තැබීම් (%) | වෙනස (%) |
|---|---|---|---|
| ඇ.එ.ජනපදය | 19.30 | 19.74 | (0.44) |
| ඉන්දියාව | 16.65 | 15.57 | 1.08 |
| චීනය | 14.26 | 6.41 | 7.85 |
| එක්සත් රාජධානිය | 7.18 | 9.86 | (2.68) |
| ජපානය | 4.66 | 4.99 | (0.33) |
| ජර්මනිය | 4.60 | 5.88 | (1.29) |
| ඉතාලිය | 4.18 | 4.83 | (0.64) |
| හොංකොං | 2.42 | 3.63 | (1.22) |
| බෙල්ජියම | 2.36 | 4.45 | (2.09) |
| සිංගප්පූරුව | 2.17 | 1.79 | 0.38 |
| මැලේසියාව | 2.16 | 2.36 | (0.20) |
| කැනඩාව | 2.02 | 1.96 | 0.06 |
| තායිලන්තය | 2.01 | 2.15 | (0.14) |
| ඕස්ට්‍රේලියාව | 1.96 | 0.97 | 0.98 |
| තායිවානය | 1.87 | 1.51 | 0.36 |
| රුසියාව | 1.85 | 2.18 | (0.33) |
| තුර්කිය | 1.70 | 1.52 | 0.17 |
| නෙදර්ලන්තය | 1.60 | 2.11 | (0.51) |
| පකිස්ථානය | 1.59 | 1.80 | (0.20) |
| ප්‍රංශය | 1.57 | 2.93 | (1.36) |
| ඉන්දුනීසියාව | 1.47 | 1.73 | (0.26) |
| දකුණු කොරියාව | 1.43 | 1.17 | 0.25 |
| බංග්ලාදේශය | 0.89 | 0.36 | 0.53 |
| කෙන්යාව | 0.13 | 0.10 | 0.03 |
| **එකතුව** | **100.00** | **100.00** | |

[1] සඵල විනිමය අනුපාතිකය මගින් අනෙකුත් මුදල් වර්ග ඇතුළත් පැසට සාපේක්ෂව තවත් මුදලක අගය ගණනය කරනු ලබන අතර සාමාන්‍යයෙන් දර්ශකයක් ලෙස ප්‍රකාශ කෙරේ. සාමාන්‍යයෙන්, සලකා බලනු ලබන රටෙහි ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ව්‍යවහාර මුදල් වර්ග, විදේශ මුදල් පැස තුළ අන්තර්ගත වේ. නා.ස.වි.අ. යනු ප්‍රධාන ද්වීපාර්ශ්වික නාමික විනිමය අනුපාතිකයන්හි බර තබන ලද ගුණෝත්තර මධ්‍යන්‍යය වන අතර, බර ප්‍රමාණය ශ්‍රී ලංකාවේ මුළු විදේශ වෙළඳාමට සාපේක්ෂව ද්වීපාර්ශ්වික වෙළඳාමෙහි අනුපාතය මත පදනම් වේ. නා.ස.වි.අ. = $\prod_{i=1}^{n}[e_i]^{w_i}$, මෙහි දී $e_i$ = සලකා බලනු ලබන රටෙහි මුදලට සාපේක්ෂව $i$ විදේශ ව්‍යවහාර මුදලෙහි විදේශ විනිමය අනුපාතිකය දර්ශකයක් ආකාරයෙන්, $w_i$ = විදේශ වෙළඳාමට අදාළ බර ප්‍රමාණය, $n$ = පැසෙහි අඩංගු වන රටවල් ගණන. මූ.ස.වි.අ. ගණනය කරනු ලබන්නේ දේශීය සහ අදාළ විදේශ රටවල් අතර උද්ධමන වෙනස නා.ස.වි.අ. ට ගැලපීමෙන් වන අතර එය අදාළ රටෙහි විදේශීය තරඟකාරීත්වය මනිනු ලබන මිම්මක් ලෙස භාවිතා වේ. මූ.ස.වි.අ. දර්ශකය, අපනයන තරඟකාරිත්වය හෝ ව්‍යවහාර මුදල් වර්ගවල පවතින නොගැලපීම පෙන්නුම් කරන දර්ශකයක් ලෙස භාවිතා කරනු ලබයි. මූ.ස.වි.අ. = $\prod_{i=1}^{n}\left[e_i.\left({P}/{P_i}\right)\right]^{w_i}$, මෙහි දී $P$ = පදනම් වර්ෂයේ දර්ශකය හා සැසඳීමේ දී ශ්‍රී ලංකාවේ පාරිභෝගිත මිල දර්ශකය, $P_i$ = පදනම් වර්ෂයේ දර්ශකය හා සැසඳීමේ දී $i$ රටෙහි පාරිභෝගික මිල දර්ශකය.


5

**3. මූර්ත සඵල විනිමය අනුපාතිකයන්හි පදනම් වර්ෂය යාවත්කාලීන කිරීමේ බලපෑම**

රූපසටහන වි.ස. 7.1 මගින් පෙර පදනම් වර්ෂය වූ 2010 පාදක කරගත් මූ.ස.වි.අ. දර්ශකය සහ 2017 පදනම් කරගත් සංශෝධිත දර්ශකය සංසන්දනය කෙරේ. රූප සටහනෙන් පෙන්නුම් කරන පරිදි පදනම් වර්ෂය යාවත්කාලීන කිරීම මගින් ගණනය කරන ලද නව මූ.ස.වි.අ. දර්ශකය පෙර දර්ශකයට සාපේක්ෂව සමාන්තරව පහළට විතැන් වීමක් සිදු වූ අතර දර්ශක දෙකෙහිම උපනතිය පුළුල් ලෙස සමානව පැවතුණි. පදනම් වර්ෂය 2017 ට යාවත්කාලීන කිරීම සමග මූ.ස.වි.අ. පහළට විතැන් වීම 2010 පදනම් වර්ෂයට සාපේක්ෂව 2017 දී විනිමය අනුපාතිකය වඩාත් තරඟකාරී වීම පිළිබිඹු කරයි. තවද, මූ.ස.වි.අ. ගණනය කිරීමේ ක්‍රමවේදය සහ පාදක වූ උපකල්පන එලෙසම පවත්වා ගැනීම සහ 2010 සහ 2017 වර්ෂ අතර බහුතරයක් වෙළඳ හවුල්කරුවන්ගේ විදේශ වෙළඳාමට අදාළ බර තැබීම් සැලකිය යුතු ලෙස නොවෙනස්ව පැවතීම මෙම සාපේක්ෂ සමාන්තර විතැන් වීමෙන් පිළිබිඹු විය.


රූප සටහන වි.ස. 7.1

මූ.ස.වි.අ. 24 (2010 = 100) සහ මූ.ස.වි.අ. 24 (2017 = 100) සැසඳීම




5.16 රූප සටහන

කාර්තුමය අන්තර් බැංකු ඉදිරි විනිමය ගනුදෙනු පරිමාවන්




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 5.11.2 දේශීය විදේශ විනිමය වෙළඳපොළ වර්ධනයන්

**2018 වසරේදී වෙළඳපොළ මත වඩාත් පදනම් වූ විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් පැවතුන බැවින් එතැන් වෙළඳපොළ කටයුතු සක්‍රීයව සිදුවූ අතර, ඉදිරි වෙළඳපොළ ගනුදෙනු ප්‍රමාණය යම් පහළ යාමක් වාර්තා කළේය.** එතැන් වෙළඳපොළ ගනුදෙනු වැඩිවීමත් සමඟ 2018 වසරේදී වූ දේශීය විදේශ විනිමය වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 16,451 සිට එ.ජ. ඩොලර් මිලියන 17,402 දක්වා වැඩි විය. 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 8,426 ක් වූ එතැන් වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය, 2018 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 10,770 ක් (මුළු ගනුදෙනුවලින් සියයට 61.9) දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2018 වසරේදී වූ ඉදිරි වෙළඳපොළ මුළු ගනුදෙනු ප්‍රමාණය 2017 වසරේදී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 8,025 ට සාපේක්ෂව එ.ජ. ඩොලර් මිලියන 6,632 ක් දක්වා අඩු විය. මේ අතර, 2018 වසරේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළට මැදිහත් වෙමින් එ.ජ. ඩොලර් මිලියන 1,120 ක් ශුද්ධ පදනම මත සපයන ලදී. එහිදී, එ.ජ. ඩොලර් මිලියන 1,677 ක් දළ පදනම මත වෙළඳපොළට සැපයූ අතර එ.ජ. ඩොලර් මිලියන 557 ක් අවශෝෂණය කර ගන්නා ලදී. ඒ හා සසඳන විට, 2017 වසරේදී එ.ජ. ඩොලර් මිලියන 2,214 ක විදේශ විනිමය ද්‍රවශීලතාවයක් අවශෝෂණය කිරීම සිදු කළ අතර, එ.ජ. ඩොලර් මිලියන 550 ක සැපයීමක් සිදුකරන ලදී. 2018 වසරේ විශේෂයෙන් දෙවන භාගයේ දී විදේශ විනිමය ගෙවීම් ඉහළ යෑම හේතුවෙන්, දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ද්‍රවශීලතාව සපයමින් ශ්‍රී ලංකා රුපියල ස්ථාවර කිරීමට කටයුතු කිරීම තුලින් 2018 වසර තුළ ශුද්ධ විදේශ විනිමය සැපයීම් ඉහළ ගියේය.

## 5.12 විදේශීය අංශයේ ඉදිරි දැක්ම

**සමහර අවදානම් සහගත තත්ත්වයන් හමුවේ වුවද, 2019 වසරේ විදේශීය අංශයේ ඉදිරි දැක්ම ධනාත්මකව පවතියි.** ආනයනවලට අදාළ තීරුබදු වෙනස් කිරීම සහ 2018 වසරේදී රුපියල සැලකිය යුතු

ලෙස අවප්‍රමාණය වීමෙන් ඇති විය හැකි බලපෑම ආධාරයෙන් ආනයනවල අපේක්ෂිත මන්දගාමී වීම හමුවේ 2019 වසරේදී වෙළඳ ගිණුමේ හිඟය අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නව වෙළඳ හවුල්කරුවන් සමග වෙළඳ සම්බන්ධතා වර්ධනය වීම, හිතකර විදේශ වෙළඳ ප්‍රතිපත්ති ඇති කිරීම, ශක්තිමත් ආයතනික සහාය සහ වඩාත් තරගකාරී විනිමය අනුපාතිකය ආධාරයෙන් 2019 වසරේදී අපනයන වර්ධනය ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් සංචාරක ඉපැයීම්, තොරතුරු තාක්ෂණය, ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම සහ ප්‍රවාහන සේවා සඳහා අපේක්ෂිත ඉහළ ලැබීම් හමුවේ සේවා ගිණුමේ අතිරික්තය 2019 වසරේදී වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කෙරේ. ගෝලීය මූල්‍ය වෙළඳපොළ තත්ත්වයන් සාපේක්ෂව දැඩිවීම හමුවේ පොලී ගෙවීම් ඉහළ යාමෙන් ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පුළුල් වනු ඇතැයි ද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ දැනට පවතින මට්ටමේ පවතිනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. මේ අතර, අනෙකුත් විදේශ සෘජු ආයෝජනවලට අමතරව කොළඹ වරාය නගරය සහ හම්බන්තොට කාර්මික කලාපය යන දිගුකාලීන සංවර්ධන ව්‍යාපෘති යනාදිය සඳහා වන ඉහළ විදේශීය සෘජු ආයෝජන ලැබීම් හේතුවෙන්, ගෙවුම් තුලනයේ මූල්‍ය ගිණුම වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, දියුණු ආර්ථිකයන්හි පොලී අනුපාත යථා තත්ත්වයකට පත්වීමේ වේගය මන්දගාමී වීම හමුවේ කොළඹ කොටස් වෙළඳපොළට සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළට විදේශීය ආයෝජන ලැබීම් ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම නැවත ආරම්භ වීමෙන් ආයෝජකයන්ගේ විශ්වාසය වර්ධනය වීම හමුවේ විදේශීය අංශය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජංගම ගිණුමේ හිඟය අඩුවීම සහ මූල්‍ය ගිණුම වෙත ඉහළ ලැබීම් වාර්තා වීම, වසර තුළ විනිමය අනුපාතිකය ක්‍රමානුකූලව ශක්තිමත් වීමට සහ නිල සංචිත ඉහළ නැංවීමට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2019 වසරේ විදේශීය අංශයේ ඉදිරි දැක්ම අවදානම්වලට ලක්වීමේ හැකියාවක් පවතී.** දේශීය සාධක සැලකීමේ දී, වසර තුළදී වාහන ආනයන බලපත්‍ර මත වාහන ආනයනය කිරීම අත්හිටුවීම අපේක්ෂා කරන පරිදි ඉවත් වීම, 2018 වසරේ දෙවන භාගයේ දී ආනයන අඩු කිරීම සඳහා හඳුන්වා දුන් ක්‍රියාමාර්ග ඉවත් කිරීම සහ 2019 වසරේ අයවැයෙන් පසුව ආනයන සඳහා හඳුන්වා දුන් බදු ඉහළ දැමීම යනාදියේ ශුද්ධ ප්‍රතිඵලයක් ලෙස වාහන ආනයන සඳහා වූ ඉල්ලුම ඉහළ යැමට ඉඩ ඇති අතර, එමගින් වෙළඳ ශේෂයේ දක්නට ලැබුණු හිතකර තත්ත්වය නැවත වෙනස් වීමේ හැකියාවක් පවතියි. විදේශීය සාධක සැළකීමේ දී, තෙල් නිෂ්පාදනය කරන රටවල් විසින් තෙල් සැපයීම සීමා කිරීමට ඇති හැකියාව සහ අනෙකුත් භූ දේශපාලනික සාධක හේතුවෙන් ගෝලීය ඉන්ධන මිල ගණන් වැඩිවන තත්ත්වයක් හමුවේ ඉන්ධන ආනයන වියදම ද ඉහළ යාමට ඉඩ ඇත. මීට අමතරව, 2019 වසරේ දෙවන භාගය වන විට මැතිවරණ කටයුතු හේතුවෙන් ඇති විය හැකි දේශපාලනික ප්‍රවණතා සමග 2019 වසරේදී විනිමය අනුපාතිකය මත යම් පීඩනයක් එල්ල විය හැක. දියුණු ආර්ථිකයන්හි පොලී අනුපාත යථා තත්ත්වයට පත්වීමේ වේගය සහ ප්‍රමාණය අවිනිශ්චිත වීම තුළින් රටවල් අතර ප්‍රාග්ධන ප්‍රවාහවලට බලපෑම් ඇති විය හැකි අතර, එය කොළඹ කොටස් වෙළඳපොළ සහ රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන මත අහිතකරව බලපානු ඇතැයි අපේක්ෂා කෙරේ.

**පුරෝකථනය කරන ලද විදේශීය ණය සේවාකරණ ගෙවීම්වල වැඩි වීම 2019 වසරේ හා මැදි කාලීනව ප්‍රධාන අභියෝගයක් ලෙස පවතී.** විචක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රියාමාර්ග තුළින් කළමනාකරණය කර නොගතහොත්, ප්‍රධාන වශයෙන් 2019 සහ ඉන් ඔබ්බට කල්පිරීමට නියමිත ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ විදේශ විනිමය කාලීන මූල්‍ය පහසුකම් ආපසු ගෙවීම් ඇතුළු සාමාන්‍ය වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 5 කට වඩා වැඩි වාර්ෂික විදේශීය ණය ආපසු ගෙවීමේ වගකීම් හේතුවෙන් ශ්‍රී ලංකාවට ඉහළ ප්‍රතිමූල්‍යනය කිරීමේ අවදානමකට මුහුණ දීමට සිදුවනු ඇත. මෙම වාතාවරණය යටතේ ජංගම ගිණුමේ හිඟය මූල්‍යයනය කිරීමට විදේශ ණය වෙත වැඩි වශයෙන් යොමුනොවීම, ජංගම ගිණුමේ හිඟය තිරසාර මට්ටමක පවත්වා ගැනීම සහ දිගුකාලීන ණය නොවන ප්‍රාග්ධන ප්‍රවාහ හරහා ජාත්‍යන්තර සංචිත ඉහළ නංවා ගැනීම මූලික ප්‍රමුඛතා ලෙස පවතියි. විදේශ ණය පිළිබඳ අවදානම අඩු කර ගනිමින්, විදේශ ණය අවම මට්ටමක පවත්වා ගැනීමට නම්, අපනයනාභිමුඛ කර්මාන්ත හා සේවා අංශ සඳහා විදේශ සෘජු ආයෝජන ආකර්ෂණය කර ගැනීමට රජයට ඇති සැලසුම් තුළින් මැදි කාලීනව අවම වශයෙන් වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියන 3 ක විදේශ සෘජු ආයෝජන ලැබීම් තහවුරු කර ගැනීමට අවශ්‍ය වේ. තවද, රජයේ ජාතික අපනයන උපායමාර්ගයෙහි අපේක්ෂා කරන ආකාරයට සේවා අපනයනවල විභවතාවය අත්කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කාලීනව ක්‍රියාත්මක කිරීම තුළින්, 2019 වසරේදී සහ මැදිකාලීනව ඉහළ විදේශ විනිමය ලැබීම් සාක්ෂාත් කරගැනීමට හැකිවනු ඇත.

5